ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2015 ක් වූ පෙබරවාරි 15 ඉරිදා 149 වෙළුම 37 කලබ සතිපතා පත්‍රය - පිටු 32 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය



## ප්‍රේමයේ පවතින්න

සුදුතුම් පිය ලංකා ගමනේ
ජනතා අත්දැකීම්
විශේෂ කලාපය



# ප්‍රේමයේ ජීවමාන පරමාදර්ශය

"ඔබගේ රටේ ඉතිහාසයේ වත්මන් මොහොත තුළ හොඳ හිත ඇති කොපමණ දෙනෙකු මේ සමාජය යහපත් සාරධර්ම පදනමක් මත ගොඩනගන්නට උත්සහ කරනවාද? සමාජය ද එහි විවිධ ආයතන ද නවෝදයකට ගෙන යමින් විවිධ ආගමික ජනකොටස් වල නායකයන් ලෙස එකිනෙකා හා බැඳෙමින් සියලු ශ්‍රී ලාංකිකයන් අතර සමගි සංධානය ගොඩනැංවීමට ඔබටද හැකිවේවා."

අති උත්තම ප්‍රැන්සිස් සසුනිසුරාණෝ - 2015 ශ්‍රී ලංකා ගමනේදී

_"මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" ( ශු. මාක් 12: 31 )

ක්‍රිස්තු වර්ෂ 2015 පෙබරවාරි 15 ඉරිදා

ඥානාර්ථ ප්‍රදීපය

# සසුන් පිය ලංකා ගමන පිළිබඳව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ නිවේදනය



## ප්‍රේමයේ පවතින්න

2015 ජනවාරි 13 ද සිට 15 වැනි ද දක්වා අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ ලංකා ගමන නිමිත්තෙන් එතුමන් පිළිගැනීමට සහ ආචාර කිරීමට එක්රොක් වූ ශ්‍රී ලංකා වාසී සියලු ජාතිකයන් හා ආගමිකයන් වෙත හද පත්ලෙන් නැගෙන උත්තමාචාරය ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය පිරිනමන්නීය. අපගේ හෘදයාංගම ස්තුතිය අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, පරිවාර ඇමති රවී කරුණානායක මහත්වරුන්ට සහ ත්‍රිවිධ හමුදපතිවරුනට, පොලීසියේ, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය විවිධ අංශ ප්‍රධානින්ට, මේ ලංකා ගමනේ විවිධ අවස්ථාවන් සාක්ෂාත් කර ගන්නට එක්රොක් වූ සියලු දෙනා වෙත පිරිනමන්නෙමු.

එමෙන්ම අපි මහ සංඝරත්නයටත්, හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගමික නායකයන්ටත් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත් වූ අන්තර් ආගමික සමුළුවට එක්වීමෙන් දක් වූ සහය උදෙසා තුති පුදන්නෙමු.

මෙහිදී අපි හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ, හිටපු විදේශ කටයුතු අමාත්‍ය ජී. එල්. පීරිස් යන මහත්වරුන් සසුන් පිය ගමන ආරම්භයේ දී සංවිධායක කමිටුවට නායකත්වය දීම උදෙසාත් ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රාරම්භක අවස්ථාවේ සිට විවිධ කටයුතු වලට මඟ පෙන්වීමෙහිලාත් දක් වූ දයකත්වයට තුති පුදන්නෙමු.

එක් මඟකින් නැතිනම් තවත් මඟකින් සහය වෙමින් ද, විවිධ කමිටුවල සේවය කරමින් ද, ස්වකීය ශ්‍රමය හා ශක්තිය පුද කරමින් විශාල වූ හෝ අල්ප වූ දයකත්වයක් දක්වීමට ඇප කැප වූ සැම සියලු දෙනාට අපි තුති පුදන්නෙමු. මෙහිදී අපි වෛද්‍යවරුන්, සෞඛ්‍ය සේවකයන් සහ ස්වේච්ඡා සේවකයන් ලෙස සේවය කරමින් රෝගී හා වියපත් වූවන්ගේ අවශ්‍යතා සපුරාලන්නට ඇප කැප වූ සැමට තුති පුදන්නෙමු. මේ තුති පිදුම සියලුම මීසම් සේවක පියතුමන් ද, මඟ දෙපස සරසන්නට නායකත්වය දෙමින් වෙහෙස මහන්සි වූ ගිහි සැදැහැවතුන් ද, ගාලුමුවදෙර පිටියේ දිව්‍ය පූජා යාගයන්ට සහභාගි වීමට වන්දනා ගමනක් සේ පැමිණෙන්නට කටයුතු සංවිධානය කළ අයටත්, මඩු සිද්ධස්ථානයේ කටයුතු වලට වෙහෙස මහන්සි වූ සැමටත් විශේෂයෙන් ආරක්ෂක ජාලයන් සංවිධානය කරමින් වඩාත් යහපත් සංචාරයකට මඟ පෑදු සැමටත් හිමි වන්නේ ය. අවසාන වශයෙන් මෙතෙරින් මෙන්ම එතෙරින් පැමිණ ගාලු මුවදෙර පිටියේ දී සහ මඩු සිද්ධස්ථානයේ මෙහෙයන්ට බොහෝ කැපකිරීම් කරමින් සම්බන්ධ වූ සියලු දෙනාටම තුති පුදන්නෙමු.

ඔබ සියලු දෙනාටත්, අප මවුබිම වන ශ්‍රී ලංකාවටත් දේව පිහිට ලැබේවා!

**✠ මැල්කම් කාදිනල් රංජිත් හිමි**
සභාපති
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව

**✠ වැලන්ස් මෙන්ඩිස් හිමි**
මහ ලේකම්
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව

# ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේ අපවෙත එවීම හා අප ස්වර්ගීය මැදිහත් කරුවාණන් ලෙස ශු. ජුසේවාස් මුනි අපට දානය කිරීම ගැන දෙවියන් වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු

## අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමි

හිතාදර සොයුරු සොයුරියනි,

ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප්වහන්සේගේ ශ්‍රී ලංකා ගමනයේ සුවිසල් සාර්ථකත්වය ගැන දෙව්පියාණන් වහන්සේට පමණක් ප්‍රශංසා වේවා යයි පලමුව පවසමි. ඇත්තෙන්ම ඒ සම්බන්ධව සිදු වූ සියල්ල ශ්‍රී ලංකාවාසී සැම දෙනටද විශේෂයෙන් අපගේ බැටලු රැලට ද අති මහත් වූ ආශිර්වාදයක්ම විය. උන්වහන්සේ අපගේ මේ දෙරණ තලය ස්පර්ශ කළ මොහොතේ සිට එයින් පිටත්ව ගිය මොහොත දක්වා සැම සියලු දෙනාම ඒ ගැන කතා කලේ විශාල ආදරයකින්, ප්‍රීතියකින් හා ගෞරවයකිනි. මේ එය අතර අප දිවයිනේ වසන කිතුණු නොවන අය ද වූහ. ශු. පාප් වහන්සේ, උන්වහන්සේ තුළ ජීවමාන වූ ලෙන්ගතු බව, සිනහව පිරි ප්‍රීතිය, සරල ගති පැවතුම්, හදවතින් එන පරිත්‍යාගශීලිත්වය හා විවිධාකාරයෙන් පෙන් වූ සමිඳුන් වෙත තිබූ ගැඹුරු විශ්වාසය හරහා අප සියලු දෙනා කුල්මත් කරන්නට සමත් වූ බව පැහැදිලිය. උන්වහන්සේ ද අප ජනතාවගේ සිනහමුසු මුහුණු, උන්වහන්සේ වෙත ඔවුන් දැක් වූ පක්ෂපාතීත්වය හා උන්වහන්සේ පිලිගන්නට පෙන් වූ උනන්දුව තුලින් සතුටු වූ බව පැහැදිලිය.

උන්වහන්සේගේ මේ ආසියාතික සංචාරය අවසානයේ දී එනම් ජනවාරි 21 දා මා වෙත එවූ ලිපියක මෙසේ සඳහන් කර ඇත : "ශ්‍රී ලංකාවේ ජනතාව පිලිබඳ මා බොහෝ සෙයින් උද්දාම වූ කරුණු දෙකක් ඇතඃ මා එහි පැමිණි දා මට දැක් වූ උනුසුම් පිලිග ැනීම (ගුවන් තොටුපල සිට නගර මධ්‍ය වන තෙක් කිලෝමීටර් විසිනවයක් පුරාවට ඔවුන් එක් රැස්වී මට දැක් වූ සෙනෙහස) සහ මඩු සිඬස්ථානය තුල සිදු වූ දෙය මේ කරුණුයි. මඩුහි දී මා, විවිධ ආගම් අදහන්නන් දේව මාතාවන් වහන්සේට යදිනු දැක මරිමවුන් කිසිදා ඇගේ ජනතාව අත් නොහරින බව ද සාමය හා එක්සත් කම වෙත ඔවුන් මෙහෙයවනු නිසැක බව ද ස්ථිර ලෙස විශ්වාස කරන්නට පෙළඹුනෙමි". ඇත්තෙන්ම ශු. පාප් වහන්සේ ශ්‍රී ලංකාව තුල අපි විවිධ ජාතීන්, භාෂාවන් හා ආගම් වලට අයත් වූවත් එකට හිඳිමින් එකිනෙකා සමඟ මිශ්‍ර වන අයුරු දැක ප්‍රීතියට පත් වු බව පැහැදිලිය. අනාගතය සඳහා, විශේෂයෙන් තෘණ මූල මට්ටමේ සිටින බහුතරය, එකමුතුකම, විනිවිද පෙනෙන ජීවිත රටාවකින් එකිනෙකා වෙත විවෘත වීම මෙන්ම විවිධ ජන කොටස් අතර ඇති පහසුවෙන් සංකලනය වීමේ ස්වභාවය අනාගත යහපතේ ශුභ සලකුණක් වන බවට එතුමන් විශ්වාස කරන බව පැහැදිලි විය. මාලිගාකන්දේ අග්‍රශ්‍රාවක විහාරය වෙත යමුයි මා යෝජනා කළ විට උන්වහන්සේ එයට එක හෙලාම එකඟ වූයේ මේ විශ්වාසය නිසාම බව සත්‍යයකි.

මේ කටයුත්ත ශ්‍රී ලංකාව තුල ජීවත් වන බෞද්ධ ජනයා වෙත පාප්වහන්සේ දැක් වූ විශේෂ ගෞරවය හා විවෘත භාවය සඳහා හොඳම සාක්ෂිය වන බව පැහැදිලිය. එලෙසම බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික නොවන ක්‍රිස්තියානි ආගමික නායකයන් හමු වී සහෝදරත්වයෙන් ඔවුන් ඇමතීම සහ ඔවුන්ට ශුභ පතමින් ඔවුන් හා සුහද සාමුච්චයේ යෙදීම මේ විවෘත භාවයේ තවත් ලක්ෂණයකි.

මේ අනුව උන්වහන්සේගේ ලංකා ගමන කතෝලික සභාව සහ ඒ විවිධ ආගමික ජනකොටස් අතර වඩාත් සුහද වූද විවෘත වූ ද එකමුතු කමකට දිරි දෙන්නා වූ වටහා ගැනීමක් ඇති කරලීමට උපකාරී වූ බව අපගේ පිලිගැනීමයි. මේ අනුව ඒ ඓතිහාසික වැරදි වැටහීම් හා ඒ තුලින් උදාවන ආතතිය අභිබවා යමින් අන්තර් ආගමික සුහදතාවයේ එක් අයුරකින් වැඩිමල් වියට පැමිණෙන්නට ද අන් ආගමිකයින් විසින් සහෝදර ලීලාවෙන් පිලිගනු ලබන්නට ද අපට හැකි වන්නේ ය. ප්‍රැන්සිස් පාප් වහන්සේ මේ එකමුතුව අමතමින් කියා සිටියේ : "ඔබගේ රටේ ඉතිහාසයේ වත්මන් මොහොත තුල හොඳ හිත ඇති කොපමණ දෙනෙකු මේ සමාජය යහපත් සාරධර්ම පදනමක් මත ගොඩනගන්නට උත්සහ කරනවා ද? සමාජය ද එහි විවිධ ආයතන ද නවෝදයකට ගෙන යමින් විවිධ ආගමික ජනකොටස් වල නායකයන් ලෙස එකිනෙකා හා බැඳෙමින් සියලු ශ්‍රී ලාංකිකයන් අතර සමගි සංධානය ගොඩ නැංවීමට ඔබට ද හැකි වේවා. ."

එලෙසම ගාලු මුවදොර පිටියේ පැවති ශුඬවරයට එසවීමේ පිලිවෙත් දිව්‍ය පූජාව අපගේ ජනතාවගේ දේව විශ්වාසයට මහඟු සාක්ෂියක් විය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ඒ සඳහා පැමිණියේ පෙරදින සවස සිටය. විවෘත පිට්ටනියේ රැය ගත කරමින්, අඩු පහසුකම් අත් විඳිමින්, ලැබුණු ඉඩකඩ අන් අය සමඟ සහෝදර ලීලාවෙන් බෙදා ගනිමින්, සමිඳුන් යදිමින්, ගීතිකා ගායනා කරමින් ඔවුන් දෙව් සමිඳාණන් වහන්සේ වෙතත් උන්වහන්සේගේ තැන ගත් සසුනිසුරාණන් වෙතත් තමන් තුළ වූ ආදරයට සාක්ෂි දැරූහ. මේ, සරල වූද ප්‍රශ්නාර්ථයෙන් තොර වූද විශ්වාසයට හොඳම සාක්ෂිය වූයේ අප ජනතාව අතර කොතරම් දෙනෙකු මේ උත්සවයට සහභාගි වූයේ ද යන්න මෙන්ම ශු. පාප් වහන්සේ දුටු විට ඔවුන් කෙතරම් දුරට සතුටු වූයේ ද යන්නයි.

මේ ජනතාව තුල කවුරුත් දැක්කේ ශ්‍රී ලංකාවේ අප අපෝස්තුලුවරයාණන් වූ ජුසේවාස් පියතුමාගේ ශුඬවත් බවේත්, අපෝසතලීක සාර්ථකත්වයේත් ප්‍රතිමූර්තියයි. ශ්‍රී ලංකාවේ ශු. සභාව අද මෙලෙස පුළුල් වී ඇත්තේ, දෙව් සමිඳාණන් වහන්සේ ගොවේ උතුම් වූ මේ දරුවා තමන් වහන්සේගේ සේවයට කැඳවා උන්වහන්සේ අප වෙත දක්වන ඉමහත් ප්‍රේමය හා දයාව නිසා එදා අප මුතුන් මිත්තන් වෙත එතුමන් එවා වදාල නිසාය. මෙහි දී අපට පැහැදිලි විය යුත්තේ ජුසේවාස් මුනිඳුන් එදා තමන්ගේ ජීවිතය දෙවියන් වහන්සේ වෙත නොපිදුවේ නම් රෝමයේ අපෝස්තුලුවරුන්ගේ හා ප්‍රාණපරිත්‍යාගීන්ගේ විශ්වාසයේ උරුමකරුවන් වී කතෝලික සභාවේ සාමාජිකයන් වීමේ භාග්‍ය අපට උදා නොවන බවයි. ශු. පාප්වහන්සේ තමන් වහන්සේ පැවැත් වූ දේශනය තුලින් ජුසේවාස් මුනිඳුන්, අද පූජකවරය ලබා සිටින සියලුම පියතුමන්ලාගේ ආදර්ශය විය යුතු ශ්‍රේෂ්ඨ පූජා ප්‍රසාදිවරයෙකු බවත්; ආගම හෝ ජාතිය නොබලා සියල්ලන්ට එකසේ සේවය කල කෙනෙකු බවත්, "ශු. සුවිශේෂයේ පණිවුඩයේ සුන්දරත්වය හා සත්‍යවාදි බව බහු ආගමික පරිසරයක් තුල බැහැපත් කමින් ද ගෞරවයෙන් හා කැපවීමෙන් ද අධිෂ්ඨානශීලීව ද ලබා දීමට උත්සුක වූ අයෙකු බවත්" පැහැදිලි කර දුන් සේක (දේශනය, ශුඬවරයට එසවීමේ දිව්‍ය පූජාව ජනවාරි 14. 2015, ගාලු මුවදොර පිටිය, ශ්‍රී ලංකාව).

මඩු දේවස්ථානයේ දී විවිධ ජාතීන් හා ආගම් වලට අයත් අය කෙතරම් මහත් වූ ආදරයකින් හා සෙනෙහසකින් මරි මවුන් සලකන්නේ ද යන්නෙන් ශු. පාප් වහන්සේ උද්දාමයට පත් විය. යුඩ සමයේ දී ඇය ඔවුන් හට සරණය හා රැකවරණය ලැබ දුන් ආකාරය ගැන මෙනෙහි කල ශු. පාප්වහන්සේ ඔවුන් අත්විඳි මහත් වේදානාකාරී අත්දැකීම් නොතකා එකිනෙකාට සමාව දී එකිනෙකා සමඟ සමගි සන්ධාන ගතවන ලෙස සිය දේශනයේ දී ඉල්ලා සිටිසේක. ශු. පාප් වහන්සේ මරිය වහන්සේ එවැනි සමගි සංධානයක පිලිබිඹුවක් වන බව ද ප්‍රකාශ කල සේක. "කුරුසිය පමුල දී ඇගේ දරුවාගේ මිනි මරුවන්ට සමාව දුන් ඇය උන්වහන්සේගේ අප්‍රාණික දේහය සිය දැතේ හොවාගත් නිසා ඇය දැන් ශ්‍රී ලාංකිකයන් හට යොමුකරන්නේ දෙවියන් වහන්සේගේ සමාව හා දයාවේ අලේපනය සියල්ලන්ට සුවය දෙන නිසා එකිනෙකා හා සමඟි වන්නට කරන ඉල්ලීමයි" (දේශනය, මඩු 2015 ජනවාරි 15 දින).

හිතාදර සොයුරු සොයුරියනි, ඇත්තෙන්ම ශු. පාප් වහන්සේගේ ලංකා ගමන ද අපට ප්‍රාතිහාර්යකි. මන්ද බලාපොරොත්තු නොවු ලෙස උන්වහන්සේගේ ගමනට දින කිහිපයක් පමණක් තිබිය දී ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කිරීමෙන් අප සියල්ලන්ට උගතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදුවීම එයට හේතුවයි. මේ නිසා මේ ගමන ඉදිරියට ගෙන යා යුතු නැතියැයි කියන අයවලුන් සමඟ පීඩාකාරී විවාදයකට අපි මැදි වූයෙමු. ඡන්ද විමසීමකින් පසු රටතුල කවදත් ඇවිලුණු භීෂන නැවතත් ඇති වී පාප් වහන්සේගේ ගමනට නුසුදුසු වාතාවරණයක් උදාවනු ඇතැයි ඒ අය තර්ක කළහ. බොහෝ ලිපි, දුරකථන ඇමතුම්, සාකච්ඡා, ප්‍රසිද්ධ විරෝධතා හා පෞද්ගලික මඩගැසීම් වලට පවා මුහුණ දෙන්නට අපට සිදුවිය.

අපගේ භාරදූර ප්‍රශ්නය වූයේ වෙනත් රටක් ද සම්බන්ධ කර ගනිමින් මේ ගමනේ සියලු කටයුතු සූදානම් කර තිබූ නිසා එය අත්හැර දැමීමට හෝ කල් දැමීමට ප්‍රායෝගිකව ඉඩකඩ නොතිබීමය. එලෙසම අසියාවේ ඉතාම කුඩා රටක් වූ අපගේ වැනි දිවයිනකට පැමිණෙන්නට කැමැත්ත පළකර සිටි ශු. පාප්වහන්සේට "එපා යයි" කීම උන්වහන්සේට මහත් අගෞරවයක් පෙන්වීමක් ලෙස අපට හැඟීම ද ප්‍රශ්නක් විය. නුසුදුසු වුවත් මෙවැනි රටකට ඒමට උන්වහන්සේ දැක් වු කැමැත්ත අප වෙත දැක් වූ අති විශාල ගෞරවයක් ම විය. එලෙසම යම් අයුරකින් ශීලාචාර ලෙස ඡන්දයක් පැවැත්වීමට වත් නොදත් ජනතාවක් ජීවත් වන රටක් ලෙස ජාත්‍යන්තර සමාජය ඉදිරියේ අපරට හංවඩු ගැසෙන නිසා රටට මහත් අපකීර්තියක් උදාවීම ද ප්‍රශ්නයක් විය.

ඒ නිසා සියල්ල ගැන මෙනෙහි කළ කතෝලික රදගුරු මණ්ඩලය දෙව් සමිඳුන් කෙරෙහි මහත් වූ විශ්වාසයකින් යුතුව ගත් තීරණය ඉදිරියටම ක්‍රියාත්මක කරන්නට තීරණය කලේය. ඇත්තෙන්ම රදගුරු මඬුල්ලේ සභාපති ලෙස මා මේ ගැන වගකිවයුතු නිසා අපහාස වලට ද ගොදුරු වී වික්ෂිප්ත වීමට මට සිදුවිය. මේ සියල්ලේදී ම දෙව් ස්වාමින් වහන්සේ අපට උපකාරී වනු ඇතැයි මා තුළ ස්ථිර විශ්වාසයක් තිබුණි. ඒ නිසාම උන්වහන්සේ තුළ ද ශු. ජුසේවාස් මුනිඳුන්ගේ යාච්ඤා පිහිට තුළ ද බලාපොරොත්තු තබා මේ වැඩ පිළිවෙල ඉදිරියටම ගෙන යා යුතුයැයි රදගුරු මණ්ඩලය සමඟ තීරණය කළෙමි.

මේ විශ්වාසය අපට විපුල ඵල ලබාදුන් බව පැහැදිලිය. මන්ද නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව තුල පවත්වන ලද අන් කිසිදු ඡන්දයකටත් වඩා සාමකාමී ඡන්දයක් ද බලය මාරුවීමක් ද ඇති කරමින් සියල්ල සිදුවිය. ඇත්තෙන් ම අපට කිව හැක්කේ අපේ යැදුම් වලට සවන් දෙමින් ශු. පාප්වහන්සේගේ ශ්‍රී ලංකා ගමනත් ශු. ජුසේවාස් මුනිඳුක් ශුඬවරයට එසවීමත් කිසිදා අමතක නොවන සාර්ථක අත්දැකීමක් කරවීම සඳහා දෙව් සමිඳාණන් වහන්සේ සාමකාමී මැතිවරණයක ද බලය මාරුවීමක ද ප්‍රතිහාර්යය අප වෙත ලබාදුන් බවයි. උන්වහන්සේ අති බලවන්තය. උන්වහන්සේගේ ශ්‍රී නාමයට නිතිලෙස ප්‍රශංසා වේවා !

හිතාදර සොයුරු සොයුරියනි, දෙවියන් වහන්සේට මේ සියල්ල වෙනුවෙන් අපි ස්තුති වන්ත වෙමු. උන්වහන්සේ අපවෙත දක්වන නිමක් නැති එඩේරික ආදරය සහ ඒ නිමක් නැති ආදරය අපට පෙන්වමින් ශුඬෝතත්ම ප්‍රැන්සිස් පාප් වහන්සේ අපවෙත එවීම ගැන ද අපගේ අපෝස්තුලුවරයාණන් හා ස්වර්ගීය මැදිහත් කරුවාණන් ලෙස ශු. ජුසේවාස් මුනිඳුන් අපට දානය කිරීම ගැන ද අපි උන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු. අපෝස්තුලු වරුන්ගේ හා ප්‍රාණපරිත්‍යාගීන්ගේ විශ්වාසයට උරුම කියමින් රෝමයේ සභාවට අයත් වන්නට ලැබීම ගැන සාඩම්බරව සතුටු වෙමු. උන්වහන්සේට මහිමයත් ගෞරවයත් සදා අත්වේවා !

ජේසු පිහිටයි, ස්තුතියි !

**✠ මැල්කම් කාදිනල් රංජිත්**
කොළඹ අගරදගුරුතුමන්
2015 පෙබරවාරි 09 වෙනිදා

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2015 පෙබරවාරි 15 ඉරිදා





ප්‍රේමයේ පවතින්න

## සුදුතුම් පිය ලංකාගමන සාර්ථක කළ සැඟවුන චරිත

සුදුතුම් පිය ලංකාගමන සාර්ථක කර ගන්නට උරදුන් ගණන අසීමිතය. බොහෝවිට ආගම් බේදයකින් තොරව අතහිත දුන් සංඛ්‍යාවද අපමණය. එලෙසම සති මාස ගණන් පුරා විවිධ රැ ස්වීම් තබමින්, නිතර හමුවෙමින්, සාකච්ඡා කරමින් සුදුතුම් පියගමන සාර්ථකකර පියගන්නට ක්‍රියාකළ ඒ සැම කෙනෙක්වම නැවත නැවත ඇගැයීමකට ලක් කළ යුතු වන්නේ ඒ ලබාදුන් දායකත්වය කිරා මැන බැලීමකට නම් නොවේ. නමුත් සන්තුෂ්ටිය තිබෙන්නේ යම් කථා බහකට ඔවුනුත් උපරිමයෙන්ම සම්බන්ධ කර ගත හොත් පමණි. එනයින් බලා මෙවර ඥානාර්ථ ප්‍රදීපය කලාපය සම්පූර්ණයෙන්ම කැප කරන්නේ ඔවුන් පිළිබඳව කථා කරන්නටයි. ඔවුන්ගේ ඒ දායකත්වය පිළිබඳව අන් අය පහන හැඟීමෙන් යුතුව කරන කථා බහ පිළිබඳව අදහස් පළ කිරීමටයි.

මෙය සිදුවිය යුත්තක් බවට අපිදු කල්පනා කරන්නෙමු. ගිහි, පැවිදි, පූජක මේ සියල්ලන්ම තම තමන්ගේ වපසරිය තුළ උපරිමයෙන්ම පැවරුණ වගකීම ඉටුකර ඇත. පරිත්‍යාග යෙන් ඉටුකර ඇත. වාසියක් සහනයක් නොලබා ඉටුකර ඇත. සුදුතුම් පිය ලංකාගමනට කෙතරම් බාරදූරව වගකීම් පවරාගෙන කටයුතු කළත් තමන්ගේ කිට්ටුවන්තයකුට ගාලුමුවදොරට පිවිසීමට ප්‍රවේශපතක් හෝ නොගෙන කටයුතු කළ පියතුමන්ලා අපමණය. ගිහි ජනතාව අපමණය. පැවිදි පිරිස අපමණය. එය අගැයිය යුත්තකි. ප්‍රශංසා මුඛයෙන් බිණිය යුතු කරුණකි. ඒ ඇගයීම කරන්නට ප්‍රදීපය සූදානම්ය. එය කවදත් ප්‍රදීපයෙන් ඉටු වූ සද්කාර්යයකි.

සුදුතුම් පියතුමෙක් රටකට පැමිණීම සුවිශේෂ කරුණකි. 1970 දී පළමුවරට හයවන පාවුළු පාප්තුමන්ගේ ලංකා සංචාරය පිළිබඳව එදා ප්‍රදීපය පළ කළ පුවත් අදටත් වටින්නේ එම සංචාරය අළලා විවිධ පැතිකඩ තුළින් එළිදැක්වූ ලිපි සැමදා අලුත් වන බැවිනි. ඒ හා සමානවම 2005 වසරේදි සා. දෙවන ජුවාම් පාවුළු පාප්තුමන්ගේ ලංකා සංචාරයේදී එය මුල්කොට එළිදැක්වූ සියලු ලිපි හා අනෙක් කරුණු හා බැඳුනු විස්තර එදා ප්‍රදීපය විස්තර කළ නිසා අදටත් ඒවා පිරික්සා බලන විට දැනෙන්නේ ඉමහත් සතුටකි. ඒ ගමන සාර්ථක කර ගන්නට අත හිත දුන් බොහෝ පිරිස් ගැන නැවත නැවත ආවර්ජනය කරන විට නැගෙන්නේ අපමණ භක්තියකි.ඒ පමණක් නොව එදා ලංකා සංචාරය මුල් කොට එළිදක්වා ඇති විවේචන හා විරුද්ධ වීම් පිළිබඳව ඇති ලිපි ලේඛන නැවත නැවත කියවන විට දැනෙන්නේ පහන් හැඟීමකි.

එනයින්ම බලා මෙවර ප්‍රදීපය කළඹ සියලු කරුණු සම්පූර්ණ නොවුවත් යම් ප්‍රමාණයක හෝ ඒවා එළිදක්වන්නට ගන්නා තැත යම් සාර්ථකත්වයක් ගෙන ඇති බව පැහැදිලියි. ඒවා අතර ප්‍රශංසා මෙන්ම විවේචනද නැත්තේ නොවේ. විවේචනයක් ඇත්නම් එයද කරන්නා කර ඇත්තේ සද්භාවයකින් බව අපගේ විශ්වාසයයි. හැම කෙනෙකුටම පාප්තුමන්ගේ සංචාරයේ කොටස් කරුවකු බවට පත්වන්නට තිබූ උනන්දුව හා එහි වැදගත්කම එවන් විවේචන වලින්ද පසක් වේ. ඕනෑම කාර්යයක් ඕනෑම මොහොතක සියලු ප්‍රතිඵල එකවර ගෙන එන්නේ නැත. නමුත් කාර්යය සඵල වන්නේ සියලු දෑත් එක්තැන් වූ විටයි. එහිදි කිට්ටු වූ දෑත් වල පරාසය විවිධත්වයක් ගනි. නමුත් උනන්දුව හා කැපවීම එකසේ පිළිගැනීමට ලක්වේ.

සියලු කරුණු එලෙස බලා මෙවර ප්‍රදීපය කළඹ පිරිනමන්නේ සුදුතුම් ගමන සාක්ෂාත් කර ගන්නට දෑත් දිගු කළ ඒ සැම දෙනාටම පිදෙන කෘතගුණතාවයේ ත්‍යාගයක් ලෙසිනි.

# ගෝලීය වර්තමානයේ ධර්මිෂ්ඨ ශ්‍රේෂ්ඨයකු දිටිමි

ස්වර්ගාරෝහණයට මොහොතකට පෙර ශ්‍රාවක පේදුරුතුමන් ඇමතූ උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුස් සමිඳුන් 'සිමොන් පේදුරු, ඔබ මට ප්‍රේම කරන්නේදැ'යි ඇසූ සේක. 'මා ඔබවහන්සේට ප්‍රේම කරන බව ඔබවහන්සේ දන්නා සේක' යන පිළිතුරු ඇසූ ජේසු සමිඳුන් 'මාගේ බැටළුවන් පෝෂණය කරන්නැ'යි ඔහුට වදාළ සේක. සුළු මොහොතකින් එම ප්‍රශ්නයම ඇසූ ජේසු සමිඳුන්ට පේදුරු තුමන්ගේ ප්‍රතිචාරය වූයේ ඔහුගේ එකම පළමුවන පිළිතුරමය. 'ඔවුන් රැක බලා ගන්න' යනු ඊට උන්වහන්සේ දුන් පිළිතුර විය. ශ්‍රාවකයින් සමග ටික වේලාවක් කථා කළ උන්වහන්සේ 'ඔබ මට ප්‍රේම කරන්නේදැ'යි නැවතත් ඇසූ විට පේදුරුතුමන්ගේ සිත තරමක් සසලවූ බව පෙනෙන්නට විය. 'සියල්ල දන්නා ඔබවහන්සේ මා ඔබවහන්සේට ප්‍රේමකරන බව දන්නා සේකැ'යි දීර්ඝ පිළිතුරක් දුන් පේදුරුතුමන් අමතා අසීමිත සෙනෙහසකින් 'මා අනුව ක්‍රියා කරන්නැ'යි වදාළ සේක. ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් 'ධර්මිෂ්ඨ ශ්‍රේෂ්ඨයකු' ලෙස හඳුනාගත්තේ ජේසු තුමන්ගේ එම වචන කීපයෙහි අන්තර්ගත වූ අර්ථයෙනි.

මෙරට භූගෝලීය සිතියමේ උතුරු - දකුණු කළාපයෙන් උන්වහන්සේ නෙත ගැටුණ කිසිවකුත් එම හඳුනා ගැනීම අතිශයෝක්තියකැයි අභියෝග නොකරනු ලබන බව විශ්වාස කරමි. උන්වහන්සේ දුටු ලක්ෂ සංඛ්‍යාත ජනතාව අතර, කතෝලික විශ්වාසක නොවන ජනතාවක්ද වූහ. ආරාධිතව පූජාසනය පෙනෙන මාණයේ අසුන් ගත් ප්‍රභූන් ද, සදාචාරසම්පන්න පැවැත්ම ගැන දේශනා කරනු ලබන වෙනත් විශ්වාසක පූජක තුමන්ද ඒ අතර වූහ. මෙරට ගත කරනු ලැබූ දෙදින තුළ උන්වහන්සේගේ දෙනෙතින්ද, සුමුදු සිනාවෙන්ද ගළාගිය 'ක්‍රිස්තියානි මානව දයාවේ' (christian Humanity) උණුසුම මේ සියලු දෙනාටම දැනුණ බව පැහැදිළිය. ගැළවුම්කාර ජේසුස් ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේ කුරුසියේ එල්ලී සිටිමින් 'abba' යනුවෙන් ස්වර්ගීය පියාණන් ඇමතූ පලස්තීන භාෂාවේ වචනය 'papa' ලෙස ග්‍රික වචනයට පරිවර්තනය වී, 'Pope' යන ඉංග්‍රීසි ඉංග්‍රීසි ව්‍යවහාරයට අනුගත විය. දමිළ ව්‍යවහාරයේ එන 'අප්පා' යන වචනය එම පලස්තීන් 'abba' යන ව්‍යවහාරයම ශබ්දයට නැගීමකි.

මෑත සභා ඉතිහාසය තුළ 'පාලම් තනන්නා' යන අර්ථය දෙන Pontiff යන වදනින් පාප්වරය හඳුන්වනු ලබයි. 1962 සිට සිවු වසරක් තුළ සාකච්ඡා කරනු ලැබූ දෙවන වතිකාන සම්මන්ත්‍රණයේදී, එම සියවසේ ඉතිරි යුගයේද, ඊළඟට පිය තබන සහස්‍රකයේදීද සභාවේ ප්‍රධාන මෙහෙවර වන්නේ එම 'පාලම් තනන්නා' යන අභිප්‍රාය සත්‍යයක් බවට පත්කරලීම බව හඳුනාගන්නා ලදී. සභාව අභ්‍යන්තරයේද, සභාවෙන් වෙන්වූ වෙනත් නිකායන් අතර මෙන්ම, සමාජ සහ සංස්කෘතික විවිධත්වය අතරේද එක් කිරීමක් සිදුවිය යුතුයයි පිළිගනු ලැබිණ. 'ක්‍රිස්තියානි දයාව' අපෝස්තලික සේවාවේ 'මහ පටැඟිලි සලකුණ' (Rule of thumb) ලෙස පිළිගනු ලැබූ එහිදී, එමගින් ලෝක ප්‍රජාව වෙත ලංවීමේ අවශ්‍යතාවය සභාගත කරන ලදී. ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ ආසන්න පුරෝගාමියකුවූ දෙවන ජුවාම් පාවුළුතුමන් වරක් (1995) ජගත් සමුළුව (UN) අමතමින් සඳහන් කරන ලද්දේ 'ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව අප තුළ පවත්නා විශ්වාසය කිසිදු අයකු නොසළකා හැරීමට බලපෑමක් නොකරයි. එහෙයින් අනෙකුත් අය සමග ගෞරවාන්විත සංවාදයකට අප බැඳී සිටිමු. ක්‍රිස්තුස් වහන්සේගෙන් දීප්තිමත්ව විද්‍යමාන වූ ප්‍රේමය අනෙකුත් අය නොසළකා හැරීමට නොව, එක් කිරීමටය. ඒ සඳහා කිසිවකුත් අත් නොහැරේ' යනුවෙනි.

ගුවන් තොටින් මහමගට පිවිසි ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් තමන් කෙරෙහි විශ්වාසයෙන්, රෝද පුටු මත බලා සිටි දුබලයින් දැක රියෙන් බැස ඔවුන්ගේ හිස් අතගා මුහුණ ස්පර්ශකොට ආශිර්වාද කරන ලද්දේ, ඔවුන්ගේ සමාජ වෙනස්කම් ගැන විමසීමකින් තොරවය. දිව්‍ය පූජා යාගමය පීඨය පෙනෙන මානයේ රෝද පුටු, ගිලන් ඇඳන් මත සිටි රෝගී දුබල මිනිසුන්, ගැහැනුන් සහ දරුවන් ස්පර්ශකොට, ආශිර්වාද කරන ලද්දේත් එසේමය. ජෙරුසලෙම් බැටළු දොරටුව (Shups Gate) යාබදව, බෙත්සෙයිදා නාන පොකුණ වටා බරාද (Porticaes) පහක වැතිරී සිටි. එදා සමාජය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අන්ධ, කොර, අංශභාග සහ විවිධ දුබලතාවයන්ගෙන් පෙළුණ ගැහැනුන් මිනිසුන් දුටු ජේසු සමිඳුන්, ඔවුන් බැලීම සඳහා පොකුණු දොරටු පඩිපෙලින් බැස ගිය සුවිශේෂ සිදුවීම මෙහිදී අපට සිහිගන්වයි.

තිස් අවුරුදු කාලයක් එසේ වැතිරී සිටි අංශභාග රෝගියකු අමතා 'ඔබ සුවය ලැබීමට කැමතිදැ'යි උන්වහන්සේ ඇසූ සේක. ඔහුගේ දීර්ඝ පිළිතුර වූයේ 'ස්වාමිනී, ජලය කැළඹෙන මොහොතේ මා ඊට උස්සා දැමීමට කිසිවකුත් නැත. මා අමාරුවෙන් ඒ දෙස ඇදෙන විට, තවත් අයකු ඉදිරියෙන් ගොස් මා වළකාලයි' යන මැසිවිල්ලය. ඔහු දෙස අනුකම්පාවෙන් බැලූ උන්වහන්සේ 'පැදුර අතට ගෙන, ඇවිද යන්නැ'යි විධාන කළවිට, ඔහු නැගිට පැදුර අතට ගෙන මිනිසුන් අතරින් නොපෙනී ගියේය. සබත් දිනයේදී එම රෝගියා තමන් වහන්සේ අතින් සුවය ලැබූ බව දැනගත් පරිසිවරුන් උන්වහන්සේට වරද පැටවීම සඳහා බලා සිටියහ. 'මා තුළ වැඩ සිටින දෙවි පියාණන් වහන්සේ තවමත් වැඩ කරන සේක. මමද එසේම වැඩකරමි' යි උන්වහන්සේ ඔවුන්ට පැවසූහ. තමන් වහන්සේ තුළ ආත්ම ගතවූ දෙවි පියාණන් හේතුවෙන් මහිමාන්විත වන දේව මනුෂ්‍යයා (GoD man) එවැනි ආකල්පමය ශ්‍රේෂ්ඨත්වයකින් තොරව 'එඬේර' අධ්‍යාත්මයකින් පූර්ණ මනුෂ්‍යයකු ලෙස නිහතමානීවූ සේක. උන්වහන්සේ වදාළේ 'මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා තම ජීවිතය බැටළුවන් උදෙසා පූජාකරනු ලබන්නේය. එඬේරකු නොවන, බැටළුවන්ගේ අයිතිකාරයාද නොවන, කුලීකාරයා වෘකයා දැක පළා යන්නේය...... මම යහපත් එඬේරාය. මම මගේ බැටළුවන් හඳුනමි. ඔවුහු මාද හඳුනති. පියාණන් වහන්සේ මාද, මා පියාණන් වහන්සේද හඳුනන්නාක් මෙන් මම මගේ බැටළු රැළ හඳුනන්නෙමි. තවද, මේ රැළට අයත් නොවන, අන් බැටළුවන්ද මට ඇත්තාහ. මම ඔවුන්ද ගෙන ආ යුතුය. මෙසේ එකම රැළක්ද, එකම එඬේරෙක්ද වන්නාහ' (ජුවාම් 10:11-16).

මිත්‍ර පවුලක වැඩිහිටියකු මා හට ප්‍රකාශ කළේ පාප්තුමන්ගේ මෙරට ගමනේදී කතෝලික විශ්වාසක අපගේ සදාචාරාත්මක පැවැත්ම සහ විනය තුළින් බලවත් සමාජ ආදර්ශයක් ඒ අය දුටු බවය. ජුවාම් තුමන්ගේ සුවිශේෂයේ දැක්වෙන එඬේරාණන් සහ බැටළුවන්ගේ අන්‍යෝන්‍ය විශ්වාසය සහ හඳුනාගැන්ම, සුදුතුම් පියාණන් පිළිගත් මෙරට කතෝලික ප්‍රජාවගේ ආදර්ශයෙන් දුටු අප සහෝදර මිත්‍රයින්ට, කෘතඥතාව පළකරමින් අප සොම්නසට පත්විය යුතුය. සභා එඬේරාණන් මෙසේ මෙරට ගත කළ දෙදින සභා ඉතිහාසයටද, සමාජ ඉතිහාසයටද අමතක නොකළ හැකි සන්ධිස්ථානයකි. 'වෛරයෙන් වෛරය නොසංසිඳේ' යන ශ්‍රේෂ්ඨ ඉගැන්වීම හය හතර දන්නා වියේ සිට ඉගෙන, එය ආත්මගතවූ මිනිස් කැළලක් අප අතර වූහ. එමෙන්ම එයට නව අර්ථකථන දෙමින්, බැතිමතුන් ඉදිරියේ සිය ගාම්භීර පැවැත්ම ප්‍රදර්ශනය කරමින් ශුද්ධ වචනය සිය ලේකම්වරුන් (Scribes) ලවා වෙනස් කළ ජෙරුසලමේ දේවස්ථානයේ පූජකවර සදිසිවරුන්ට සමානවූ මිනිසුන්ද වූහ. ඔවුන්ගේ ඝෝෂාකාරී ද්වන්ධ සටන අවසන් වූයේ, දැඩි නියඟයේ අවිකාෂ්ඨක පීඩාවට පත්ව වියැළී, කැඩී බිඳී ගිය කැටකැබලි විසිරී ගිය ලක්පොළවක ස්වභාවය නිශ්ශබ්දවූ ලක්වැසියනට ඉතිරි කරමිනි. එසේ වුවද, ඒ වනවිටත්, වැසිවළාවන් පිළිබඳවූ බලාපොරොත්තු තැබූ මොහොතක ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් පැමිණ එම පොලෝතලයට ආශිර්වාද කළ සේක. 'ස්වර්ගය සහ මහපොළව මැකී යා හැකිය, එහෙත් මාගේ වචනය මැකී නොයන්නේය. එහෙයින්, ඔබ ඉදිරියේ සිදුවන දේ ජය ගැනීමට ශක්තිය ලබාදෙන ලෙස යාච්ඤා කරමින් මිනිසා බවට පත්වූ දේව පුත්‍රයා ඉදිරියේ නොසෙල්වී සිටින්න' (ලූක් 21:33, 36) යන දේව වචනය මේ මොහොතේ අපට සිහිගන්වයි.

මැවුම්කාර පියාණන් වහන්සේ විචිත්‍රවූද, විවිධත්වය ආත්මගත වූද ජීවයෙන් පරිපූර්ණ ලෝකයක් මවා, එහි ශක්ති පරාසය ජයගෙන මනුෂ්‍යත්වය පරිපූර්ණ කර ගැනීමට (Subdue) නිදහස් අභිමතය (free will) ද දායාද කළ සේක. වර්තමානයේ ජාතික, භාෂාමය සහ සංස්කෘතික වශයෙන් පරිණාමයට පත්වූ එම විවිධත්වය හෙවත් දේව මැවිල්ලේ සුන්දරත්වය නොසැලකූ මිනිසුන් විසින් ගැටුම්කාරී වාතාවරණයක් කැඳවා ගනු ලැබූ ආසන්න ඉතිහාසයක් අපට ඇත. මෙම අතීත අඳුරු සෙවනැලි තුළ චිත්ත පීඩා විඳින මිනිසුන්ද සෙසු සමාජය අතරද 'පාලම් තනන්නකු' වීමේ අභිලාෂයද සුදුතුම් පියාණන්ගේ දේශනය තුළ ගම්‍යමාන විය. 'ආර්ථික ප්‍රශ්න මධ්‍යයේ වුවද, සෑම මිනිසකුට සිය ආහාරවේල සපයා ගැනීමට හැකියාව තිබිය හැකි වුවත්, මිනිසා ආහාරයෙන් පමණක් ජීවත් නොවේ. සෑම මිනිසකුටම තමා රැක බලා ගැනීමටත්, සාමයෙන් ජීවත් වීමටත් අවකාශ තිබිය යුතුය.' උන්වහන්සේ පය තැබූ මෙරට තුළ දුටු ජාතික, සමාජයික සහ සංස්කෘතික විවිධත්වය, ඉහතින් දැක්වූ 'දයාවේ පණිවුඩය' මගින් බද්ධ කිරීමේ ඇතුළාන්ත දර්ශනයකින් අප ඇමතූ බව අවබෝධ කර ගත හැකිය.

**මයිකල් වර්ණකුලසූරිය**
සමගිමාවත, වැලිසර



ක්‍රිස්තු වර්ෂ 2015 පෙබරවාරි 15 ඉරිදා
ඥානාර්ථ ප්‍රදීපය



# සසුන් පිය ලංකා ගමනේ ගුවන් විදුලි මාධ්‍ය මෙහෙවර

## ප්‍රේමයේ පවතින්න

**සසුන් පිය ලංකා ගමනේ මාධ්‍ය කමිටුව අනු කමිටු කීපයකට බෙදා තිබුණි. රූපවාහිනී, ගුවන් විදුලි, මුද්‍රණ, භාෂා පරිවර්තන සහ මාධ්‍ය කේන්ද්‍රය යනාදි වශයෙනි. එයින් මා නියෝජනය කළේ ගුවන් විදුලි අනු කමිටුවයි. එහි සමාජිකයෝ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ජූඩ් අයිවන්, නෙත් FM ගුවන් විදුලියේ නුවන් ලියනගේ, ලෙනාඩ් හපුආරච්චි, සෙත් FM ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ඇන්ටන් ජයමහ වූහ.**

පාප් වහන්සේගේ ලංකා ගමනය පිළිබඳව දෙස් විදෙස් ගුවන් විදුලි නාලිකාවන් අපෙන් යම්කිසි කාර්යයක් බලාපොරොත්තු වූවානම් ඔවුනට ඒ අවශ්‍ය කරන දේ සැපයීම අපේ කාර්ය භාරය විය. ඒවගේම එම ගුවන් විදුලි නාලිකා ඔස්සේ පාප් වහන්සේගේ ගමන සඳහා ජනතාව දැනුම්වත් කිරිම සහ සූදානම් කිරිම අපට පැවරී තිබුණි.

හදිසියේ තීන්දු වූ ජනාධිපතිවරණය නිසාම ගුවන් විදුලි නාලිකාවන් පාප් වහන්සේගේ ගමනට පෙර දිය යුතු මූලික තැන දෙන්නට අපොහොසත් විය. ඒ නිසාම අප සංවිධානය කරන්නන් ආකාරයට ඒ අංශයේ වැඩ කිරීමද තරමක් දුරට අඩාල විය. එහෙත් අප පවත්වන්නට යෙදුනු මාධ්‍ය සාකච්ඡා කිහිපයේදී ඊට සහභාගී වූ සෑම ගුවන් විදුලි නාලිකාවක්ම මේ ගැන දැනුම්වත් කළා සේම, ඒ අයට අවශ්‍ය දත්ත සපයා දෙන්නට කටයුතු කළෙමු. මේ සඳහා කමිටු නියෝජිතයින් ගත් අපරිමිත මහන්සිය වෙනුවෙන් මගේ කෘතඥතාවය ඒ අයට පිරිනමන්නට කැමැත්තෙමි.

එසේම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මේ කටයුත්ත සඳහා නියැලෙන නිළධාරීන් කල් තියා දැනුම්වත් කිරිමේ රැස්වීම් කිහිපයක්ද පැවැත්විය. මැතිවරණ කාලයේදී පවා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අප ඉල්ලන ඕනෑම ගුවන් කාලයක් දෙන්නට කටයුතු කිරීමද අප මෙහිදී කෘතඥ පූර්වකව සඳහන් කළ යුතුය. අනෙකුත් පෞද්ගලික ගුවන් විදුලි නාලිකාවන්ද නොයෙක් මාදිලියේ වැඩසටහන් විකාශය කිරිම වෙනුවෙන් අපගේ ප්‍රසාදය ඔවුනට පිරිනැමිය යුතුය.

පාප් වහන්සේ දිව්‍ය යාගය පැවැත්වූ ගාලු මුවදොර පිටියේ නිවේදන කටයුතු භාරව සිටියේද ගුවන් විදුලි කමිටුවයි. අප රටේ ගුවන් විදුලි සහ රූපවාහිනි නාලිකාවන්වල නිවේදන කටයුතු කරන කතෝලික නිවේදක නිවේදිකාවන් මේ කටයුත්තට යොමුකර ගත් අතර අපගේ අධීක්ෂණය යටතේ ඔවුහු තම කාර්යය මැනෙවින් ඉටු කළහ. ඒ වෙනුවෙන් ඔවුනටත් අපගේ කෘතඥතාවය පිරිනමන්නට කැමැත්තෙමි.

මට පැවරුණු ප්‍රධාන කාර්යයක් වූයේ පාප්වහන්සේ මෙරටට පැමිණෙන මොහොතේ සිට එතුමන් දිවයිනෙන් පිටත්ව යනතුරු ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සහ රූපවාහිනි නාලිකාවන් සිදුකරන්නට යෙදුනු සජීවී වැඩසටහන් සඳහා ගරු පියතුමන් යොමු කිරීමයි. මේ කටයුත්ත තරමක් භාරදූර කටයුත්තකි. ඒකට හේතු කීපයකි. එවැනි සජීවි වැඩසටහන්වලට සහභාගි වීමට පළපුරුදු ගරු පියතුමන් අතලොස්සකි අපට සිටින්නේ. පාප් වහන්සේගේ ලංකා ගමනේ වෙනත් කාර්යයන් හී මේ පියතුමන් නිරතව සිටීම නිසාම මේ පළපුරුදු පියතුමන් මේ සඳහා යොදාගන්නට අපට නොහැකි විය. අනෙක් කරුණ වන්නේ එකම වෙලාවක ඒ නාලිකා සියල්ලම සඳහා පියතුමන් විශාල සංඛ්‍යාවක් යොමු කරන්නට සිදුවීමයි. මේ නිසාම අලුත්ම පියතුමන් කණ්ඩායමක් මේ සඳහා සූදානම් කරන්නට අපට සිදුවිය.

මේ නිසා මුලින්ම මේ කාර්යය සඳහා යම් කිසි හැකියාවක් ඇති ගරු පියතුමන් 15 දෙනෙකු පමණ තෝරා ගත් අතර ඉන් අනතුරුව උන්වහන්සේ වෙනුවෙන් කෙටි වැඩමුළුවක් සංවිධානය කර අප සූදානම් කරගෙන තිබූ තොරතුරු උන්වහන්සේලාට ලබාදුන්නෙමු.

එහිදී රූපවාහිනි හා ගුවන් විදුලි වැඩසටහනකට සහභාගිවීමේදී කළ යුතු ප්‍රධාන කාර්යයන් පිළිබඳව ඔවුන්ව දැනුම්වත් කළ අතර ඊට අමතරව උන්වහන්සේ සුදුතුම් පියතුමන් සහ ඒ වටපිටාව පිළිබඳවත්, වතිකානය සහ පාප් තුමන්ගේ ඉතිහාසය පිළිබඳවත්, පාප් වහන්සේගේ ලංකා ගමන සහ ශු. ජුසේවාස් පියතුමන් පිළිබඳවත්, ඊට අදාල විවිධ අංශ පිළිබඳවත් තොරතුරු තම උත්සාහයෙන්ම එක්රැස් කරගත්හ.

රූපවාහිනි හෝ ගුවන් විදුලිය සමග ඔබත් සිටියානම් එතුමන් මේ සඳහා කොයිතරම් වෙහෙසක් ගෙන සූදානම් වී සිටියේද කියා තේරුම් ගත හැකිය. මේ සජීවි වැඩසටහන් සඳහා මා සමග සහභාගි වුනු දේව ධර්ම නිකේතනයේ අදියුරු අතිගරු දයා ෂෙල්ටන්, ජෝන් මේරි වියානි දෙව්සත්හල් අදියුරු ගරු වික්ටර් සිල්වා, සා. තෝමස් ජාත්‍යන්තර පාසලේ අධ්‍යක්ෂ ගරු කෙනඩි පෙරේරා, කොහුවල නි.ම.නි දෙව්සත්හලේ ගරු එමාඩ් දල්පදාදු, මරදාන මීසම් සේවක ගරු ඇන්ජලෝ විජේවික්‍රම නි.ම.නි දිව්‍ය ගැලවුම් කරුවාණන්ගේ නිකායේ ගරු සනත් කුමාර දිගැනි ක්ලැරේෂියාන නිකායේ හිටපු ප්‍රාදේශීයාධිපති ගරු ජෝයි මරියරත්නම්, දිව්‍ය සත්ප්‍රසාද නිකායික දෙව්සත්හල් අදියුරු ගරු සාගර ජයමාන්න දි.ස.නි, මරදාන සා. ජෝශප් විද්‍යාලයේ ආචාර්ය ගරු ප්‍රදීප් ප්‍රනාන්දු, යාපනය රදගුරු වසමේ ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු රොහාන් පෝල්, ගරු නිලුෂන් ප්‍රනාන්දු නි.ම.නි, භක්ති ප්‍රබෝධනය කර්තෘ ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි පියතුමන්ලාට සහ ගරු තේවාචාර්ය තුමන්ට මාධ්‍ය කමිටුව වෙනුවෙන් මගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්නෙමි.

මේ කාර්යය ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. මේ වැඩසටහන්වලට සහභාග වූ බොහෝ පියතුමන්ලාට මෙය තමන්ගේ පළමුවන රූපවාහිනි, ගුවන් විදුලි වැඩසටහන විය. එය දීර්ග සජීවි වැඩසටහනක් වීම තවත් අභියෝගයකි. අනෙක් පැත්තෙන් මෙය ලංකාවේ වැඩිම කතෝලික පිරිසක් නැරඹූ වැඩසටහනද විය. එසේම වැඩිම අන්‍යාග මිකයින් පිරිසක් නැරඹූ කතෝලික දහමට සම්බන්ධ වැඩසටහනක් නිසාම ඔවුන්ව නිවැරදිව දැනුම්වත් කිරීම වගකීමෙන් කළ යුතු දෙයක් විය. මේ කර්තව්‍යය අපගේ ගරු පියතුමන් ඉතා මැනෙවින් කළ බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඒ කවුරුන්වත් ආධුනිකයින් බව ඇසු නැරඹූ කාහටවත් වැටහුණේ නැත. එයට හේතුව එම පියතුමන්ගේ කැපවීම සහ වගකීමෙන් සූදානම් වීමයි. ඒ පියතුමන් සමහරවිට සුදුතුම් පියතුමන්ව සජීවිව දැකගැනීම පවා කැප කළා. සුදුතුම් පියතුමන් දිව්‍ය යාගය සිදුකරන මොහොතේදීත් සමහර පියතුමන් රූපවාහිනි ගුවන් විදුලි මැදිරි තුළ සිරවී කටයුතු කළ බව නොරහසකි.

ඒ වගේම පසුගිය ජනාධිපතිවරණයෙන් පසුව රජයේ සිදුවූ වෙනස්වීම් නිසා මාධ්‍ය ආයතන කඩිමුඩියෙ තමයි මේ සජීවි වැඩසටහන් සූදානම් කළේ. ඒ නිසාම මගේ කාර්යභාරය තරමක් අපහසු වුනේ ඒ අය ඉල්ලු සැනින් පියතුමන් ඒ වෙත යොමු කිරීමට සිදුවීමය. ගරු පියතුමන් ද මට උපරිමයෙන් සහය දුන් නිසා එය මට අපහසු වුනේ නැත. මේ සියලු කටයුතු අප පියතුමන්ට නැවුම් මෙන්ම ඉතා තෘප්තිමත් අත්දැකීමක් විය. රූපවාහිනි තිරයෙන්, ගුවන් විදුලියෙන් දකිනවාට අසනවාට වැඩියෙන් තිරය පිටුපස බොහෝ දේ සිද්ධ වේ. වැඩසටහන අතරතුරේ ලැබෙන විරාමයේදීත් හරි අපූරු දේ සිදුවන්නේය. මැදිරියේ සිටින වැඩසටහන මෙහෙයවන අන්‍යාග මික නිළධාරින් පාප් වහන්සේගේ ගමනෙන් උද්දාමයට පත්වීම නිසා තම දැනගැනීම පිණිස ඔවුන් නොයෙක් විදිහෙ තොරතුරු අසන්නට විය. ඒ දේවල් විස්තර කරන්නට, අපේ අත්දැකීම් ඔවුන් සමග බෙදාගන්නටත් අපට සිදුවිය. ඒ නිසාම ඒ අත්දැකීම අප පියතුමන්ට හරිම රසවත් එකක් විය.

ඒ අතරේ තවත් අත්දැකීමත් අප ලැබුවෙමු. දුර්වල අපව අන් බලවේගයන් මගින් අපූරුවට මෙහෙයවන බවක් අපිට දැනුණි. ඒ ශුද්ධාත්මයාණන් වහන්සේ බව අපට වැටහී ගියේ පසුවය. ශු. ජුසේවාස් මුනිඳුන් අප වෙනුවෙන් බලවත්ව ඒ මොහොතේ මැදිහත් වූ බව නිසැකය.

පාප් වහන්සේගේ ලංකා ගමන දැන් අවසානය. සජීවි වැඩසටහන්වලට සහභාගි වීම තුළින් ලාංකේය කිතු සසුන අත්කරගත් දායාද රැසක් පෙන්වා දෙමින් මෙම ලිපිය මම අවසන් කරන්නෙමි. ගුවන් විදුලි, රූපවාහිනී නාලිකාවන් සමග හොඳ මිතු දමකින් බැඳෙන්නට මෙය අපට අනගි අවස්ථාවක් විය. සජීවි ගුවන් විදුලි රූපවාහිනී වැඩසටහන් බිහිවී තිබීම අනාගත කිතු සසුන ලැබූ දායාදයකි. අප සැවොම මාධ්‍ය තුළ ලැබූ අත්දැකීම ඉතා විශිෂ්ටය.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතනයන් තුළ අප කෙරෙහි ඇතිකරගත් අනගි ප්‍රතිරූපය අනාගතයට ඉතා වැඩදායි එකකි.

**ගරු ජූඩ් ක්‍රිසන්ත පියතුමා**

# මධ්‍යම කමිටුවේ සම්බන්ධීකාරක කටයුතු සිදුවුණේ මෙසේය

**විශ්වීය සසුන් එඬේරාණන් නමක රටකට සැපත්වීම හැමවිටම සතුටට හේතුවන උත්සවාකාරයෙන් සැමරීමට නිමිත්තකි. අතිඋත්තම ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා සිරිලකට වැඩම කරන්නේ යැයි යන පුවත මේ අනුව ශ්‍රී ලංකාවේ සියලු කතෝලිකයන්ට ප්‍රීතිදායක පුවතක් වන්නාසේම සසුන් පිය ලංකා ගමන රටට සුවිශේෂි ආශිර්වාදයක් ලෙස ඔවුහු සලකති. ශ්‍රී ලංකාවට මීට විසි වසරකට පෙර එනම් 1995 දී අන්තිම වරට සසුන් පියාණන් නමක වැඩම කළ අතර දැන් සාන්තුවරයකු වන අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු හිමිපාණන් එදා ශ්‍රී ලංකාවෙ අපෝස්තුළුවරයාණන්වූ වන්දනීය ජුසේ වාස් තුමන් භාග්‍යවරයට එසවීමේ ඓතිහාසික දේව මෙහෙය සිදුකළේය.**

වතිකානය මගින් 78 හැවිරිදි අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියාණන් මෙරටට පැමිණෙන බව නිවේදනය කිරීමත් සමගින් සසුන් පිය ලංකා ගමන අරභයා නිමක් නැති රැස්වීම් සහ සූදානම්වීම් මගින් ඊට සැරසෙන්නට පටන් ගත්තේය. වතිකාන නිවේදනය නිකුත් වූ වහාම අතිඋත්තම මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ වහාම රදගුරු හිමිපාණන් සමග රැස්වී කමිටු 14 ක් ස්ථාපිත කර සසුන් පිය ලංකා ගමනට මූලික පියවර ගත්හ. සෑම රදගුරු හිමි නමක එක් කමිටුවක නායකත්වය දරණ අතර එතුමන්ගේ මඟපෙන්වීම තුළ අදාල කමිටුව ක්‍රියාත්මක වූයේය.

මධ්‍යම කමිටුව ප්‍රධාන නියෝජිතයන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව, ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති කාර්යාලය එහි සාමාජිකයෝ වෙති. මේ හා සමගාමීව රජය මගින්ද අන්තර් අමාත්‍ය කාර්ය සාධක බලකායක් පිහිටුවූ අතර එමගින් සභාව සමග කටයුතු සම්බන්ධීකරණය කිරීමටත්, කටයුතු සංවිධානයෙහිලා තම තමන්ගේ පාර්ශ්වයන් වෙතින් ඉටුවිය යුතු වගකීම් ඉටුකරන්නටත් පියවර ගැනිණ. රජයේ කමිටුව විදේශ අමාත්‍ය ජී. ඇල්. පීරිස් මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ අතර ආණ්ඩු වෙනස් වීමත් සමග රවි කරුණානායක මහතා ඊට නායකත්වය දුන්නේය.

මේ අතර කමිටු 14 සම්බන්ධීකරණය කරමින් කටයුතු කිරීමත් ඊට සමගාමීව රජයේ කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත් ලේසි පහසු කටයුත්තක් නම් නොවීය. විශේෂයෙන් රාජ්‍ය හා වතිකාන අවශ්‍යතා සහ මඟපෙන්වීම් වල වෙනස්කම් හමුවේ ඉලක්ක සපුරා ගැනීමේදී රජය හා සභාව අතර ඉතාමත් ඉහළ අන්‍යෝන්‍ය සබඳතාවයක් පවත්වා ගැනීමට හැකිවීම කටයුතු පහසු කළේය.

මේ අතර ජනාධිපතිවරණය සසුන් පිය ලංකා ගමන හා සමීප දිනයක පැවත්වීමට දින යෙදීමත් සමග කතෝලික සසුන් බළධාරීන්ට සසුන් පිය ගමන කල් දමන්නට හෝ අවලංගු කරන්නට පියවර ගන්නා ලෙස දැඩි පීඩනයක් එල්ල වන්නට පටන් ගත්තේය. එහෙත් කතෝලික රදගුරු සම්මේලනය සිය මතයේ තරයේ එල්බ ගෙන සිටිමින් සසුන් පිය චාරිකාව යොදාගත් පරිදි සිදු කිරීමට අවැසි කටයුතු යෙදීය. මෙහිදී තවදුරටත් ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ජනාධිපතිවරණයට ඉදිරිපත්ව සිටි ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාම හමුවෙමින් ශුද්ධොත්තම පියතුමා පිළිගැනීමට ඔවුන් සූදානම් දැයි යන්න ඉතාමත් සියුම් ලෙස විමසා බැලීය.

ජනාධිපතිවරණයේ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාම සසුන් පියා පිළිගැනීමට තමන් තුළ පවතින කැමැත්ත පළකරමින් ගුවන් තොටුපළ වෙත පැමිණෙන්නට ප්‍රතිඥා දුන්හ. මේ සියලු කලබැගෑනියන් මධ්‍යයේ කාදිනල් හිමිපාණන් සිය තීරණයේ තරයේ එල්බ ගෙන සිටිමින් සුදුතුම් පිය ගමන සැලසුම් කළ පරිදි සිදුකරන්නට දේව වරම් පතා යදින්නැයි දේව ජනතාවගෙන් ඉල්ලා සිටියේය. කාදිනල් හිමිපාණන් සසුන් පිය ලංකා ගමන අප රටට සංහිඳියාවේ සහ සාමයේ පහන දල්වන්නට කදිම නිමිත්තක් වන බවට සහතික කළේය.

ජනාධිපතිවරණයෙන් පාලනය වෙනස් වුවද සසුන් පිය ගමනට සූදානම් වීමේ කටයුතු සඳහා එය බලපෑමක් ඇති නොකළේ කලින් සිටි රජයේ අය මෙන් වත්මන් රජයේ නායකයන්ද ආයතන මෙන්ම නිළධාරීන්ද, ආරක්ෂක අංශ, ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ආරක්ෂාව සැපයීමට පමණක්ම සීමා නොවී තව බොහෝ අංශවලට දායක විය. සසුන් පිය ලංකා ගමනේ සූදානම සමඟින් මුළු රටම එකට එක්ව කටයුතු කරනු දක්නට ලැබීම සුවිශේෂි තත්ත්වයකි. මෙහිදී බොහෝ ස්වෙච්ඡා සේවකයන් කතෝලිකයන් නොවුවද ඇප කැපවූ දායකත්වයක් දැක්වූ බැව් පැවසිය යුතුමය.

මේ කාල සීමාවේදී වතිකාන නිළධාරීන් දෙවරක් සසුන් පිය වැඩසටහන හා ගමන් මාර්ගය නිරීක්ෂණය කරන්නට මෙරටට පැමිණි අතර එහිදී රජයේ නිළධාරීන් හමුවෙමින් විවිධ කරුණු ගැනත්, විශේෂයෙන් ආරක්ෂාව ගැනත් සාකච්ඡා කළ බව ඇත්තකි. සැබැවින්ම ඔවුන් බලාපොරොත්තු වූවාටත් වඩා ප්‍රගතියක් සියලු අංශවලින් ලබා තිබීම ගැන ඔවුහු සතුටට පත්වූහ.

විශේෂයෙන් මෙවර සසුන් පිය චාරිකාව පිළිබඳව පැතිර ගිය කටකතා, විචිකිච්ඡාවන්, සැක සංකාවන් සියල්ල දුරලමින් භාග්‍යවන්ත ජුසේවාස් තුමන්ගේ මධ්‍යස්ථකමින් සියලු කටයුතු සපුරා ගැන්මට ලැබුණු බව මගේ අදහසයි. විශේෂයෙන් අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පිය ලංකා ගමන සංවිධානය කිරිමේදී ලත් අත්දැකීම් මහාර්ඝ සම්පතක් ලෙස යොදාගන්නට කාදිනල් හිමිපාණෝ සමත්වූහ.

විශේෂයෙන් දෙවියන් වහන්සේ කෙරේ ඒකායන විශ්වාසයෙන්, උන්වහන්සේගේ හස්තය තුළ යැපෙමින් දේව සංරක්ෂණය කෙරේ තිර විශ්වාසය තබා කාදිනල් හිමිපාණන් ගත් මග සාර්ථක කරන්නට අපගේ අපෝස්තුළුවරයාණන්ගේ නොමඳ මැදිහත්කම නොඅඩුව ලැබුණු බව රහසක් නොවේ. අවසානයේ ශුද්ධොත්තම පියතුමා ඉතාමත් සතුටු සිතින් කාදිනල් හිමිපාණන්ට ප්‍රකාශ කර සිටියෙ ඉතාමත් මැනවින් සංවිධාන කටයුතු සිදු වූ බවයි.

**අතිගරු ජේ. ඩී. ඇන්තනි ජයකොඩි පියතුමා**
මධ්‍යම කමිටුවේ ලේකම්



# ප්‍රේමයේ පවතින්න

# භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමන්ගේ පියසටහන් සොයා



**එස්. මර්තේලිස් අප්පුහාමි මහතා**



**නිරෝෂන් පෙරේරා මහතා**



**ඇන්ටන් වික්ටෝරියා මහතා**



**ජෝශප් ඇන්ටනි ඩයස් මහතා**

විශ්ව කතෝලික සභාවේ දෘශ්‍යමාන නායකයාණන් වූ අතිඋත්තම පළමුවන ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා අප ලක් දෙරණට සැපත්වීම දේශීය කිතුනු සැදැහැවතුන්ගේ පමණක් නොව අන්‍යාග මික ජනතාවගේද හදවත් අමන්දානන්දයට පත්කරන අත්දැකීමක් වූවාට සැක නැත. එතුමා මෙහි පැමිණියේ අප දේශයේ ප්‍රථම ශුද්ධවන්තයාණන් ලෙස ඉතිහාසයට එක්වන ජුසේ වාස් මුනිතුමන් ශුද්ධවන්ත භාවයට ඔසවා තබන්නටය.

සුදුතුම් පියාණන්ගේ ශ්‍රී ලංකා සංචාරය හා අප රටට ශුද්ධවන්තයකු ලැබීම පිළිබඳව සැදැහැවත් ජනතාවගේ අදහස් දැක්වීමකට 'ප්‍රදීපය' ගත් උත්සාහයකි මේ.

**මුලින්ම මේ අදහස් දැක්වීමට එක්වූයේ ආඬිඅම්බලම ප්‍රදේශයේ වැඩිහිටියකු වූ එස්. මර්තේලිස් අප්පුහාමි මහතාය.**

මගේ වයස දැන් අවුරුදු 94 ක් වෙනවා. අප කතෝලික සභාවේ නායකත්වය දරණ පේදුරු උන්නාන්සේගේ තැන ගන්නා පාප්වහන්සේලා පිළිබඳව අප අසා තිබුණා මිසක් කිසිදාක දැක තිබුණේ නැහැ. 1970 දෙසැම්බර් මස හතරවැනිදා මුලින්ම පාප්වහන්සේ කෙනෙකු අප රටට පැමිණි දිනය මට හොඳට මතකයි. එතකොට මගෙ වයස අවුරුදු 59 යි. කටුනායක ගුවන් තොටුපලට වෙන කිසිදවසක අප දැක නැති ජනතාවක් එදා එහි ආවා. අද වගේ ආරක්ෂක ප්‍රශ්න තිබුණේ නැති නිසා මිනිසුන්ට එන්නට ගුවන් තොටුපලේ ගේට්ටු සියල්ල විවෘත කොට තිබුණා. අති විශාල වේදිකාවක සිට පාප්තුමා දිව්‍ය පූජාව සිදුකළා. ජීප් රථයක නැගී එතුමා ජනතාව අතරින් ගමන් කළා.

පසුව 1995 ජනවාරි මස 20 වනදායි, දෙවනවරට පාප්වහන්සේ කෙනෙකු ලංකාවට ආවේ. එදිනත් අප ගුවන් තොටුපල අසළ කොළඹ පාරේ සිට එම පාප්වහන්සේ දැක බලාගත්තා. මෙවර 2015 වසරේත් ලංකාවට පැමිණි තුන්වන පාප්තුමාත් දැකගැනීමට මට අවස්ථාව සැළසුණා. ගුවන් තොටුපලේ සිට හරියටම දවල් 10.15 වන විට එතුමා අප සිටි ස්ථානය පසුකළා. කතෝලිකයකු හැටියට අපට ලැබුණු මේ මහඟු අවස්ථාව පිළිබඳ මට හරි සතුටුයි! ගිහියන් වන අපට රෝමයේ වතිකාන රාජ්‍යයට ගොස් පාප්තුමකු දැකගැනීමට අප ජීවිත කාලයේදී කිසිදාක අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. පාප්තුමන්ගේ මේ සංචාරය මා දකින්නේ කිතුනුවන් වන අපට දෙවියන් වහන්සේ ලබාදුන් මහඟු තිළිනයක් ආශිර්වාදයක් කියලයි.

ඒ වගේම අප රටට ශුද්ධවන්ත මුණිවරයකු ලැබීම ගැනත් අපට හරි සතුටුයි. අප රටේ කතෝලික ආගම ඇදැහීමට තහංචි, බාධක තිබු කාළයක අනේක විද දුක්කම්කටොළු මධ්‍යයේ අප ධර්මය ප්‍රචලිත කළ ජුසේ වාස් පියතුමාට කතෝලික අප සැම ණය ගැති විය යුතුයි. එතුමා නොසිටින්නට අද අපගේ දේශයේ කිතුනු දහමක් නොතිබෙන්නට පවා ඉඩ තිබුණා. එම නිසා අප ශ්‍රී ලංකාවට ජුසේ වාස් මුණිතුමන්ගේ රැකවරණය, ආශිර්වාදය ලැබෙන බවට මට විශ්වාසයි.

**දෙවනුව අදහස් දැක්වීමට එක්වුයේ හලාවත නිරෝෂන් පෙරේරා මහතායි.**

පාප්වහන්සේ ලංකාවට එනවා කියා දැනගත්ත දා ඉඳලා අප හරිම ආශාවකින් හිටියේ එතුමා දැකබලාගන්න. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජීවත්වන ජනතාව සමග දුර බැහැර ප්‍රදේශවල ජීවත්වන අපටත් මේ අත්දැකීම විඳගැනීමට මෙවර අවස්ථාව උදාවුණා. කොළඹ ගාලුමුවදොර පිටියේදී පැවති භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් ශුද්ධවන්ත භාවයට ඔසවන ඒ ගාම්භීර දේව මෙහෙයට සහභාගිවන්නට අප පිටත්වූයේ ජනවාරි 13 වනදා සවසයි. ගාලුමුවදොර පිටියට පඅ පැමිණෙන විට රාත්‍රි 8.00 පමණ වූවා. ඒ වනවිටත් සෑහෙන ජනතාවක් එහි රැස්ව සිටියා. වේලාසනින්ම එම ස්ථානයට ලඟාවු බොහෝ දෙනෙකුගේ අදහස වුණේ එම මෙහෙය පැවති වේදිකාවට ආසන්න ස්ථානයක සිට එයට සහභාගිවීමයි. එදින රාත්‍රී අප නිදිවරාගෙන, සීතලේ ගැහෙමින් එහි රැඳී සිටියා. පසුදා උදෑසන 2.00 පටන්, මා කිසිදාක දැක නොමැති ජනතාවක් එහි ඇදී ආවා. උදේ 6.30 වන විට ගාලුමුවදොර හෝටලය අසළ සිට ජනාධිපති ලේකම් කාර්යාලය දක්වාද ඉතා විශාල ජනතාවක් රැඳී සිටියා. සමහර උදවිය ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා පැමිණ ආපසු හැරී ගිය බවද දැනගන්නට ලැබුණා. මට හැඟෙන ලෙස ලක්ෂ හතකට අධික ජනතාවක් එදා ගාලු මුවදොරට ඇදී ආ බවකුයි මට සිතෙන්නේ.

දේව මෙහෙයට පෙර ශුද්ධොත්තම පියතුමා ජනතාව ආසිරි ගන්වමින් ජනතාව අතරින් ගමන් කළා. ශුද්ධොත්තම පියතුමා ආබාධිත දරුවන් හා වැඩිහිටියන්ට විශේෂ ආදරයක්, කරුණාවක් දක්වමින් ඔවුන් ස්පර්ශ කරමින් සිප වැළඳ ගැනීම අප තුළ පාප්වහන්සේ පිළිබඳව මහත් ආදරයක් ඇතිවුණා. ක්‍රිස්තුන් වහන්සේත් මේ වගේ මහා කරුණාවක් ඇති තැනැන්වහන්සේ කෙනෙකු වන්න ඇති කියා මට සිතුණා.

රූපවාහිනියෙන්, අන්තර්ජාලයෙන් දුටු පාප්වහන්සේ සැබෑවටම අප ඉදිරිපිට ජීවමානව සිටීම, ජීවමාන දෙවිඳුන් දැකීම හා සමාන සිද්ධියක්.

**ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ගම්පහ දිස්ත්‍රික්ක ශාඛා සභාපති ඇන්ටන් වික්ටෝරියා මහතා මීළඟට අපගේ මත විමසුමට එක්විය.**

අතිඋත්තම පළමුවන ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා අප රටට පැමිණීම අප රටේ කතෝලික ජනතාවට ආධ්‍යාත්මික ප්‍රබෝධයක්, පිබිදීමක් ගෙනදුන් අවස්ථාවක් හැටියට හඳුන්වා දෙන්නට පුළුවන්. ශුද්ධොත්තම පියතුමන් ශ්‍රී ලංකාවට පැමිණීමට නිළ වශයෙන් ප්‍රකාශයට පත්වූ දින පටන් පැවතියේ අවිනිශ්චිත තත්ත්වයකුයි. ඊට ප්‍රධාන හේතුව වූයේ පාප්තුමන් මෙරටට පැමිණීමට නියමිත දිනය ආසන්නවම ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත්වීමයි. එම මැතිවරණය ප්‍රකාශයට පත්කළේ පාප්තුමන් ලංකාවට පැමිණීමට දින නියමකර ගැනීමෙන් අනතුරුවයි. අප රටේ කතෝලික ජනතාවගෙන් බහුතරයකගේ අදහස වූයේ පාප්තුමන්ගේ ශ්‍රී ලංකා සංචාරය ඉතාමත් අවිනිශ්චිත තත්ත්වයක තිබූ බවයි.

නමුත් අප සභා පාලකයින් ස්ථිර කර පැවසූ ලෙසම පාප්වහන්සේ අප රටට වැඩමකළා. ජනාධිපතිවරණයෙන් දින පහකට පසුව සිදුවු මෙම සංචාරයට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා තුළින් බලපෑමක් එල්ලවේදෝයි අප කිතුනු ජනතාව තුළ කුකුසක් තිබුණද ප්‍රාතිහාර්යයක් මෙන් වෙනදා අප රටේ මැතිවරණයකින් පසුව ඇතිවන කිසිම ප්‍රචණ්ඩ ක්‍රියාවක් විශේෂයෙන් බස්නාහිර පළාත තුළ සිදුවූවේ නැහැ. පාප්තුමන්ගේ සංචාරය නිසා දේව පිහිටෙන් ඒවා සියල්ල සමනය වු බවකුයි මා දකින්නෙ. ඇත්තෙන්ම මෙය දේව හාස්කමක්.

ඒ වගේම තවත් සඳහන් කළ යුතු විශේෂ දෙයක් තිබෙනවා. එනම් පාප්තුමන්ගේ මෙරට සංචාරයේදී එතුමා ගමන් කළ සෑම ස්ථානවලම රැස්වන ජනතාවට ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ප්‍රතමාධාර සැපයීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම මා හට පැවරී තිබුණා. ඒ අවස්ථාවලදී මා හට පෙනී ගිය දෙයක් තමයි, පාප්වහන්සේ දැක ගැනීමට ජනතාව රැස්වු හැම තැනකදීම උන්වහන්සේට ලැබුණේ ඉතා ඉහළ ජනතා ප්‍රතිචාරයක්! ඒ වගේම එම ජනතාව කෙරෙහි එතුමන් වෙතින් පළවූයේද ඉතාමත් කරුණාබර ආදර පියකුගෙන් තම දරුවන්ට දක්වන්නාවු සෙනෙහෙබර ප්‍රතිචාරයක්! විශේෂයෙන් මන්නාරම රදගුරු වසමේ මඩු දේවස්ථානයට එතුමා ගිය ගමනේදී ඉතාමත් කළාතුරකින් උදාවු එම අවස්ථාට එහි සිටි ජනතාව ඉතාමත් උනන්දුවකින් හා ගෞරව බැතියකින් එක්වනු අප දුටුවා.

**අපගේ සංවාදයට එක්වූ දියලගොඩ ජෝශප් ඇන්ටනි ඩයස් මහතා දැක්වු අදහස් මේ.**

'අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ ශ්‍රී ලංකා සංචාරය කිතුනු ජනතාවට මෙන්ම සමස්ත සිරිලක් ජනතාවම ලැබූ භාග්‍යයක් හැටියට හඳුන්වාදෙන්නට පුළුවන්. කුරිරු යුද්ධය අවසන් වී සාමයේ අරුණළු මේ මිහිමත ජනිත වන මොහොතක පාප්තුමන්ගේ ශ්‍රී ලංකා සම්ප්‍රාප්තිය සඳහා පරිසරය සැකසුනේ ආශ්චර්යමත් ලෙසයි. ජනාධිපතිවරණයක උණුසුම මැකීයන්නටත් මත්තෙන් පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වයකින් තොරව සාමකාමී වටපිටාවක් නිර්මාණය වුණා. අවසන් මොහොත දක්වාම අවිනිශ්චිත බලාපොරොත්තුවකින් පසුවු අප ජනතාව සැනසුම් සුසුම් හෙළුවේ ස්ථිරවම උන්වහන්සේ අප මව්බිමට පැමිණෙන බව දැනගත් මොහොතේ පටන්ය.

කටුනායක සිට කොළඹ දක්වා මඟ දෙපස රැස්වූ කිතුනු නොකිතුනු ජනතාව භක්ත්‍යාදරයෙන් පෙළ ගැසුනේ තම එඬේරාණන් ජීවමානව දැක ගැනීමේ ගැඹුරු විශ්වාසයකින් බව නොකිවමනාය. මුළු ජීවිත කාලයටම එවැනි භාග්‍යයක් උදාකරගැනීමට ලැබීම අප ලද ආශිර්වාදයක්.

මුළු ලෝකයේම දුක්විඳින ජනතාව වෙත යුක්තිය සාධාරණය නොමඳව ලබා දෙන්නැයි ප්‍රබලව හඬනගන මානව හිතවාදි නායකයකු ලෙස බුහුමන් ලබන මෙතුමා වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්ම ඔවුන් සොයා ගොස් සුවය සහනය ලබාදෙන යහපත් එඬේරෙක් නිළතල සැප සම්පත් පසෙකලා අල්පේච්ඡ ජීවිතයක් ගතකරන අප ආදර ශුද්ධොත්තම පියාණන් දැකගන්නට, ආසිරි ලබාගන්නට එදා ගාලු මුවදොරටත් මඩු සිද්ධස්ථානයටත් රැස්වූ මහා ජන ගංගාව එයට හොඳම සාක්ෂියක්!

සුදුතුම් පිය සංචාරය සංවිධානය කිරීමෙහිලා ශ්‍රී ලංකා රජයත් කතෝලික සභාවත් කළ මෙහෙවර අගය කළ යුතුයි. එහිදී සිදුවු සුළු අඩුපාඩුවක් ලෙස පෙන්වා දිය හැක්කේ. පාප්තුමන් ජනතාවට ආචාර කරමින් ගමන් කළ විශේෂ විවෘත රථය විශේෂයෙන් කටුනායක සිට කොළඹ දක්වා ආ ගමනේදී සෑහෙන වේගයකින් ගමන් කළා. එහි ධාවනය මදක් අඩු කළානම් මීට වඩා ජනතාවට එතුමා හොඳින් දැකබලාගැනීමට අවස්ථාව තිබුණා. සමස්තයක් ලෙස මෙවර සුදුතුම් පිය සංචාරය ඉතා සාර්ථක එකක් වූ බව මාගේ අදහසයි.



**සංවාද සටහන හා සේයා :**
**ටී. සුනිල් ප්‍රනාන්දු**

ක්‍රිස්තු වර්ෂ 2015 පෙබරවාරි 15 ඉරිදා

ඥානාර්ථ ප්‍රදීපය



# සුදුතුම් පිය ගමන කිතුනුකම අපේකම

## ප්‍රේමයේ පවතින්න

සමස්ත ලෝකයේම බහුතරයක් වූ රෝමානු කතෝලික ලබ්ධිකයන්ගේ අග්‍ර පිතෘවරයාණන් වූත් සියයට හතක් පමණවූ ලාංකීක කතෝලිකයන්ගේ ආගමීක නායකයාණන් වූත් අසීසියේ ප්‍රැන්සිස් තුමන්ගේ සේවය අගය කරමින් ප්‍රැන්සිස් නාමයෙන්ම පාප්ධූරයට පත් සුදුතුම් පියාණෝ පසු ගියදා ශ්‍රී ලංකා භූමියට පා තැබුවේ කතෝලික පමණක් නොව සමස්ත බහු ආගමීකයන්ගේ බහුමානයෙන් පිදුම් ලබමිනි.

රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් කතෝලික සභාවෙන් පරි බාහිරව උන්වහන්සේට ආරාධනා කළ පැවැති රජයේ නායකයන් විසින්ම එම සංචාරය සැලසුම් වෙද්දි කුමන හෝ බලපෑමක් මත යොදාගත් හදිසි ජනාධිපතිවරණයක් නිසා දේශයේ පමණක් නොව ලෝකයේ ජනතාවද පාප්තුමාගේ ලංකා ගමන ගැන තැබුවේ අවිනිශ්චිත තාවයකි. මෙවැනි උතුම් කටයුත්තකට සැරසෙන වකවානුවක එය දෙවෙනි කොට සලකා මැතිවරණයකට එළඹීම බොහෝ අයගේ සිත් සසල කිරීමක් වූ අතර ඒ පිළිබඳව වූ විවිධ වූ මත ජනතාව අතර රැව්දුනි.

එහෙත් කතෝලික සභාව සෘජුවම හිඳිමින් සැලසුම් කළ ආකාරයෙන් පාප්තුමන්ගේ ගමන සිදුවන බව පැවැසීමෙන්. කතෝලික සභාවේ නොසැලෙන ස්වභාවය ලොවට ප්‍රකාශ කළේය. එහි ගෞරවය දේශීය එඬේරාණන් වූ අතිඋතුම් කාදිනල් හිමිපාණන් ප්‍රමුඛ සභා ප්‍රධානින් වෙතය.

'මිත්‍යාව' පරාජය වී සත්‍යය ජය ගනිද්දී සැලසුම් කළ ආකාරයෙන් සපැමිණි සුදු පියාණන් පිළිගන්නට බලාපොරොත්තුව සිටි පාලකයනට ඉඩ ඇහිරී නව දේශපාලකයන් දෙපලකට හා අමාත්‍ය මණ්ඩලයකට ඉඩකඩ සැලැසීමද සත්‍යවාදයේ ආශ්චර්යයක් බඳු දේව සැලසුමක් සේ මෙන්විය. කුඩා දිවයිනක සුළුතර ආගමීක කොටසක් නියෝජනය කළ තමන් පිළිගන්නට සමස්ත දේශවාසිහුම පෙල ගැසී සිටි ආකාරය දුටු පාප්තුමන්ගේ සිතට කුමන හැඟුම් ඇතිවෙන්නට ඇද්ද!

කටුනායක සිට කොළඹ දක්වා පොදි කෑ සකල විධ ජනතාව 'ගාලු මුවදොර රළපතර සේ ගැලූ ජන රළකැල' පීඩිත වියලි මඩු කතරේ ඔල්වරසන් දුන් ද්‍රවිඩ පුරවැසියෝ දකුණේ උතුරේ සංස්කෘතික අංග සර්ව ආගමීක සමුළු, තැගි බෝග හුවමාරු ජේසු උපන් භූමියට ආසන්න රාජ්‍යවල අන්‍ය ආගමීක කිතුනු අහිංසක ජනයා අල්ලා ශරීරය තුළින් උරාගත හැකි හැම සාරයක්ම උරා හපකර පසුව තලපෙලා මරා දමන 'ISIS' ඉස්ලාමීය පිස්සු බල්ලන් සිටින යුගයක

වතිකානයට ආසන්න බලවත් රාජ්‍ය තුළට සිඟාකන්නට රිංගා පසු ආගමීක අන්ත වාදින් වී 'ISIS' නමින් නිරායුධ ජනයා මරණ දෙපා සතුන් සිටින යුගයක

ආසියාවේ තිස් අවුරුදු යුද්ධයක් පැවැති බහුතරයක් බෞද්ධ සිංහලයන් වෙසෙන බහුවාර්ගික බහු ආගමීක කුඩා ශ්‍රී ලංකා භූමියේ මිනිසුන්ගේ මානවවාදි සංවේදී සිතාව කෙරේ එතුමා මහත් සේ සංවේදි වන්නට ඇත.

මේ කෙටි ලිපිය අවසන් කරන්නට පෙර මෙය ලියන්නට මුඛ්‍ය අදහස මැවුන සිදුවීම පිළිබඳවද සටහන් කළ යුතු වන්නේය. සුදුතුම් පිය සංචාරය වෙනුවෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශවල මංමාවත් නිවාස හා විවිධ ආයතන ආශ්‍රිතව පිළි රූ ධජ පතාක වලින් සරසා කහපැහැ කොඩි දස අත ලෙල දෙනු පෙනුනි.

පසුගිය දිනක රාගම හීන්කෙන්දේ සිට කිරිමැටියාගාර දෙසට මාත් පුතාත් ගමන් කරන විට කිරිමැටියාගාර ගම් සීමාවේ වෙල අද්දර පිහිටි 'ශ්‍රී සම්බෝධි භාවනා මධ්‍යස්ථානය නම්' පංසලේ උස්කනුවක ගසා කතෝලීක කොඩියක් කහපැහැයෙන් බෝපත් අතර සැලෙනු දකින්නට ලැබුනි.

මේ පිලිබඳව සිත් පහන් වුන අප නැවති පුතා අත වූ ජංගම දුරකථනයෙන් පින්තූර දෙක තුනක් ගනිද්දී පංසලේ සිටි දායකයකු පැවැසුවේ ලොකු හාමුදුරුවන් මෙය මෙසේ දමන්නට ගෙනවිත් දුන් බවයි.

ඒ අනුව අපි ලොකු හාමුදුරුවන් හමුවීමු. උන්වහන්සේ කීවේ පාරේ යන විට මෙම කොඩිය වැටී තිබෙනවා දැක අහුලා ගෙන විත් මෙසේ සවිකළ බවයි. උන්වහන්සේ බොහෝ කාලයක් ගත කරන්නේ ඉතාලියේ බවත් ඉතාලියේ කතෝලික පියතුමන්ලාගේ ඇසුර හා උපකාරය නිතර ලැබෙන බවත් කීවේ ගෞරවයෙනි.

උන්වහන්සේ 'සාමතානාපති ජාත්‍යන්තර ධර්මදූත රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති විලච්චියේ ධම්ම විජය ස්වාමීන් වහන්සේ' බවත් ඉතාලියේ මෙස්සිනා බෞද්ධ විහාරාධිපති මෙන්ම මෙම කඩවත කිරිමැටියාගාරයේ ශ්‍රී සම්බෝධි භාවනා ශ්‍රමාධිපති බවත් අප වෙත පැවැසීය.

කිතු වදන වූයේ 'ඇසට ඇසක්' නොව 'අසල් වැසියාට ප්‍රේමයයි.' කිතුනු සභාව තුළින් ලොවට දක්වන්නේද එම ක්‍රියාවයි. ඉහත සඳහන් ක්‍රියාව තුළින් බොදු හිමිනමක් තුළින් අප දුටුවෙත් එවැනි කිතුනු ක්‍රියාකාරිකම් වෙනුවෙන් ප්‍රතිචාරයක් නොවේද? මෙවන් ලොවක් තුළ ලේ වගුරුවන 'ISIS' නම් අමනයන්ගේ කළු පැහැකොඩියට ලෝකයේ කොතැනකවත් මෙවන් ප්‍රතිචාර ලැබෙයිද?

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි**
හීන්කෙන්ද රාගම

# සුදුතුම් පිය දැක්ම ආදර්ශයක් කරගනිමු

**අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියාණන්ගේ ශ්‍රී ලංකා ගමන මේ රටේ කතෝලික ජනතාවට පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකීය ජනතාව තුළම ප්‍රබෝධයක් ඇති කරවීමට හේතු වූ බව කිව යුතුය.**

ජනවාරි 13 වෙනිදා ලක්දෙරණට පා තැබූ උන්වහන්සේ පිළිගැනීමට සහ දැකබලා ගැනීමට කටුනායක ගුවන් තොටුපලේ සිට කොළඹ දක්වා මගදෙපස රැඳී සිටි ජනතාවත් ඉන් අනතුරුව උන්වහන්සේ සහභාගිවූ සෑම කටයුත්තකදීම නොඉවසිල්ලෙන් යුතුව ජීවමානව තමන්ගේ දෙනෙත් වලට උන්වහන්සේව හසුකර ගැනීමට ගත් උත්සාහය අප දුටුවෙමු. එයින් ඔවුන් ලැබුයේ මහත්වූ අත්වැසිල්ලකි. තමන්ට මේ තරම් ආදරය කරන ජනතාවට හැකි හැම අවස්ථාවකදීම ලංවීමටද උන්වහන්සේ උත්සාහ දැරූහ. 'අපට සැබෑ නායකයෙක් ලැබී ඇතැ'යි ජනතාව තම තමන්ටම මුමුණා ගත්තේය.

සසුන් පිය තනතුරට තේරී පත්වූ දා පටන්ම උන්වහන්සේ තම ජීවිතය තුළින් පෙන්වූ කැපවීම තුළින් ජනතාව වඩ වඩාත් අප මහෝත්තම දෙවිපියාණන් වෙතට ලංකර ඇත්තේය. මෙහිදී උන්වහන්සේ කිතුනු විශ්වාසය සහ ජනතාව පිළිබඳව කරන ප්‍රකාශන ඉතාමත් වැදගත්වේ.

පිටස්තරින් පෙනෙන ආටෝපයට වඩා අපගේ වත්පිළිවෙත් තුළ ඇති අධ්‍යාත්මය වඩා ගැඹුරින් අත්දැකීමේ ඇති වැදගත්කම උන්වහන්සේ අපට පෙන්වා දී ඇත.

සමාජයේ පවතින විවිධ ස්ථර කඩා බිඳ දැමිය යුතු යැයි උන්වහන්සේ නොපවසති. එහෙත් ඒ විවිධ ස්ථර තුළ සිටිමින් සමානාත්මතාවයේ සහ එකඟත්වයේ ජීවිත ගත කිරීමේ වැදගත්කම උන්වහන්සේ අපට අවධාරණය කරති. තමන්ගේ ආරක්ෂකයින් සමග එක්තරා පාන්දර ජාමයක කතා බහක නිරත වන උන්වහන්සේ ඔවුන්ගේ කුසගින්න පිළිබඳව විමසා එය නිවාලීමට ආහාර සපයන්නේ ඒ නිසාය.

කතෝලික සභාව තුළට ජනතාව නැවත ඇදී ඒමට උන්වහන්සේගේ මේ අවංක සහ විවෘත ප්‍රතිපත්ති සහ ක්‍රියා පිළිවෙත් අතිශයින්ම හේතු කාරක වී ඇත. දිළිඳුන්ගේ සභාවක් සහ ඔවුන්ගේ විමුක්තිය වෙනුවෙන් කරන මැදිහත්වීම හා යොමුවීමක ඇති අවශ්‍යතාවය උන්වහන්සේ නිතර නිතර අවධාරණය කරති. මෙම අවධාරණය කිරීම කිසියම් ආකාරයකට ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ පවතින තත්ත්වයන් කරනු ලබන අභියෝගයක් ලෙසද සැලකිය හැක.

මක්නිසාදයත්, දෙව්මැඳුරු පිරෙන්නට දේව මෙහෙයට සහ වාර්ෂික මංගල්‍යයට සහභාගිවන සාමාන්‍ය කතෝලික ජනතාවට සභාව තුළ ඇති ස්ථානය අද අප කතිකාවකට ලක්කළ යුතුව තිබේ.

**අරුණ ශාන්ත නෝනිස්**



# සසුන් පිය සමරු මුද්දරය අතුරුදහන්?

**අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ලංකාගමන නිමිත්තෙන් ශ්‍රී ලංකා මුද්දර කාර්යාංශය මගින් විශේෂ මුද්දරයක් සමග මුල්දින කවරයක් නිකුත් කරන ලදි. ජනවාරි 13 වැනිදා ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවැති නිල උත්සවයේදී මේ මුද්දරය සහ මුල් දින කවරය නිකුත් කළ බවත්, එය චාරිත්‍රානුකූලව සුදුතුම් පියාණන්ට පිළිගැන්වීමත් සිදු වූ බව ප්‍රකාශ විය.**

මේ මුද්දරය හා මුල්දින කවරය මිළදී ගැනීමට කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයට ගියද එය ලබා ගැනීමට නොහැකි විය. මේ මුද්දරය පිළිබඳ තත්ත්වයද එසේමය. ප්‍රාදේශීය තැපැල් කාර්යාල වලට එවැනි මුද්දරයක් ලැබී නැති බවක් දැන ගැනීමට ලැබී තිබේ. මෙහි රහස කුමක්ද?

වසර විස්සකට පසු මෙරට සුදුතුම් පියතුමකු සැපැත් වීමේ ඓතිහාසික මොහොත සමරමින් ඒ නිමිත්තෙන් නිකුත් කළ මුද්දරය සහ මුල් දින කවරය ජනතාව අතරට නොයෑමට කිසියම් හේතුවක් තිබේද? විශේෂයෙන් මුද්දර හා මුල්දින කවර එකතු කරන මුද්දර ලෝලීන් රැසක් මෙරට සිටින බව නොරහසකි. තවත් අතකින් විශ්ව එඬේරාණන් ලෙස ලෝකය පුරා මහත් අගැයුමට හා බුහුමනට ලක්වූ අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියාණන්ගේ ලංකා ගමන නිමිත්තෙන් ශ්‍රී ලංකා මුද්දර කාර්යාංශය නිකුත් කළ මුද්දරය අතුරුදන් වූයේ කෙසේද? ජනතාව මේවා ඉල්ලන්නේ නොමිලේ නොව මුදලටය. එහෙත් අවාසනාවන්ත තත්ත්වය වී ඇත්තේ මුදලටවත් ඒවා මිළදී ගැනීමට නොහැකි වීමය. මෙහි සැබෑ තත්ත්වය කුමක්ද? මේ පිළිබඳව තැපැල්පති තුමාගේ අදාළ මුද්දර කාර්යාංශයේ නිළධාරීන් වෙතින් කරුණු දැන ගැනීමේ පිපාසයකින් කතෝලික ජනතාව පෙළෙති. ඒ ගැන කරුණු ඉදිරිපත් කරන්නැයි වගකිව යුත්තන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

**බෙන් සේනානායක**
කොළඹ

# පාප් කොඩියට නිසි තැන දෙන්න

**අතිඋත්තම ප්‍රැන්සිස් පාප්වහන්සේගේ ශ්‍රී ලංකා ගමන අරභයා ශ්‍රී ලංකා ද්වීපය පුරා විවිධ සැරසිලි, තොරන්, විදුලි බුබුලු ආදිය තළින් වර්ණවත් වූ කාලයක් දක්නට ලැබුණේ 13 දින ශ්‍රී ලංකාවට සැපත්වූ පාප්වහන්සේගේ ශ්‍රී ලංකා ගමන නිසාය. විශේෂ කොටම කටුනායක සිට කොළඹ බොරැල්ල දක්වාත්, පසුව ගාලුමුවදොර සිට මඩු සිද්ධස්ථානය ප්‍රදේශයේත්, නැවත මීගමුව හරහා බෝලවලානද විසිතුරු සැරසිලි තුළ නොමැකෙන සිහිවටන තැබීමට හැකිවිය.**

නමුත් මේ සියල්ලෙන්ම ජාති, කුල, මල භේදාදියෙන් තොරව ගෞරවණීය තුති පැසසුම් ලද සසුනිසුරාණන් ගොස් දැන් සති දෙකකටත් වැඩිය. නමුත් උන්වහන්සේ වෙනුවෙන් රාජ්‍ය, කතෝලික සභාව හා පෞද්ගලිකව ගෞරවාන්විතව කළ සැරසිලි තවමත් එසේම පවති. නමුත් අපේ ශ්‍රී ලංකා ධජයටත්, වතිකානයේ රාජ්‍ය කොඩියටත්, පාප්වහන්සේගේ කොඩියටත් අපි ගෞරවය දැක්විය යුතු වෙමු. එම නිසා දැනට රට පුරා ප්‍රදර්ශනය වන මේ කොඩි තුනම වහා ඉවත් කිරිමට සුදුසු කාලය එළඹී ඇති බව මතක් කරමු. විශේෂකොටම ගුවන් තොටුපල කරා පියමැනීමේදි ඉදිකර ඇති තොරණ රාජ්‍ය නායකයන් දෙදෙනෙකුගේ මතක සටහන් තුළ සාදරයෙන් පිළිගැනීමට ලක්කළ තොරණේ අවසන වූයේ පාප්රුව සහිත ප්‍රදර්ශනයකිනි. නමුත් පාප්වහන්සේ මැනිලාවෙන්ද රෝමයට ගොස් ඇත. නමුත් මෙම කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල අබියස ඉදිකර ඇති තොරණේ ශ්‍රී ලංකාවේ ජාතික ධජයත්, වතිකානයේ පාප්වහන්සේගේ රාජ්‍ය ධජයත් ලෙළදෙයි. මෙම කොඩිවලින් රටවල ගාම්භිරත්වය කියාපාන ගෞරවත්වය නොකෙලෙසා ඒවා ඉවත් කර නිසි ගෞරවය ලබාදීම කාගේත් යුතුකමකි. වගකීමකි. එය වහාම වගකිව යුතු නායකයන් හරහා සිදුවිය යුතුය. විශේෂ කොටම රජයේ ආගමික කටයුතු ඇමැති තුමා මෙන්ම ජාතික කොඩියට වගකියන රාජ්‍ය අමාත්‍ය මණ්ඩලයේද ඇඩි අවධානය යොමු කළ යුතු බව මතක් කර දීමට කැමැත්තෙමි.

**මැක්සිමස් රෝයි පෙරේරා**
ජාඇල



ප්‍රේමයේ පවතින්න

# මාධ්‍ය මගින් ලොවට ගිය සසුන් පිය චරිතය




සුදුතුම්පිය ලංකාගමනට පෙර මෙරට සුදුතුම්පිය චරිතය සම්බන්ධව ගොඩනැගී තිබුනේ හා ගොඩනගා තිබුණේ එතරම් හොඳ සුබවාදී ප්‍රතිරූපයක් නොවේ. විශේෂයෙන් අන්තර්ජාලය හා සමාජ ජාල අඩවි තුළ ලංකා කතෝලික සභාවත්, සභා නායකයින් හා සසුන් පියාණන් සම්බන්ධවත් විවිධ අන්තවාදී කොටස් විසින් ව්‍යාජ හා අසත්‍ය තොරතුරු රැසක් අන්තර්ජාලය පුරා විසිරුවා යවා තිබුණි. ඒවා එසේ පළ කිරීමේ අරමුණ වූයේ කතෝලික බැතිමතුන්ගේ නායකයා වන පාප් වහන්සේ නම් චරිතය දූෂිත නැතහොත් කිලිටි චරිතයක් බව හුවා දැක්වීමටයි. මේ බොහෝ පුවත් ඉතා අසත්‍ය පුවත්වලින් හා මඩ ගැසීම්වලින් පිරී තිබුනා.

## නව සුදුතුම් පියෙකු පත්වීම

පසුගියදා නව සුදුතුම් පියාණන් ලෙස අතිඋතුම් ෆ්‍රැන්සිස් සසුනිසුරාණන් පත්වීමත් සමඟම කතෝලික ජනතාව තුළ විශාල පිබිදීමක් ඇතිවූ අතර අන්තර්ජාලය තුළද එම විශාල පිබිදීම පැහැදිලිව දකින්නට හැකි විය. ඉතා ආන්දෝලනාත්මක අයුරින් අල්පේච්ඡ ජීවිතයක් හා සරල ගති පැවතුම් වලින් හෙබි මෙම වත්මන් ෆ්‍රැන්සිස් සසුන් පියාගේ ක්‍රියා කලාපය හා දිලින්දන්ට දක්වන ආදරය නිසාම වඩා වැඩියෙන් උන් වහන්සේ ගැන කතා බහ කරන්නට පටන් ගනු ලැබූවා. ලාංකිකයින් ලෙස එම උත්තේජනය දෙගුණ තෙගුණ වූයේ උන් වහන්සේ මෙරටට වැඩම කරන බව දැනුම්දීමත් සමඟයි. වසරකට පමණ පෙර සිදු වූ මෙම අනාවරණය නිසා ලංකාවේ අන්තර්ජාලය හා සමාජ ජාල පවත්වාගෙන ගිය කතෝලික තරුණ කොටස් ඉතා උද්යෝගයෙන් වත්මන් සසුන් පියාගේ චරිතය අන්තර්ජාලය තුළ ප්‍රචලිත කරමින් උන් වහන්සේගේ සමාජ සේවා ක්‍රියා හා ආදර්ශවත් ක්‍රියා සියල්ල සිංහලෙන් කතෝලික නොවන සියල්ලන්ටම දැක ගැනීමට අන්තර්ජාලය තුළ වෙනමම ව්‍යාපෘතියක් ආරම්භ කළා.

මේ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරනු ලැබුවේ 'කිතු හඬ' කතෝලික දහම රැක ගැනීමේ ජාතික ව්‍යාපාරයේ සමාජ ජාල පිටුව, හා කලක් 'නායකකන්ද මීසම' නමින් ජනප්‍රියව පවත්වාගෙන ගොස් පසුව 'කිතු තතු' යනුවෙන් වෙනස් කොට අද වන විට සමාජ ජාල තුළ ජනප්‍රියම කතෝලික පුවත් පිටුවක් වන 'කිතු තතු' කතෝලික පුවත් පිටුවත්, අශේන් එස්. සේනාරත්න විසින් පවත්වාගෙන යන 'ශ්‍රී ලංකා කතෝලිකයෝ' සමාජ ජාල පිටුවත්, 'කිතු හඬ කුරුණෑගල කණ්ඩායම 'පවත්වාගෙන යන සමාජ ජාල පිටුවත්, පසුව ඇරඹි 'සියැලි හඬ' සමාජ ජාල පිටුවත්, 'කතෝලිකයකු වීම මට ආඩම්බරයක්' නම් පිටු කිහිපයත් විසිනි. පසුගිය කාලය පුරාම විවිධ අයුරින් ඇතැමුන් විනාශ කළ කතෝලික ප්‍රතිරූපයත්, කතෝලික සභාවේ නායකයාණන් වන සසුන් පියාණන්ගේ ප්‍රතිරූපයත් නංවාලීම සඳහා පසුගිය වසර කිහිපය පුරා එකට එක්ව අන්තර්ජාලයේ සහ සමාජ ජාල ඔස්සේ විශාල කාර්යභාරයක් කරනු ලැබුවේ මෙම කණ්ඩායම් වේ. පසුව මෙම කණ්ඩායම අතරට නිල වශයෙන් එක් වූ ' pope's visit sri lanka 2015 ' නම් නිල සමාජ ජාල පිටුව හා වෙබ් අඩවියත් එම කතෝලික සභාවේ සහ සසුන් පියාගේ ප්‍රතිරූපය ගොඩ නැගීමටත්, එය ඉදිරියට ගෙනයාමටත් දායක විය.

## කතෝලික මුද්‍රිත මාධ්‍ය

සසුන් පියාගේ ආගමනයේදී වඩා බාරධූර හා ප්‍රමුඛත්වය ගෙන සිටියේ කතෝලික මුද්‍රිත මාධ්‍යයන්ය. එයිනුත් වඩා දැවැන්ත මෙහෙවරක් සිදු කරනු ලැබුවේ ලංකාවේ ඉපැරණිම පුවත් පත ලෙස ලබන වසරට වසර 150ක් සපුරණ නිල කතෝලික පුවත් පත වන ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතවේ. ලංකාවේ බහුතරය වන සිංහල කතෝලිකයින් වෙත සුදුතුම් පිය ලංකා ගමන සම්බන්ධව සුබවාදී දැක්මක් තුළින් වඩා වැඩි ජ්වලිතභාවයක් ඇති කරනු ලැබුවේ 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පත බව නොරහසකි. ඒ හා සමඟ අත් වැල් බැඳගනිමින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ අනිකුත් සහෝදර පුවත්පත් වන 'මැසෙන්ජර්' ඉංග්‍රීසි පුවත්පත, 'ඥාන ඔලි' ද්‍රවිඩ පුවත්පත, ' ළමා ප්‍රදීපය' ළමා පුවත්පත යන පුවත්පත්ද මෙම කාර්යයට වඩා සක්‍රීයව දායක විය. සුදුතුම්පිය ලංකා ගමන වෙනුවෙන් ලංකාවේ අනිකුත් සමස්ත ජාතික මාධ්‍යයන්ට මඟ පෙන්වූ ප්‍රදීපස්ථම්භය වූයේ 'ඥානාර්ථ ප්‍රදීපය' ප්‍රමුඛ අනිකුත් කතෝලික පුවත්පත්වේ. සතිපතා සසුන්පිය ගමන හා එහි විශේෂ තොරතුරුද, සසුන් පියාගේ ජීවිතයේ විශේෂ තොරතුරුද, සාන්තුවරභාවයට එසැවුණු ජුසේවාස් පියතුමන් සම්බන්ධ ලිපිද විශාල ප්‍රමාණයක් සමාජ ගත කරනු ලැබුවේ මෙකී නිල කතෝලික පුවත්පත් ජාලය විසිනි.

මෙයටම යම් ප්‍රමාණයක් දායක වෙමින් ලංකාවේ ඉපැරණිම සඟරාව ලෙස දැනට පළවන 'භක්ති ප්‍රබෝධනය' සඟරාවද මෙයට යම් ප්‍රමාණයක දායකත්වයක් දැක්වීය. එසේම තවත් එවැනිම කතෝලික සඟරා රැසක් සසුන් පිය ලංකාගමනය මුල් කර ගනිමින් ලිපි විශාල ප්‍රමාණයක් සමාජ ගත කරලීය. ලංකාවේ ජනගහණයෙන් ඉතා සුළුතරයක් වූ කතෝලික ජනතාව ගේ මෙම මහා අසිරිමත් මංගල අවස්ථාව මෙතරම් චමත්කාර ජනක ලෙස කතෝලික ප්‍රජාව තුළත් කතෝලික නොවන ප්‍රජාව තුළත් ඔසවා තබන්නට හැකියාව ලැබුණේ කතෝලික මාධ්‍යවේදීන් ප්‍රමුඛ කතෝලික මාධ්‍යයන් හටවේ. නමුත් අවාසනාව වන්නේ සසුන්පිය ලංකා ගමනේ මාධ්‍ය ආවරණයේදී නොසලකා හැර කුඩම්මාගේ සැලකිල්ල දැක් වූ පිරිස වන්නේද කතෝලික මාධ්‍යවේදීන් වීමය.

## ජාතික මාධ්‍යයන්ගේ දායකත්වය

සසුන් පිය ලංකාගමනයේදී මෙරට ජාතික මාධ්‍ය ඉටුකළ කාර්යය සුළුපටු නොවේ. සසුන්පිය ලංකාගමනය සම්බන්ධව මුලින්ම කණ වැකුණු දින සිට ඔවුන් මෙම ඉසව්වට විශේෂ අවධානයක් ලබා දෙන ලදි. රටේ පැවති දේශපාලන වාතාවරණය හා සසුන්පිය ලංකාගමනය විවිධ අයුරින් ගැටීමේදී මෙය ආන්දෝලනාත්මක ඉසව්වක්ම විය. ඇතැම් ජාතික මාධ්‍ය මේ සම්බන්ධව වගකීමකින් තොරව සිය පෞද්ගලික අදහස් ප්‍රකාශ කළත් බොහෝ මාධ්‍ය ආයතන මේ සම්බන්ධයෙන් නිල ප්‍රකාශ පමණක් උපුටා ගනිමින් වගකීමෙන් කටයුතු කළ ආකාරය ප්‍රශංසනීයවේ. බොහෝ ජාතික මාධ්‍යයන් හී සිටි කතෝලික නොවන මාධ්‍යවේදීන් විශාල පිරිසක් ලොව ප්‍රකටම ආගමික නායකයාණන් වන සසුන්පියාගේ සංචාරය ඉතා උනන්දුවෙන් හා වගකීමෙන් යුතුව උන් වහන්සේගේ ගෞරවයට හානියක් නොවන ආකාරයෙන් සිදු කළ අන්දම දැකගත හැකි විය.

විශේෂයෙන් තමන් නොදන්නා ආගමක් සම්බන්ධව ප්‍රවෘත්ති හා තොරතුරු වාර්තාකරණයේදී ඒ සම්බන්ධව අවශ්‍ය කරුණු බොහෝ විට කතෝලික පියවරුන් හෝ ඒ හා සමාන දැනුම ඇති ප්‍රවීනයින් මගින් ලබා ගන්නා අන්දම දක්නට ලැබුණු සුවිශේෂ සිද්ධියකි. ජාතික මාධ්‍ය සම්බන්ධයෙන් කතා කිරීමේදීද කතෝලික මාධ්‍යවේදීන් අමතක කළ නොහැකිවේ. මෙම ඉසව්වේ වඩා වැඩි වගකීම කරට ගෙන ලිපි හා නිර්මාණකරණයේ යෙදෙමින් විවිධ මාධ්‍ය ආයතන වෙත ලිපි හා නිර්මාණ සැපයීමෙන් කතෝලික මාධ්‍යවේදීන් කරන ලද මෙහෙය ඇත්තෙන්ම ප්‍රශස්ථය. එසේම ජාතික මාධ්‍ය ආයතන තුළ සිටි කතෝලික නොවන බොහෝ මාධ්‍යවේදීන්ද මෙහිලා තමන්ට හැකි උපරිමයෙන් මෙම විශේෂ අවස්ථාව සම්බන්ධව තොරතුරු සොයා වාර්තාකරනු දක්නට හැකිවිය. ඒ සම්බන්ධයෙන් කතෝලික ජනතා ප්‍රණාමය ඔවුන්ට හිමි විය යුතුමය.

විශේෂයෙන් අති උතුම් ෆ්‍රැන්සිස් සසුන් පියාගේ දැහැමි, අල්පේච්ඡ, දයා කරුණාවෙන් පිරි ජීවන පැවැත්ම හා ගතිගුණ කතෝලික නොවන ජනතාව වෙත ගෙන යමින් ඔවුන්ගේද ගෞරවය, ආදරය හා ලැදියාව සසුන් පියාණන් වෙතට ලබා දීමට ලංකාවේ සියළුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය විසින් සිදු කරන ලද්දේ අති විශාල කාර්යභාරයකි. රූපවාහිනී නාලිකා, ගුවන් විදුලි නාලිකා, වෙබ් අඩවි සහ සමාජ ජාල පිටු රැසකින් මෙම ඓතිහාසික අවස්ථාව සජීවීව විකාශය කරන්නට කටයුතු කර තිබිණි. ජාතික මාධ්‍ය තුළ කටයුතු කරනු ලබන ප්‍රවීන කතෝලික මාධ්‍යවේදීන් දෙදෙනෙකු වන ප්‍රියන්ත විජේසිංහ මහතාව හා නුවන් ලියනගේ මහතාව මේ අවස්ථාවේ සිහිපත් නොකරම බැරිය. ඔවුන්ගේ කැපවීම අමිලය.

## ජාත්‍යන්තර මාධ්‍ය භාවිතය

විශේෂයෙන් බහු වාර්ගික හා බහු ආගමික රටක් වන ශ්‍රී ලංකාවේ ආගමික සහජීවනය හා ජාතික එකමුතුව වඩා හොඳින් සමස්ථ ලෝකය වෙතට ගෙන යාමට මාධ්‍යය විසින් කරන ලද මෙහෙවර අති සුවිශාලය. විශේෂයෙන් මෙහිදී ජාත්‍යන්තර මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන්ටද අප හෘදයාංගම ස්තුතිය පිලිගැන්විය යුතුය. ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතියත්, ඒ හා බිහිවූ සිංහල කතෝලික උප සංස්කෘතියත් දේශීය කලාවන් හා සිරිත් විරිත් සැරසිලි, සත්කාරයන් මෙම සංචාරය හරහා මුළු ලොව පුරාම වඩාපුළුල්ව ප්‍රචාරය වූ බව දැකගන්නට තිබිණි. එය රටක් ලෙසද අප ලැබූ විශාල ජයග්‍රහණයකි. වසර තිහකට ආසන්න කාලයක් යුද්ධයකින් බැට කෑ සහ ජාතික හා ආගමික සමගිය සම්බන්ධව ලොවට වැරදි පණිවුඩ ගිය මොහොතක සසුන් පිය සංචාරයේදී ඒ සියල්ල පරදා අපගේ ජාතික හා ආගමික එකමුතුව මුළු ලොවටම දැකගන්නට ලැබීමෙන් ලක් මාතාව සම්බන්ධයෙන් ජාත්‍යන්තරය තුළ ඇතැමුන් ඇති කර තිබූ දුර්මත බිඳ දැමීමට සමත් විය.

## මාධ්‍ය සඳහා ඉඩ ඇහිරීම

සමස්ථයක් ලෙස ගත් කල සසුන් පිය සංචාරයේදී මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන් විසින් කළ මෙහෙවර අමිලය, අති විශිෂ්ටය. මාධ්‍ය ආවරණ වලදී ජනාධිපති ආරක්ෂක අංශයෙන් හා ඇතැම් සංවිධායකයින්ට ගෙන් මාධ්‍ය වෙත සිදු වූ අනවශ්‍ය බාධාවන් නොමැතිව තිබුනා නම්, මාධ්‍ය කුටියේ අන්තර්ජාල පහසුකම් වරින් වර බිඳ වැටීම් සිදු නොවී නිසි පරිදි පවත්වාගෙන ගියානම්, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් කතෝලික පියවරුන්ට හා කතෝලික මාධ්‍යවේදීන්ට ආචාරශීලීව සැලකුවානම්, විශේෂයෙන් අපහසුතාවයට පත් වූ කතෝලික මාධ්‍යවේදීන් වෙනුවෙන් කතෝලික මාධ්‍ය අංශයේ මැදහත් වීමට කවුරුන් හෝ සිටියා නම් මෙම ඉසව්වේ මාධ්‍ය ආවරණය මෙයට වඩා වැඩි අයුරින් ලෝකයට පුළුල්ව දැක බලා ගන්නට අවස්ථාව උදාවීමට හැකියාව තිබුණි. විශේෂයෙන් කතෝලික මාධ්‍යවේදීන් අතින් ශ්‍රී ලංකා කතෝලිකයින්ගේ භක්තියේ හා ශ්‍රද්ධාවේ සලකුණු විශාල ප්‍රමාණයක් මෙයට වඩා වැඩියෙන් සටහන්ව ඉතිහාසයට එක්වන්නට තිබුණි.

**තිළිණ අලහකෝන්**

සසුන්පිය ලංකාගමනයේ මාධ්‍ය අංශය නියෝජනය කළ කොළඹ කතෝලික මුද්‍රණාලයේ නිල ඡායාරූප ශිල්පී



# බලාපොරොත්තු නොවූ ජනගඟක් ගැලුවත් සියලු දෙනාට සහන සලසන්නට හැකිවුණා

අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ ලංකා ගමන සඳහා කටයුතු සංවිධානයේ නියැලි සුවිශේෂි කමිටුවක් වූයේ ආරක්ෂාව සහ වාහන මෙහෙය වීම, ජනතාව හැසිරවීම පිළිබඳවයි. කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් යුතු මේ කමිටුවේ ආරක්ෂාව පිළිබඳ ලේකම් ධුරය ධර්මදූත කලාපීය නාහිමි අතිගරු සැම් කුවින්ටස් පෙරේරා පියතුමා ද, වාහන මෙහෙයවීම ගරු ශ්‍රීනාත් මනෝජ් පියතුමා හා මහජනයා හැසිරවීම ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමන්ගේ ලේකම් ධුර යටතේ සිදුකැරිණ.

"ජනවාරි 14 වැනි දා ගාලුමුවදොර පිටියේ පැවැත් වූ භාග්‍යවත් ජුසේ වාස් තුමන් සාන්තුවරයට එසැවීමේ මෙහෙයට එක්වන්නට බලාපොරොත්තු නොවූ තරම් මහා ජන සන්නිපාතයක් එක්රොක් වුණා. කවර අවහිර බාධා මධ්‍යයේ වුවත් හැකි සෑම සියලු දෙනාටම හැකි ඉහළම සහන සලසන්න කමිටුවක් ලෙස අප වෙහෙස ගත්තා. මුළු ලංකාවම ආවරණය වන පරිදි ගරු පියතුමන් 40 දෙනකුගෙන් යුතු කණ්ඩායමක් මේ කටයුතු සඳහා අප හා අත්වැල් බැඳ ගත්තා. මේ කටයුතු වලදී පොලිස්පතිතුමාගේ පටන් සෑම සියලු දෙනාගේම ඉහළම සහයෝගය ලැබුනා. ජනවාරි 13 වැනි දා මධ්‍යම රාත්‍රිය වන විට ගලා එන්නට පටන් ගත් ඒ මහා ජනරැල්ල හමුවේ පොලිස්පති තුමාට කතා කළ වහා එතුමා එහි පැමිණියා. ගෝවේ සිට පැමිණි වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙන්න උත්සුක වුණා. මේ කාර්යයන් වලදී පොලීසියේ බෞද්ධ නිළධාරින් පවා අපේ පිළිවෙත් හා ක්‍රමයන් ගැන දැනුමක් ලබා ගෙන තමන්ට හැකි උපරිම මට්ටමින් සහය දැක්වූවා.

මේ කටයුත්තේ දී සා. ජෝශප්, සා. පීතර හා සා. බෙනඩික් විදුහල්වලින් ශිෂ්‍ය නායකයන් ලබාදෙන්න එහි අදියුරු පියතුමන් කාරුණික වුණා. ජාතික කතෝලික තරුණ සංගමය රටපුරා නියෝජනය වෙමින් සිය සාමාජිකයන් 200 ක් මේ කටයුතු සඳහා ලබා දුන්නා. මේ තරුණ පිරිස ජුනි 13 වැනිදා සවස 6.00 සිට පසුදා ශුද්ධෝත්තම පියතුමා ගාලුමුවදොර පිටියෙන් නික්ම යන තුරු නිදිවරාගෙන උපරිම සේවාවක් ඉටු කළා. ලක්ෂ 5 - 6 ක් වූ විශාල ජනතාවක් හසුරුවන්න කිසිසේත් ලේසි පහසු නැහැ. හැම දෙනාටම අවශ්‍ය වුණේ පාප් වහන්සේව වඩාත් සමීපයෙන් සිට දැක බලා ගන්න. ජනතාවගේ මේ එකම අපේක්ෂාව කල් ඇතිව හඳුනාගෙන ඉවසීමෙන් හා සහයෝගයෙන් කටයුතු කිරීමට සියලු දෙනාට උපදෙස් දී ඒ අනුව කටයුතු කිරීම නිසා බරපතළ ප්‍රශ්න හෝ ගැටලු මතුවුණේ නැහැ. "

## ප්‍රේමයේ පවතින්න

**අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමි**
කුරුණෑගල රදගුරු

# ප්‍රවාහන අමාත්‍යාංශය ඉටු කළ කාර්යය අනගිභවනීයයි

අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ සිරිලක සංචාරය සඳහා පිහිට වූ ප්‍රවාහන කටයුතු කමිටුව අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පත් කැරිණ. එහි ලේකම් ධුරයට සෙත් සරණ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා පත් වූ අතර සෑම රදගුරු වසමකින් නියෝජිත පියතුමකු ද, අගරදගුරු වසමෙන් නියෝජිත පියතුමන් පස් දෙනෙකු ද මේ කමිටුවට පත් කර ගත්හ. ඒ අනුව එම කමිටුව 17 දෙනෙකුගෙන් සමන්විත විය.

සසුන් පිය ලංකා ගමනේ දී මේ ප්‍රවාහන කමිටුවට ප්‍රධාන කර්තව්‍යයන් දෙකක් පැවරී තිබුණා. රටේ සිවු දිගින් කොළඹ බලා පැමිණෙන්නට සිටින ජනතාවට නිසි කලට, පහසුවෙන් ප්‍රවාහන පහසුකම් ලබා දීම එක් ප්‍රධාන කාර්යයක් මූලික සැලසුම් අනුව ලක්ෂ 4 ත් 4 1/2 ත් අතර පිරිසක් අගනුවර ගාලු මුවදොර පිටියට පැමිණෙන බව ගණන් බලා තිබුණා. මේ පිරිසට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීම සඳහා ලංගම බස්රථ වගේ ම දුම්රිය දෙපාර්තමේන්තුවෙන් දුම්රිය ලබා ගැනීමටත් කටයුතු සැලසුම් කෙරුණා.

මෙහිදී පැවති මූලික සාකච්ඡා වලින් පසු අමාත්‍යාංශය සෑම ප්‍රදේශීය ඒකකයකට එක් ප්‍රධාන නිලධාරියකු බැගින් ඒ ඒ ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පත් කර තිබුණා. ප්‍රවාහන කටයුතු කමිටුවේ සාමාජිකයන් 17 දෙනාව ඒ ඒ ප්‍රදේශ අනුව සම්බන්ධිකරණයට යොදා ගන්න තීරණය ගෙන ඒ අනුව කටයුතු කිරීම නිසා සියලු කටයුතු ඉතා පහසුවෙන් සිදුකරගන්න ලැබුණා. විශේෂ දුම්රිය තුනක් ලැබුණු අතර හලාවත - පුත්තලම සිට ඒවා ධාවනය කරන්න තීරණය කළේ ඒ ප්‍රදේශවලින් පැමිණෙන සැදැහැවතුන්ගේ පහසුව තකායි.

ශුද්ධෝත්තම පියතුමා මඩු සිද්ධස්ථානයට වැඩම කළ නිසා ඒ ප්‍රදේශවලින් ජනතාව නොපැමිණෙතැයි සිතුවත් රට පුරා සෑම තැනකින් සැදැහැවතුන් පැමිණ සිටියා. මේ නිසාම බදුල්ල - ගාල්ල - කුරුණෑගල - මහනුවර ඇතුලු රට පුරා සියලු ප්‍රදේශ වලින් දුම්රිය සේවා ක්‍රියාත්මක වුණා. මේ සියලු කටයුතු අමාත්‍යාංශය පාලනය කළා. ජනවාරි 14 වැනි දා පෙ.ව. 4.00 ට පෙර අගනුවරට පැමිණෙන්නට කටයුතු පිළියෙළ කළා.

මේ අතර ගරු පියතුමන් හා පැවිදි සොයුරියන් සඳහා කොළඹ සා. ජෝශප් විදුහලේ සිටත් - සම්මන්ත්‍රණ ශාලාවේ සිටත් පියතුමන්, පැවිදි සොයුරු සොයුරියන් 6000 කට ආසන්න පිරිසක් ප්‍රවාහනය කිරීම ද මේ කමිටුවට පැවරී තිබුණා. චෝගම් සමයේ මෙරටට ගෙනා සුඛෝපභෝගී බස් 20 ක් ද පෞද්ගලික බස් රථ 20 ක් ද මේ සඳහා යොදා ගත්තා. මේ අතර රදගුරු හිමිපාණන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා ටේවින්ග් ට්‍රැවල්ස් ආයතනය සුඛෝපභෝගී බස් රථයක් රියදුරු හා සහයකයන් සමඟ ලබා දී තිබුණා. මේ බස්රථ උපයෝගි කරගෙන දිව්‍ය සත්ප්‍රසාද බෙදා දීමේ දී කුඩ ඉහලන සහයක පිරිස් ඇතුලු සියලු පිරිස් කලට වේලාවට ප්‍රවාහනය කරන්නට හැකි වුණා. මෙහිදී ප්‍රවාහන කටයුතු කමිටුව දෙකට බෙදී මේ ස්ථාන දෙකේ කටයුතු ගැන සොයා බැලුවා. මේ බස්රථ ප්‍රවාහනයේ දී ආරක්ෂක රථයක්, බයිසිකලක් පෙරටු කරගෙන යෑම නිසා කටයුතු පහසු වුණා.

මේ කටයුතු වලදී ආරක්ෂක කමිටුවත්, ප්‍රධාන කමිටුව ඇතුළු බොහෝ දෙනෙක් අපට සහය වූ බව කෘතඥ පූර්වකව සිහිපත් කරන්නම ඕනෑ!

**අති උතුම් මැක්ස්වල් සිල්වා හිමි**
අගරදගුරු පදවි සහයක රදගුරු

## ස්වාගතම්!

| | |
|---|---|
| ආජෙන්ටිනාවේ කුමරෙකු ජනිත | උනා |
| නාදෙන් ඔරසමේ දෙව්ඳුන් මවිත | උනා |
| වාදෙන් සභාවේ හඬ සුවිශේෂ | උනා |
| ආමෙන් ජේසුනේ ඔබ යළි පහල | උනා |
| | |
| සුදු දුම් දසුන් වතිකන් ගුවනේ | දිලුනා |
| කිතු සත් දනන් තුඩ පැසසුම් හඬ | නැගුනා |
| යැදුමන් තුළින් දෙව්ඳුන් හට එය | ඇසුනා |
| ප්‍රැන්සිස් නමින් මනු පුත් අභිසෙස් | කැරුනා |
| | |
| ප්‍රොතෙස්තන්ත්‍ර 'ලාභය' පිනි බිඳක් | විනා |
| ඉදිකටු මලෙන් ඔටුවෙකු රිංගයි ද | මනා |
| ජී අට සමුළුවට ඔවදන් සපය | මිනා |
| කළු සිහ නදින් ලොව බලකනු සසල | උනා |
| | |
| ආදම් ශිවම් ගෞතම සිරි පා | රඳනා |
| සිව් මහ නදී හිස මුදුනෙන් ඇද | හැලෙනා |
| සමනල කන්ද ඔබ එනතුරු දින | ගණිනා |
| සිරි ලක විවිධමුත් ඒකීයව | දිලෙනා |
| | |
| එදා බුදු හිමි දුරුතු මස පුන් පෝ | දිනේ |
| මෙදා සුදු හිමි ජානුස් මස පොංගල් | දිනේ |
| එදා සඳමුත් ඇතේ නැවතත් යක් | විනේ |
| මුවින් අවිගෙන තැනින් තැන ගිනි බිඳි | මිනේ |
| | |
| කිතු බොදු හින්දු ඉස්ලාම් විදුලිය | එළියේ |
| මියැදුන නාසි හොල්මන් ඇත කල | එළියේ |
| සුදොවුම් පියා වැඩි පසු අපි හිරු | එළියේ |
| කුරුසිය කසිණයකි කැඳවන තුරු | දිවියේ |
| | |
| පිළිරූ වණන සිත් හරවා නිදොස් | කළා |
| තම රූ පිළිරුවද පොළොවෙන් ඉවත් | කළා |
| ජුසේවාස් ගොන්සල්වේස් පියවරු දිවැස් | හෙලා |
| ලක්දිව අසිරි ගන්වති ඔබ වඩිනු | බලා |
| | |
| ශාස්ත්‍රවන්තයින් බිළිඳා රැකි | සේම |
| අපි ඔබ රකිමු අළුකර | පාවාදීම |
| ඔබ අප රකින බව දන්නෙමු | ඉඳුරාම |
| සම්පත් බෙදා දිළිඳුන් සනසන | සේම |
| | |
| මංගලම් ජය මංගලම් | සුද්ධාසනේ |
| මංගලම් සුබ මංගලම් සාමය | ගෙනේ |
| මංගලම් වදනින් ආසිරි | විඳිමිනේ |
| ස්වාගතම් සුදොවුම් පියාණෙනි මතු | දිනේ |

**පූජ්‍ය කළහේ ඤාණාවාස හිමි**

# ගාලු මුවදොර සූදානම සාමූහික ප්‍රයත්නයක්!

අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ 2015 ලංකා ගමනේ සුවිශේෂී අවස්ථාව වූයේ භාග්‍යවන්ත ජුසේ වාස් තුමන් සාන්තුවරයට එසවීමයි. ජනවාරි 14 වැනි දා ගාලුමුවදොර පිටියේ පැවති විශේෂ දේව මෙහෙයේ දී සුදුතුම් පියාණන් විසින් ලංකාවේ අපෝස්තුළුවරයාණන් වූ භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට ඔසොවන ලදී. මේ නිසාම 2015 සසුන් පිය ලංකා ගමනේ සුවිශේෂී අවධානයක් ගාලු මුවදොර පිටිය වෙත යොමු වූ අතර අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා මෙරට දී පවත්වන එකම දිව්‍ය පූජාව මෙහිදී පවත්වන නිසා අති විශාල සැදැහැවතුන් පිරිසක් ඊට සහභාගි වීම නියත බැවින් ඒ සඳහා සූදානම් වීමට සියලු කටයුතු සංවිධානය කැරිණ.

2015 සසුන් පිය ලංකා ගමන ප්‍රධාන කමිටුවට අනුබද්ධව පිහිට වූ ගාලුමුවදොර පිටිය කමිටුවේ සභාපතිත්වය අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් දැරූ අතර එහි ලේකම් ධුරයට දකුණු කොළඹ කලාපීය නාහිමි අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා පත් විය. ගරු ප්‍රියන්ත සිල්වා පියතුමන්ගේ සැලසුමට අනුව අල්තාරය මණ්ඩපය, සසුන් පියා ජනතාව අතරට ගිය මැද පාර ආදිය ඉදි විය.

"අපේ කමිටුවට තමයි ප්‍රධානම කටයුත්ත පැවරුණේ මෙහිදී ප්‍රවාහන කමිටුව, ආධ්‍යාත්මික කමිටුව, පිළිගැනීමේ කමිටුව, මහජනයා හැසිරවීමේ හා ආරක්ෂක කටයුතු කමිටුව, සෞඛ්‍ය සේවා කමිටුව ආදී සියලු අංශ වලින් අපට සහය ලැබුණා. ගාලු මුවදොර පිටියේ ප්‍රධාන මංඩපයට අමතරව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවා තබන්නට යැදුම් කුටි 14 ක් ඉදි කළා. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ එහි වැඩමවා තිබුණා. ජනතාවට රැස්වන්නට කොටු සෑදීම, ජලය, වැසිකිලි, විදුලි බල ඇතුලු විවිධ පහසුකම් සම්පාදනය කළා. මෙහිදී වරාය අධිකාරිය, කොළඹ මහ නගර සභාව, විදුලි බල මංඩලය, ජල සම්පාදන හා ජලපවාහන මංඩලය, නාවික හමුදාව, ගුවන් හමුදාව, යුද හමුදා සෞඛ්‍ය සේවා ඒකකය, ජනාධිපති ආරක්ෂක අංශය මේ කටයුතු වලට දායක වුණා.

ජනවන්දනා සඳහා සංක්‍රිස්ති කාමරයක්, සසුන් පියාට වෙනම කාමරයක්, පියතුමන්ලා සඳහා විශේෂ ස්ථාන, වතිකානයෙන් මෙන්ම ඉන්දියාව ප්‍රමුඛ එතෙරින් වැඩම කළ කාදිනල් හිමිපාණන්, රදගුරු හිමිපාණන් සඳහා විශේෂ ස්ථාන, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීමේ දී කුඩ අල්ලන අය සඳහා ඒ අවට විශේෂ තැන්, සහභාගි වන පැවිදි පිරිස් සඳහා විශේෂ තැන් සමඟ ආබාධිත පිරිසක් අල්තාරය ඉදිරිපිට තබන්නට නියම වුණා. ආබාධිත අය 25 ක් ද, බිහිරි අය 40 ක් ද, මේ සඳහා යොදා ගත්තා. මේ අයට සංඥා භාෂාවෙන් දිව්‍ය පූජාව විස්තර කළා.

ජනවාරි 14 වැනි දා පෙ.ව. 4.00 ට ඩාර්ලි පාරේ මහලු නිවාසයේ සිට මේ අයව රැගෙන විත් අදාළ තැන්වලට යොමු කළා. මේ අතර වතිකාන මාධ්‍යවේදීන්ට ඡායාරූප ගැනීම සඳහා විශේෂ ස්ථානයක් සකස් කර දෙන්න වුණා. අපේ මූලික සාකච්ඡා වලදී සහභාගි වන පිරිස ලක්ෂ 2 1/2 කට වැඩිවෙතැයි අනුමාන කළත් අවසානයේ දී ලක්ෂ 6 ක් වූ තිබුණා.

මේ සියල්ල මැද සියලු කටයුතු මැනවින් සංවිධානය වී සාර්ථක වුණා. ඉතිහාසයේ වැඩිම පිරිසක් එකම ස්ථානයකට එක්රැස්වූ දිනය ලෙස මෙදින ඉතිහාසයට එක්වුණා. මෙහිලා අපට සහය වූ සෑම සියලු දෙනාටම තුති පුදන්න මං සතුටුයි.

**අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමි**
අගරදගුරු පදවි සහයක රදගුරු

# කාලාවරණ නියෝග මැද සසුන් පිය දෙසුම් සිංහල පාඨකයන්ට ගෙන ඒමට කළ යුද්ධය

**ශිරාන් මෛත්‍රි**



## ප්‍රේමයේ පවතින්න

මෙරටට සැපත් වූ තෙවන සසුනිසුරාණන් වූ අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පිය ලංකා ගමන නිමා වී මාසයක් ගත වී ඇත. එදා 1970 දෙසැම්බර් 04 වැනි දා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණි අති උත්තම සවැනි පාවුළු සසුන් පිය ගමනත්, ඉන් විසි පස් වසරකට පසු 1995 ජනවාරි 20, 21 දිනවල මෙරටට සැපත් වූ අති උතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පිය නිල චාරිකාවත්, ඊට විසි වසරකට පසු 2015 ජනවාරි 13 සිට 15 දක්වා මෙරට ගත කළ අති උතුම් ප්‍රැන්සිස් සසුන් පිය ලංකා ගමනත් දෙස නෙත් යොමද්දී වසර (හරියටම නම් පනහකට අඩු කාල සීමාවක් තුළ දී වසර 44 ක් තුළ) ශුද්ධෝත්තම පියතුමන් තෙනමක් මෙරටට වැඩම කරන්නට තරම් මේ ලක්බිම වාසනාවන්ත වී තිබේ.

බහුතරය බුදුනුවන් වූ මේ පින්බිමේ ප්‍රමාණය ද ඉතා කුඩා වන අතර ඒ සියල්ල මැද මෙවන් සුවිශේෂී වරමක් ලබන්නට තරම් මේ ලක්බිමත්, එහි වෙසෙන ජනතාවත් වාසනාවන්ත වී සිටිති. එය හුදු වාසනාවන්ත බවකටත් වඩා කිතුනු විශ්වාසය තුළ සලකා බලන කල්හි අමිල දේව වරප්‍රසාදයක් ලෙස හඳුන්වා දීම වඩාත් නිරවද්‍ය වේ. 265 වැනි විශ්වීය එඬේරාණන් වූ අති උතුම් සොළොස්වන බෙනඩික් හිමිපාණන් සිය වියපත් බව නිසාම ඉසිඹු ලබන්නේ යැයි කළ ප්‍රකාශයෙන් මුළු ලෝකයම එකවර වතිකානය වෙත හැරී නතර වූවාක් මෙන් විය. ඒ වනවිට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වසර 50 කට පමණ පසු මෙරට දෙවන කාදිනල් හිමිපාණන් ලෙස අබිසෙස් ලබා සිටීම නිසා 266 වැනි විශ්වීය එඬේරාණන් තෝරා පත්කර ගැනීමේ සසුන් පිය නිලවරණයට සහභාගි වීමේ විරල වරම හිමිකර ගත්තේ ය. මෙරට මුල්ම කාදිනල් හිමිපාණන් වූ අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ට පසු සසුන් පිය නිලවරණයකට එක්වන්නට වරම් ලත් ලංකා පුත්‍රයා වූයේ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ය.

2013 පෙබරවාරි 28 වැනි දා අති උතුම් සොළොස්වන බෙනඩික්ට් හිමිපාණන් විශ්‍රාම ලබා නික්ම යෑම නිසා සසුන් පිය නිළවරණය සඳහා සියලු කටයුතු පිළියෙළ කරන්නට ශුද්ධාසනය උත්සුක විය. ලොව කතෝලික කාදිනල් සංසදයේ කාදිනල් හිමිපාණන් අතර මීළඟ විශ්වීය සසුන් නායකයා තෝරා ගැනීමට සසුන් නීතිය අනුව වරම් ලැබූයේ වයස අවුරුදු 80 ට අඩු කාදිනල් හිමිපාණන්ට පමණි. ඒ අනුව ලොව වටා කාදිනල් හිමිපාණන් 117 නමක් ඒ සඳහා සුදුසුකම් ලබා සිටියහ. කෙසේ වෙතත් අවසානයේ දී 2013 සසුන් පිය නිළවරණයට සහභාගි වූයේ වයස අවුරුදු 80 ට අඩු කාදිනල් හිමිපාණන් 115 නමක් පමණි.

2013 මාර්තු මස ඇරඹි සසුන් පිය නිළවරණයේ දී 2013 මාර්තු 13 වැනි දා ආර්ජන්ටිනියාවේ බුවනෝර්ස් අයර්ස් අගරදගුරු අති උතුම් හෝර්හේ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිමිපාණෝ අති උතුම් ප්‍රැන්සිස් නමින් 266 වැනි විශ්ව සසුන් එඬේරාණන් ලෙස පත් වූහ. එකී නිලවරණයට සහභාගි වූ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් නව සසුන් පියාණන්ට සුබ පතමින් සිය පක්ෂපාතිත්වය පළ කරන මොහොතේ දී ම සිරිලකට වැඩම කරන්නැයි ඇරියුම් කරන ලදි. මේ සුහද ඇරියුම පසුව සසුන් චාරිත්‍රානුකූලව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයෙන් කැරෙන නිල ඇරියුමක් ද, රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් පැවැති රජය මඟින් ඉදිරිපත් කරන ලද නිල ඇරියුමකින් ද වඩ වඩාත් ශක්තිමත් විය. 2013 වසර අග භාගයේ දී සසුන් පිය ලංකා ගමන ගැන විවිධ ආරංචි පැතිර යන්නට වූ නමුත් ඒ පිළිබඳ නිල නිවේදනයක් නිකුත් නොවීම නිසා එය ස්ථිර කරන්නට හැකියාවක් තිබුණේ නැත. විශේෂයෙන් 2014 වසරේ දී අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා සිය ප්‍රථම ආසියා චාරිකාව දකුණු කොරියාවට යොදා ගනිද්දී ඒ හා සමගාමීව ශ්‍රී ලංකාවට පැමිණේ දැයි විමසුම් කැරුණත් ඒ බව තහවුරු කරන්නට කිසිදු සාක්ෂියක් සොයා ගන්නට හැකි වූයේ නැත. මේ අතර 2013 නොවැම්බර් මාසය වන විට අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා 2015 ජනවාරි මාසයේ සිය පිලිපීන සංචාරය හා සමගාමීව ශ්‍රී ලංකාවට වැඩම කරන බවට නිල නොලත් එහෙත් විශ්වාසය තැබිය හැකි තොරතුරු ලැබෙන්නට විය. ඉතාලියේ ශ්‍රී ලාංකික කතෝලික ශ්‍රම සංක්‍රමිකයන්ගේ මාසික සිංහල පුවත්පත වූ "සදහම් දැක්ම" පත්තරයේ මුල් වරට මේ පිළිබඳව පළවිය. 2014 පෙබරවාරි මාසයේ දී ඉතාලියේ ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමිකයන් අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියා හමුවන ශ්‍රී ලාංකික හමුවක් වතිකානයේ සාන්ත පීතර චතුරස්‍රයේ දී පැවැති අතර එහිදී මුල්වරට සුදුතුම් පියාණන් විසින්ම 2015 දී සිය ශ්‍රී ලංකා චාරිකාව පිළිබඳව අනාවරණය කරන ලදි. මේ පුවත ලොව වටා පැතිර යන්නට පටන් ගත් අතර ශ්‍රී ලංකාවේ මාධ්‍යයන්ට ද අපූරු පුවතක් විය. 2015 සසුන් පිය ලංකා ගමන ඉලක්ක කරගෙන සභාව සංවිධාන කටයුතු ආරම්භ කළ අතර ඊට රජයේ සහයද නොමඳව ලැබිණ. මේ අරබයා විවිධ කමිටු ගණනාවක් ආරම්භ වූ අතර ඒ ඒ කමිටු ස්වකීය විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් කටයුතු සංවිධානය කරන්නට උත්සුක වූ බවක් දක්නට ලැබිණ. සන්නිවේදන ජාතික අධ්‍යක්ෂ ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා සසුන් පිය ලංකා ගමනේ මාධ්‍ය කටයුතු අධ්‍යක්ෂ වශයෙන් ද පත් වූ අතර එතුමන් යටතේ රූපවාහිනි, ගුවන් විදුලි, මුද්‍රිත මාධ්‍ය, සමාජ මාධ්‍ය ආදි අනු කමිටු ගණනාවක් ක්‍රියාත්මක විය. ඥානාර්ථ ප්‍රදීපය කර්තෘ ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාගේ මෙහෙයවීමෙන් මුද්‍රිත මාධ්‍ය කමිටුවත්, පරිවර්තන කමිටුවත් ක්‍රියා කළේය. මුද්‍රිත මාධ්‍ය කමිටුව සිංහල, ඉංග්‍රීසි, දෙමළ භාෂා ත්‍රිත්වය අනුව අනුකමිටු තුනකට වෙන් වූ අතර සිංහල මුද්‍රිත මාධ්‍ය කමිටුව ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි, ශිරාන් මෛත්‍රි, මොරිස් බොල්ලෑගල, කැලිස්ටස් ජයමාන්න, ලෙනාඩ් කුරේ, පීටර් කැනියුට් පෙරේරා, සී. ආර් ඩික්සන් ඇන්ටනි ඇතුලු පිරිසකගෙන් සමන්විත වූහ. මේ අතර සසුන් පිය ලංකා ගමනට මාස 06 කට පමණ පෙර පටන් කොළඹ කතෝලික මුද්‍රණාලයේ ඥානාර්ථ ප්‍රදීපය කර්තෘ මණ්ඩලයේ විශේෂ තොරතුරු ගබඩාවක් ක්‍රියාත්මක වූ අතර මොරිස් බොල්ලෑගල හා ලෙනාඩ් කුරේ සතිපතා පැමිණ සසුන් පිය ලංකා ගමන හා බැඳි තොරතුරු පුවත්පත් වල පළ වී ඇති ආකාරය නිරීක්ෂණය කරමින් ඒ තොරතුරු එක්රැස් කරන්නට වූහ. මේ අතර සසුන් පිය ලංකා ගමන හා සමගාමීව ලේඛකයන්ට හා මාධ්‍යවේදීන්ට කතෝලික බස් වහර හා යෙදුම් නිවැරැදිව යොදා ගැනීම සඳහා සිංහල, ඉංග්‍රීසි හා දමිළ භාෂා ත්‍රිත්වයෙන්ම අත්පොත් තුනක් නිකුත් කරන්නට කටයුතු යෙදූ අතර එහි සිංහල අත්පොත සකස් කරන්නට වෙහෙසුනු ෆිලීෂන් අබයකෝන් සූරින් සිහිපත් කළ යුතුමය.

මීට අමතරව මෙරට පුවත්පත් මාධ්‍යවේදීන් සඳහා බෙදා දුන් මාධ්‍ය කට්ටලයන් ඇතුළත් කරන්නට සිංහල බසින් සසුන් පියා ගැන භාග්‍යවන්ත ජුසේවාස් තුමන් ගැන සසුන් පිය ධුරය ගැන ඇතුලු විවිධ විෂයයන් යටතේ ලියැවුනු ලිපි සම්පාදනය කරන්නට ද සිදු විය. ඒ බොහොමයක් ලිපි මෙරට ජාතික පුවත්පත්වල පළ වී ඇති අයුරු පසුව දැකගන්නට ලැබිණ.

මේ සියලු කටයුතු සිදු කරන්නට සිද්ධ වූයේ සතියේ සාමාන්‍ය රාජකාරී සමඟිනි. ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ කටයුතු ඉෂ්ඨ සිද්ධ කරමින්ම, සෙසු මාධ්‍ය අවශ්‍යතාවන් සපුරාලන්නටත්, විවිධ රැස්වීම් හා සාකච්ඡාවාරයන්ට සහභාගි වීමටත් සිදු වූයේ කටයුතු අතිශයින් කාර්යබහුල කරමිනි. මේ අතර සසුන් පිය ලංකා ගමන සඳහා දින වකවානු ළං වෙද්දී ලැබෙන ඇමතුම්, ඉල්ලීම්, ආයාචනා බහුල විය. බොහෝ විටෙක සිය අතිරේකයට ලිපි ලබා දෙන ලෙස කළ ඉල්ලීම් හැකි ශක්ති ප්‍රමාණයෙන් සපුරාලන්නටත්, ඒවා බෙදා හදාගෙන සිදු කරන්නටත් වෑයම් කැරිණ. මේ අතර ඇතැම් අවස්ථාවල ලිපි දෙන්නම් යැයි පොරොන්දු වී ඒවා "කඩවුණු පොරොන්දු" බවට පත්වීම නිසා අසීරු තත්ත්වයන්ට මුහුණ පා සිටි ජාතික මාධ්‍ය සගයන්ගේ බැගෑබර ඉල්ලීම් සපුරාලීමේ දුෂ්කර අභියෝගයන් ජයගැනීමට ද බල කරනු ලැබිණ. සිය පුවත්පත නිකුත් කරන සසුන් පිය වර්ණ ඡායාරූපය සඳහා හොඳ තත්ත්වයේ ඡායාරූපයක් ලබා දෙන්නැයි කරන ඉල්ලීම් හමුවේ "වතිකාන නිල ඡායාරූප ශිල්පීන් බවට පත්වීමේ අසීරු ඉලක්කයන් ජයගැනීමට ද සිදුවිය. ඒ සියල්ලේ දී මට හැඟෙන පරිදි අපගේ ශක්තීන් පණ ගැන් වූයේ දේවාශිර්වාදය පෙරටු කරගත් ශුද්ධාත්ම බලයෙන් ය.

2014 ඥානාර්ථ ප්‍රදීපය නත්තල් කලාපය නිමකර යළි රාජකාරී අරඹන්නට සිදු වූයේ ජනාධිපතිවරණ උණුසුම මැදය. ඉන්පසු සසුන් පිය විශේෂ කලාපයයි. මේ සියල්ලටත් වඩා දුෂ්කරම කාර්යය වූයේ 2015 ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්වීමත් සමඟ සසුන් පිය ලංකා ගමන සිදුවේදැයි සතර අතින් මතු වූ විමසුම් ය. නිල වශයෙන් සසුන් පිය ලංකා ගමන අවලංගු වී නැතැයි කීවද ඇතැමෙකුට එය ප්‍රමාණවත් නොවීය. සිය මතවාදයන්, තක්සේරුගත තත්ත්වයන් හා මවා ගත් ප්‍රචණ්ඩත්වයන් ඔස්සේ ඔවුහු ස්වකීය මතයේ සිටිමින් සසුන් පිය ලංකා ගමන අවලංගු කරන්නට පිඹුරු පත් සකස් කළහ. ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයත්, අගරදගුරු හිමිපාණන් ඇතුළු වගකිව යුත්තන් මොනවා කීවත් ඒවා නෑසූ කණින් යුතුව සිටි ඇතැමෙක් සසුන් පිය ලංකා ගමන අවලංගු කරන්නට පෙත්සම් අත්සන් කරන්නට පවා යුහුසුළු වූහ. මේ සියලු තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ සභාපති අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සමඟ මේ තත්ත්වය අළලා සම්මුඛ සාකච්ඡාවක් පවත්වා මේ ගැන රටට අනාවරණය කරන්නට පියවර ගත්තේ ය. 2015 සසුන් පිය ලංකා ගමන හා සමගාමීව පරිවර්තන කමිටුව සතුව වගකීම් රැසක් පැටවී තිබිණ. ඉංග්‍රීසි සිංහල පරිවර්තන කමිටුව ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාගේ මෙහෙයවීමෙන් රොහාන් ලියනගේ හා ශිරාන් මෛත්‍රිගෙන් සමන්විත වූ අතර නිවැරැදිව, කඩිනමින් පරිවර්තන සිදුකිරීමේ අභියෝගයක් මතුව තිබිණ. 2015 සසුන් පිය ලංකා ගමනේ මාධ්‍ය මධ්‍යස්ථානය කොළඹ ගාලුමුවදොර මහ හෝටලයේ පිහිටුවා තිබූ අතර එහි උඩුමහලේ විශේෂ කාමරයක සිංහල මෙන්ම දමිළ පරිවර්තන කමිටු සඳහා වෙන්කර තිබුණි. මෙහිදී වඩාත් බරපතළ අභියෝගය වූයේ සසුන් පිය දෙසුම් සිංහල බසට පරිවර්තනය කර කලට වේලාවට නිකුත් කිරීමයි. විශේෂයෙන් ශුද්ධාසනයේ පිළිවෙත් අනුව සසුන් පිය දෙසුම් කාල ආවරණයකට (EMBARGO) යටත්ව ලබා දෙන අතර අදාළ කාල සීමාවේ දී අත පත්වන දෙසුම කියවා, මැනවින් අවබෝධ කරගෙන වඩාත් නිවැරැදිව, සරල හා සිංහල පාඨකයාට පහසුවෙන් අවබෝධ කර ගැනීමට හැකිවන පරිදි පරිවර්තනය කර පසුව යතුරු ලියනය කර, පිටපත නිවැරැදි කිරීමෙන් පසු පොටෝ කොපි යන්ත්‍රයෙන්, අවශ්‍ය කරන පිටපත් ලබා ගෙන මාධ්‍ය මධ්‍යස්ථානය කරා යැවිය යුතුය. යතුරු ලියන කටයුතු සඳහා කොළඹ කතෝලික මුද්‍රණාලයේ සේවය කරන ලතා ප්‍රනාන්දු හා ක්‍රිෂාන්ති පෙරේරා සිංහල බසින් ද, සුනන්දා ස්තෙම්බු ඉංග්‍රීසි බසින් ද, සෙරෝෂිනි ක්ෂේවියර් දමිළ බසින් ද සහය වූහ.

2015 ජනවාරි 13 වැනිදා පෙ.ව. 7.30 වන විට ගාලුමුව දොර හෝටලය කරා පැමිණීම සඳහා "කුකුළා අතින් ගෙන" නිවෙස් වලින් පිටත් වන්නට වූ අතර ආපසු එදින නිවෙස් බලා යද්දී මැදියම් රෑ බෝ වී තිබිණ. පසු දිනයේ දී කලින් දිනයටත් පෙර පැමිණෙන්නට සිදු වූයේ ගාලුමුවදොර පිටියේ පැවැත්වෙන දේව මෙහෙයට මාර්ග වසා තැබෙන නිසාවෙනි. එදින පෙ.ව. 7.00 වන විට කුටියට වැදුනු අපට දිව්‍ය පූජාවට සහභාගි වන්නට නොලැබුණේ වඩාත් වැදගත් කාරියක් මුළු රට වෙනුවෙන් සපුරා ලන්නට තුබූ නිසාවෙනි. ගාලුමුවදොර පිටියේ පැවති භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට එසැවීමේ ඓතිහාසික දේව මෙහෙයේදී අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියාණන් කළ දෙසුමත්, සෙසු දෙසුම් ද දේව මෙහෙය අවසන් වී මාධ්‍යවේදීන් ගාලුමුවදොර හෝටලයේ මාධ්‍ය මධ්‍යස්ථානයට පැමිණෙන මොහොත වන විට ඔවුනට ලබා දෙන්නට අපි කැප වුනෙමු.

අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් 2015 ජනවාරි 13 වැනි දා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් ලක්බිමට පා තැබූ අවස්ථාවේ සිට සිදුකළ සියලු කතාවන් ද, අගරදගුරු හිමිපාණන්, රදගුරු හිමිපාණන් පැවැත් වූ විවිධ කතාවන් ද, කලට වේලාවට පරිවර්තනය කිරීමේ දුෂ්කර අභියෝගය අවසානයේ අපි ජය ගත්තෙමු. ඒ නිසාම 2015 සසුන් පිය ලංකා ගමන නිමා වූයේ දාහය හා වෙහෙස නිවාලූ අපූරු ආත්ම තෘප්තියක් ගෙන දෙමිනි.





## ප්‍රේමයේ පවතින්න

# මඩු පුදබිමට මුල්වරට සුදුතුම් පියාණන් නමක සපැමිණි ඓතිහාසික ගමන

අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියාගේ සිරිලක් චාරිකාවේ මරුද මඩු පුදබිම කරා යන ගමන කොයි කාගේත් අවධානයට ලක් වූවකි. 2014 ජුනි 29 වැනි දා අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වතිකාන නියෝජිත පිරිසක් සමග මරුද මඩු කඳවුරට පැමිණියහ.



2015 ජනවාරියේදී සසුන් පිය ලංකා ගමන හා සමගාමීව අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාට මඩු කඳවුරට පැමිණීමේ ශක්‍යතා අධ්‍යයනය කිරීමට වතිකාන නියෝජිත පිරිස එහි ගියහ. ඒ වන විට ජූලි 02 වැනි දා පැවැත්වෙන මඩු මාතා මංගල්‍යයට සහභාගි වීමට පැමිණ සිටි සිංහල හා දමිළ වන්දනාකරුවෝ වාඩි ගසා ගෙන කඳවුරේ සාමකාමී ලෙස ගත කළහ. ප්‍රදේශයේ වටපිටාව ගැන සෑහීමට පත්ව සිටි වතිකාන නියෝජිත පිරිස වන්දනාකරුවන් දැකීමෙන් ඉමහත් සතුටට පත් වූහ. ඒ අනුව මන්නාරම රදගුරු අති උතුම් රායප්පු ජෝශප් හිමිපාණන් මඟින් සසුන් පිය මඩු චාරිකාව ස්ථිර කරන ලදී.

මරුද මඩු කඳවුරට සසුන් පියා පිළිගැනීමේ වැඩ පිළිවෙළ සඳහා යාපනය, අනුරාධපුරය, මඩකලපුව හා ත්‍රිකුණාමලය රදගුරු වසම් ද මන්නාරම රදගුරු වසම සමඟ අත්වැල් බැඳගත්හ. ශුද්ධෝත්තම පියතුමා මඩු කඳවුර බැහැදැකීමට යෑමේ හේතු කාරණා වූයේ උතුරු නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් ජනතාව දිරිගන්වා ඔවුනට තවත් අයකු ඇතැයි යන හැඟීම ලබා දීමත්, සාන්ත ජුසේවාස් මුනිතුමා මුලින්ම මන්නාරමෙන් ගොඩ බැස මඩු පල්ලිය හරහා මහනුවරට ගිය අන්දම සිහිපත් කිරීමත් ය. ශුද්ධෝත්තම පියතුමා මේ ගැන අවදියෙන් ඇනුම්වත්ව සිටි අයුරු එතුමාගේ දෙසුමෙන් පැහැදිලි විය.

2015 ජනවාරි 01 වැනිදා සිට සසුන් පියා පිළිගැනීමට විශේෂ වැඩසටහනක් දියත් වූ නමුදු පුරා මාස එකහමාරකට වැඩි කාලයක් ප්‍රදේශයේ පැවැති අධික වර්ෂාව ගංවතුර තත්ත්වයක් උද්ගත වීමටත්, මඩු හා අවට ප්‍රදේශවල ජනතාව අවතැන් වීමටත් හේතු සාධක විය. මේ වර්ෂාවත්, ගංවතුරත් නිසා මඩු කඳවුර හා අවට ප්‍රදේශයේ ජනතාවට නවාතැන් ගැනීමට නොහැකි තරමට තෙත් බරිත වී මඩ වලින් පිරී පැවතිණි. කෙසේ වෙතත් දැඩි වර්ෂාව තුරන් වීමෙන් පසු දේවස්ථානය හා අවට ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන්නට පටන් ගැණින. සසුන් පිය ගමන සඳහා හෙලිකොප්ටර් අංගනයක් ගොඩ නැගීම අත්‍යවශ්‍ය කටයුත්තක් වුවද අධික වර්ෂාව නිසා එය අසීරු ඉලක්කයක් බවට පත්වෙමින් තිබිණ. කෙසේ වෙතත් දේව ආශිර්වාදයෙන් ඒ කටයුතු බාධාවකින් තොරව නිමා කරගන්නට හැකිවිය.

ජනවාරි 14 වැනි දා ප.ව. 3.15 වෙද්දී අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් රැගත් හෙලිකොප්ටර් යානය ළඟා විය. ඒ වන විටත් එහි ළඟා වී සිටි මන්නාරම රදගුරු හිමිපාණන් විසින් සුදුතුම් පියාණන්ව පිළිගන්නා ලදි. රදගුරු පදවි නියෝජනය කරමින් නියෝජිතයන් 17 දෙනෙකු විසින් එතුමාව පිළිගන්නා ලද අතර ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ එකමුතුව එමඟින් නිරූපණය කරන ලදි. යුද්ධයෙන් පීඩාවට පත් වූ දරුවන් දෙදෙනකු මල් මාල පළඳවා සසුන් පියාණන්ව පිළිගත් අතර විවෘත රියේ නැගුණු අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන් ජනතාව හමුවන්නට ගිය අතර දෙදහසකට අධික දරු දැරියෝ කොඩි වනමින් එතුමන්ට ආචාර කළහ. ශුද්ධෝත්තම පියතුමා ජනතාව ආසිරි ගන්වමින් ද, ඇතැම් අවස්ථාවන්හි දරුවන් හා මහළු පුද්ගලයන් වැළඳ ගනිමින් ද පැමිණෙද්දී සිද්ධස්ථාන පාලක ගරු සන්තියාපිල්ලේ එමලියානුස්පිල්ලේ පියතුමා මල් මාලාවක් පළඳවා එතුමන්ව පිළිගත්තේ ය.

ඉන්පසු සසුනිසුරාණෝ යුද්ධයෙන් පීඩාවට පත් වූ හා ආබාධිත වූ පිරිස් ආසිරි ගැන් වූහ. දෙව්මැඳුරට ඇතුළුවන මණ්ඩපය ඉදිරිපිට දී බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික ආගම් නියෝජනය කරමින් දරුවන් 8 දෙනෙක් සසුන් පියාණන්ට සුබ පැතූහ.

සම්ප්‍රදායානුකූල පොල් තෙල් පහන දැල්වීමෙන් පසු අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා සුදු පැහැති පරවියකු අහසට මුදා හැරියේ සාමය සංකේතවත් කරමිනි. මන්නාරම රදගුරු අති උතුම් රායප්පු ජෝශප් හිමිපාණන් පිළිගැනීමේ කතාව සිදු කිරීමෙන් අනතුරුව සිංහල හා දමිළ භාෂා වලින් මිනිත්තු 20 ක ජනවන්දනා මෙහෙයක් පැවැත්විණ. එහිදී ශුද්ධෝත්තම පියතුමා කෙටි දෙසුමක් පැවැත් වූ අතර ඉන් අනතුරුව උන්වහන්සේ සිය අපෝස්තලික ආශිර්වාදය පිරිනැමූහ. ඉන් අනතුරුව සසුන් පියා මරුද මඩු මාතා ආශ්චර්යවත් ප්‍රතිමාවෙන් ජනතාව ආසිරි ගැන්වූහ.

ආශ්චර්යවත් මඩු මාතා ප්‍රතිමාවේ අනුරුවක් ලෙස ලීයෙන් නිර්මාණය කළ දේව මාතා ප්‍රතිමාවක් සිද්ධස්ථාන පාලක ගරු සන්තියාපිල්ලේ එමලියානුස් පිල්ලේ පියතුමා සසුන් පියා වෙත පිරිනැමූ අතර උන්වහන්සේ මහත් භක්තියෙන් හා සතුටින් එය භාර ගත්හ. මඩු සිද්ධස්ථානයේ ප්‍රධාන දෙව්මැඳුර පසෙකින් ඉදි වූ දිව්‍ය සත්ප්‍රසාද දෙව්මැඳුර අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් විසින් ආසිරි ගන්වා විවෘත කරන ලදි. එදින ප.ව. 4.30 ට පමණ සසුන් පියාණන් මඩු සිද්ධස්ථානයෙන් සමුගෙන කොළඹ බලා එන්නට පිටත් වූහ.

මරුද මඩු සිද්ධස්ථානයේ සසුන් පිය ගමන සංවිධානය සඳහා පිහිටු වූ කමිටු

★ ජනවන්දනා කමිටුව - ගරු එස්. කේ. දේවරාජා පියතුමා (මඩු සිද්ධස්ථානයේ ආගමික මෙහෙය, ආධ්‍යාත්මික සූදානම් කමිටුව) ★ ප්‍රචාරක කටයුතු සහ මාධ්‍ය කමිටුව - ගරු රෙජිනෝල්ඩ් පියතුමා ★ රථවාහන පාලනය, මහජනතාව පාලනය සහ ආරක්ෂක කමිටුව - ගරු එස්. ජෙයබාලන් පියතුමා ★ ප්‍රවාහන කමිටුව - ගරු වසන්තකුමාර් පියතුමා ★ සෞඛ්‍ය සේවා කමිටුව - ගරු ඩෙස්මන් කුලාස් පියතුමා, ගරු ස්ටැනි නි.ම.නි. පියතුමා ★ සැරසිලි කමිටුව - ගරු බෙනෝ ඇලෙක්සැන්ඩර් පියතුමා ★ ආබාධිත පුද්ගලයන්ට නවාතැන් සැපයීම - ගරු අරුල් රාජා පියතුමා, ගරු ජෙයබාලන් කෘස් පියතුමා ★ සංග්‍රහ කමිටුව - ගරු මාකස් පියතුමා ★ නවාතැන් කමිටුව - ගරු පෙප්පි සූසෙයි පියතුමා, ගරු අවිතාප්පර් පියතුමා ★ ජලය සහ සනීපාරක්ෂක කමිටුව - ගරු ඒ. සෙබමාලෙයි පියතුමා ★ මූල්‍ය කමිටුව - අනුනායක අතිගරු වික්ටර් සූසෙයි පියතුමා, ගරු එස්. එමලියානුස්පිල්ලේ පියතුමා

# සසුන් පිය ලංකා ගමනේ දී ආරක්ෂක අංශ ක්‍රියා කළ අන්දම

අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධව පොලිස් රාජකාරි සංවිධානය කිරීම ආරම්භ වූයේ සංචාරයට මාස 3 1/2කට පෙර 2014 සැප්තැම්බර් මස 01 වන දින පටන්ය. සැප්තැම්බර් 01 දින පොලිස් මූලස්ථානයේ ශුද්ධෝත්තම පාප්වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධව ලේකම් කාර්යාලයක් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ප්‍රියන්ත ජයකොඩි මහතා අධ්‍යක්ෂක ලෙස පත් කරමින් ආරම්භ කැරිණි. ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධව අගරදගුරු මැදුර, මන්නාරම මඩු සිද්ධස්ථානය, වතිකාන ආරක්ෂක නිලධාරින්, සංචාරයට සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතන හා ත්‍රිවිධ හමුදා සම්බන්ධිකරණය කිරීම ලේකම් කාර්යාලයේ ප්‍රධාන වගකීම විය.



මේ සම්බන්ධිකරණ කාර්යාලයේ සියළුම රාජකාරි කටයුතු පොලිස්පති එන්. කේ. ඉලංග කෝන් මහතාගේ සෘජු අධීක්ෂණය යටතේ පැවතුනි. පොලිස්පති තුමා හා කාදිනල් හිමිපාණන් ඇතුළු කතෝලික සභාවේ බලධාරීන් සමඟ ප්‍රථම සාකච්ඡාව පැවතියේ 2014 සැප්තැම්බර් 05 වන දිනයි. එම දිනයේ සිට ශුද්ධෝත්තම පාප් වහන්සේගේ සංචාරය අවසන් වන තුරු සාකච්ඡා වාර 05 කට වැඩි සංඛ්‍යාවක් පැවැත්වී ඇත.

ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරයේ ප්‍රධාන පොලිස් රාජකාරි කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් 05 දෙනෙකු යටතට ගැනුණි. මෙයින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති / පරිපාලන ගාමිණී නවරත්න මහතා සංචාරයේ පොලිස් රාජකාරි පිළිබඳ සියළුම මූල්‍ය පරිපාලනය සහ ප්‍රවර්ධන අවශ්‍යතාවන් භාරව කටයුතු කළ අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විශේෂ ආරක්ෂණ දිසාව එස්.එම් වික්‍රමසිංහ මහතා පාප් වහන්සේගේ සියළුම ආරක්ෂක කටයුතු භාරව පත් කර තිබුණි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා කටුනායක සිට කොළඹ බලා පැමිණෙන ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ගමන් මගෙහි ආරක්ෂක කටයුතු සහ විශේෂයෙන් ජනවාරි 14 වන දින ගාළුමුවදොර පිටියේ පැවති දිව්‍ය පූජාවේ ආරක්ෂක කටයුතු බාරව කටයුතු කළ අතර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා මඩු සිද්ධස්ථානයේ උත්සවය බාරව කටයුතු කළේ ය.

පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 23000 ක් රාජකාරියේ යොදවනු ලැබූ අතර මෙය මෑත කාලයේ දී පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන රාජකාරි අතර ප්‍රමුඛත්වයෙහිලා ගැනුණි. සසුන්පිය ශ්‍රී ලංකා සංචාරයේ ආරක්ෂක රථවාහන සහ මහජනතාව හැසිරවීමේ කමිටුවේ සභාපති ලෙස පත් කර සිටි අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා කුරුණෑගල රදගුරුතුමා ඇතුළු සියළුම පොලිස් රාජකාරි සඳහා විශාල සහයෝගයක්

**ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි**
**ප්‍රියන්ත ජයකොඩි මහතා**

දක්වනු ලැබුවේය. පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය සූදානම් කිරීම සඳහා වතිකාන ආරක්ෂක බලධාරීන් තුන් වතාවක් ශ්‍රී ලංකාවට පැමිණ ඇත.

පාප් වහන්සේගේ විදේශ කටයුතු භාර ආචාර්ය ගස්පාරි 2014 නොවැම්බර් මස 03 වන දින ශ්‍රී ලංකාවට පැමිණ සියළුම ආරක්ෂක කටයුතු පරීක්ෂා කර වතිකානයට ඒ සම්බන්ධව වාර්තා කළ අතර, දෙසැම්බර් 03 වන දින ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ආරක්ෂක කටයුතු ප්‍රධානියා වන ආචාර්ය ඩොමිනිකෝ ගිහානි මහතා ඇතුළු ආරක්ෂක නිලධාරීන් පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ සියළුම ආරක්ෂක කටයුතු දින 05ක් පුරාවට පරීක්ෂා කරනු ලැබූහ. මෙම කණ්ඩායම මඩු සිද්ධස්ථානය ඇතුළු ශුද්ධෝත්තම පාප් වහන්සේගේ සංචාරයට අදාළ සියළුම ස්ථානයන් ඉතා සියුම් පරීක්ෂාවට ලක් කරනු ලැබූ අතර විශේෂයෙන් පාප් වහන්සේ කටුනායක සිට කොළඹ බලා සහ මඩු සිද්ධස්ථාන භූමිය තුළ ගමන් ගත් විශේෂ ජීප් රථ දෙක පවා ඔවුන්ගේ සියුම් පරීක්ෂාවට ලක් විය.

අවසාන වතිකාන ආරක්ෂක නියෝජිත පිරිස ශ්‍රී ලංකාවට පැමිණියේ ජනවාරි මස 08 වන දින පැවති ජනාධිපතිවරණ මැතිවරණ ප්‍රතිඵල නිකුත් වෙමින් තිබූ ජනවාරි මස 09 වන දින අලුයමේදීය. බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ දී එම නියෝජිත පිරිස හමුවූ විට ඔවුන් එල්ල කළ ප්‍රධාන ප්‍රශ්නය වූයේ පශ්චාත් මැතිවරණ සමය තුළ පවතින ආරක්ෂක තත්වයයි. එම තත්වය ඔවුන්ගේ සියැසින්ම දැක වටහා දීම සඳහා ජනවාරි 09 වන දින එම කණ්ඩායම කොළඹ නගරයේ සියළුම ස්ථාන කරාත්, ජනවාරි 10 දින මඩු සිද්ධස්ථානය වෙතත් රැගෙන ගොස් එහි ඇති තත්ත්වයත් පැහැදිලි කර දෙනු ලැබීය.

ජනවාරි 13 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලෙන් ශ්‍රී ලංකාවට සැපත්වූ ශුද්ධෝත්තම පාප් වහන්සේ ලබා දී තිබූ පැය 1 1/2ක් වැනි කෙටි කාලයක් ඇතුලත විවෘත රථයකින් කොළඹ නගරයට සම්ප්‍රාප්ත කිරීම පොලිසිය වෙත පැවරුනු ප්‍රධාන අභියෝගයක් විය. 1995 වර්ෂයේ දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරයේ දී මේ ගමන සඳහා 3 1/2 කට අධික කාලයක් ගතවී තිබුණි. 1995 ගමනේ දී අවස්ථා 10 කට වැඩි ප්‍රමාණයක් මහජනතාව පාලනය කිරීම ලිහිල් වීම හේතුවෙන් විවෘත රථයේ ගමන් කිරීමට බාධා පැමිණුනි. එම අතීත පාඩම් අධ්‍යයනය කර මෙම සංචාරය සඳහා විශේෂයෙන් කොළඹ මීගමු මාර්ගය දෙපස දැඩි ආරක්ෂක විධිවිධාන යෙදවීමට පොලිසිය කටයුතු කළේය. මෙහිදි 7000 කට ආසන්න පොලිස් නිලධාරීන් කණ්ඩායමක් යොදවා සිටි අතර, ඔවුන්ගේ සහයට පූජාප්‍රසාදී තුමන්, සොයුරියන් ඇතුළු 2000 කට ආසන්න ස්වේච්ඡා සේවකයින් යොදවනු ලැබූ හ. පොලිසිය සැලසුම් කළ ආකාරයටම නියමිත වේලාවට පාප් තුමා රැගත් විවෘත රථය පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය තුළ නවාතැන් ගනු ලැබූ අපෝස්තලික නිවහනට බාධාවකින් තොරව සම්ප්‍රාප්ත කරවීමට පොලිසිය ලද ජයග්‍රහණයකි.

15 වැනි පිටුවට >>>

# සුදුතුම් පිය ලංකා ගමන ඇරබයා ඉපිලෙන සිතිවිලි

ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා



## ප්‍රේමයේ පවතින්න





මෙයට දින කිහිපයකට පෙර අවසන් වූ අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ ශ්‍රී ලංකා සංචාරයට සූදානම් වීමේ දී, අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හා ශ්‍රී ලංකා අපෝස්තලික තානාපති තුමන්ගේ හා ශ්‍රී ලංකා රාජගුරු මණ්ඩලයේ මඟ පෙන්වීමෙන් හා දායකත්වයෙන්, මධ්‍යම කමිටුවක් පත් කොට, රදගුරුතුමකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ අනුකමිටු රාශියක්, රාජ්‍ය අංශයේ, පොලීසියේ හා ත්‍රිවිධ හමුදාවන්ගේ සහ අනිකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු හා විවිධ සංවිධාන අතර මනා සම්බන්ධීකරණයකින් සියළුකටයුතු ඉතා ක්‍රමානුකූලව හා විධිමත්ව සංවිධානය කර තිබුණ බව සහභාගි වූ හැම කෙනෙකුගේ ම අගය කිරීම මගින් ඉතා පැහැදිලිය.

පිරිස් පාලනය, රථ වාහන සැලැස්ම හා ආරක්ෂාව පිළිබඳ පත්කර තිබූ අනු කමිටුවේ ප්‍රධානත්වය දැරූ කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ එකී කමිටුවේ සාමාජිකයෙක් ලෙස අගරදගුරු පදවි ධර්මදූත කලාපීය නාහිමි අතිගරු සෑම් කුවින්ටස් හිමිපාණන්ගේ නායකත්වයෙන් යුත් විවිධ පදවි නියෝජනය කරමින් ගරු පියතුමන් හතලිස් දෙනෙක් හා ස්වෙච්ඡා සේවක සේවිකාවන් 500 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සමඟ මා ද ජනවාරි 13 දා සවස 5.30 පමණ ගාලුමුවදොර පිටියට ඇතුලු වූයේ පිරිස් පාලන කටයුතු මෙහෙයවමින්, රැස්වන ජනතාවගේ සුබසාධන කටයුතු ගැන ඔවුනට සහය වීම සඳහා අප එහි ඇතුළුවන විට ද, සෑහෙන පිරිසක් සාමාන්‍ය ජනයා සඳහා වෙන්කර තිබූ කොටස්වල රැස්වී සිටියහ.

පසුදින එනම් පාප්තුමා දිව්‍ය පූජාව පවත්වන දිනයේ අළුයම හතර පමණ වන විට මුළු ගාලුමුවදොර පිටියම එකම හිස් ගොඩක් බවට පත් වෙමින් මහා ජන ගංගාවක් ගලා එන්නට පටන් ගන්නා විට සංවිධාන කටයුතුවල නිරතව සිටි අප ඉතා අසරණ තත්ත්වයකට පත් වූයේ කර කියා ගත හැකි කිසිවක් නොවුන නිසාය.

මේ තත්ත්වයට කෙසේ මුහුණ දිය යුතු දැයි මා පොලීසියේ උසස් නිලධාරි මහත්මයකුගෙන් විමසූ විට ඔහු කියා සිටියේ “ෆාදර් දැන් නම් කරන්ඩ දෙයක් නැහැ. දෙයියන්ටම බාර දීල අපි පැත්තකට වෙමු” කියාය. එය ඔහු කට වචනයෙන් පමණක් කීවත් අප කිසිවෙකුටත් හිතාගත හැකි වෙන කිසිම විකල්පයක් නොවීය.

එදා ජනවාරි 13 දා සවස 5.30 සිට 14 වනදා සවස 3.30 පමණ වන තෙක් ගාලුමුවදොර පිටියේ රැඳී සිටි ඒ අත්දැකීම ඇත්තෙන්ම ජීවිත අත්දැකීම් රාශියක් දැක ගන්නට හා විඳ ගන්නට හැකියාව ලැබූ වාසනාවන්ත හෝරා කිහිපයක් ලෙස සඳහන් කළ හැකිය. මෙහිදී අන් හැම දෙයකටම වඩා සාමාන්‍ය ජනතාවගේ විශ්වාසය හා සභාවට දක්වන පක්ෂපාතිත්වය මගේ ජීවිතයට කදිම අභියෝගයක් විය.

ජනවාරි 13 දා සවස 7.30 පමණ වේලාවේ එතරම් තදබදයක් නොතිබුණ නිසා මා ජනතාව අතරින් විටින් විට නිදහසේ එහෙමෙහේ ගමන් කරන අවස්ථාවන්හි සමහර කණ්ඩායම් හා සමග කථා බහක යෙදෙන්නට උත්සාහ කළේ මේ පැමිණීම පිළිබඳ ඔවුන්ගේ අදහස් හා අරමුණු මොනවාදැයි දැන ගැනීමට මා තුළ තිබූ කුතුහලය නිසාය. ඔවුනගෙන් බහුතරයක් පැමිණියේ පාප් තුමන් දැක ගන්නටය යන මා තුළ තිබූ දුර්මතය, මට දුරුකරගන්නට සිදු වූයේ ඔවුන් බොහොමයක් එයට වඩා වැඩි ආධ්‍යාත්මික අත්දැකීමක් මේ ගමන තුළින් බලාපොරොත්තු වූ බව මා වටහා ගත් පසුවය.

**මා පළමුවෙන්ම කථාවට වැටුනේ බදුල්ල පදවියේ ලුණුගල සිට පැමිණි රාසම්මා නමැති මැදිවියේ කාන්තාවක සමගය.**

ඇය පැමිණ සිටියේ තම දරු මුණුබුරන් හා අහල පහල තවත් පවුල් කිහිපයක අසල්වැසියන් සමගය. එදින පාන්දර හතරට පමණ වෑන් රථයකින් පැමිණි ඔවුන් ගාලුමුවදොර පිටියට ඇතුල් වී තිබුණේ සවස 3.30 ට පමණය. “ඇයි ඔබ පාප්වහන්සේ බලන්ඩ ආවේ,” කියන මගේ කෙටි ප්‍රශ්නයට ඈ දිර්ඝ පිළිතුරක් දෙමින් කියා සිටියේ, “අපේ පාප් වහන්සේ අපට හරි ආදරෙයි. ඉස්සර මම හිතාගෙන හිටියේ පාප් වහන්සේලා කිව්වහම අපිට නම් කවදාවත් කිට්ටුවටවත් යන්නට බැරි, රෝමයේ මාලිගාවක ජීවත්වෙන මහා උත්තමයෙක් කියලයි. ඒ උනාට මේ පාප් වහන්සේ අපි වගේ අයට ආදරේ බව මට දැනෙනවා. පූජාව වෙලාවෙ උන්වහන්සේගේ නම කියන හැම වෙලාවකම මගේ ඇස්වලට කඳුළු එනවා. මට උන්වහන්සේගේ මුහුණ දැකගන්නට ලැබුණොත් සැනසිල්ලෙ මැරිල යන්ඩ පුළුවන්. ඒකයි මම මේ ළමයි ටිකත් එකතු කරගෙන අද ආවේ. මම කොළඹ ආපු පළමු වතාවයි මේ. නමුත් මට වෙන මොනවත් බලන්ඩ ඕන නැහැ. බලන්ඩ ඕනෙ පාප්වහන්සේව විතරයි. ඇයට බාධා කරමින් මම ඇගෙන් ඇහැව්ව, ඔබ කොහොමද දන්නෙ පාප් වහන්සෙ ඔබට ඔච්චර ආදරෙයි කියල. එවිට තම කටහඬ අවදි කරමින් රාසම්මා කියා සිටියේ “මට අකුරු ලියන්ඩ කියන්ඩ දන්නෙ නැහැ. මම පාප්තුමාව දැකල තියෙනව ෆොටෝවල. ටෙලිවිෂන් එකෙත් දැකල තියෙනව. එහෙම දකින කොට මට හිතෙන්නෙ ඒ අපි හුඟක් කාලයක් තිස්සෙ දන්න අඳුරන කෙනෙක් වගේ. අනේ මන්ද ෆාදර් මට ඒක කියාගන්ඩ බැහැ”යි කියමින් ඈ කඳුළු සලන්නට වූවාය.

**රාසම්මා මුණ ගැසී මා එතැනින් තව ටික දුරක් එහාට යනකොට, පොඩි දරුවන් තුන් දෙනෙක් හා තම බිරිය සමඟ බිම එලාගත් ඉටිරෙදි කෑල්ලක වාඩි වී සිටි පවුලක් මගේ නෙත ගැටිණ. ඔවුන් සමඟ විස්තර කතා කරන්නට පටන් ගත් විට තම නම සඳහන් නොකළ එම පවුලේ සැමියා කියා සිටියේ,** “අපි ඉන්නෙ දෙහිවල. මෙතන ඉඳල කිලෝ මීටර් පහකට විතර එහා. නමුත් වේලපහින්ම අපි මෙතෙන්ට ආවෙ පවුලක් හැටියට එකට ඉඳගෙන හෙට පැවැත්වෙන දිව්‍ය පූජාවට සහභාගි වෙන්න සූදානමක් හැටියට මේ රැයම යාච්ඤාවෙන් ගත කරන්නයි. මම පිළිකා රෝහලේ සේවය කරන වෛද්‍යවරයෙක්. මේ රෝගීන්ට බේත් කරන්ඩ ගියාමයි අපිට තේරෙන්නෙ අපි කොච්චර අසරණ ද කියල. මම මේ පවුල පිටින්ම ආවේ අපේ ලංකාවේ සෙනග වෙනුවෙන් බොහෝ දුක් විඳපු ජුසේ වාස් පියතුමන්ට කියන්ඩ, මේ රෝගීන්ට ඔවුන්ගේ දුක් දරා ගන්නට දෙවියන් වහන්සේගෙන් ශක්තිය ලබා දෙන්නයි කියල. ඒ වගේම අපි කවුරුත් පාප් වහන්සේ දැක ගන්ඩ ආසාවෙන් ඉන්නෙ. එතුමාගේ සරල ජීවිතය, විශේෂයෙන් රෝගීන් වෙත දක්වන ආදරය මගේ වෛද්‍ය වෘත්තියට ලොකු බලපෑමක් කරල තියෙනව”. පිරිස් පාලනය සඳහා ගාලු මුවදොරට පැමිණි මට, දැන් දැන් මා මෙහි මේ රාත්‍රිය ගත කිරීම ගැනත් යම්කිසි විශේෂත්වයක් දැනෙන්නට පටන් ගත්තේ නොදැනුවත්වමයි.

**මට ඊළඟට මුණ ගැසුනේ යාපනයේ මානිපායි ප්‍රදේශයේ සිට පැමිණි පිරිසක්. ඔවුන්ගෙන් කිහිප දෙනෙකුට හොඳින් සිංහල කතා කරන්නට පුළුවන් වූ නිසා, මම ඔවුන්ගේ මේ පැමිණීම ගැන විමසා සිටියා.** ඔවුන්ගේ පිළිතුර වූයේ පාප් වහන්සේ බලන්නට මඩු පල්ලියට යෑම ඔවුනට ඉතා පහසු වුවත් අද මෙතැනට ආවේ ජීවිතයේ සමහර විට එක් වතාවක් පමණක් දකින්නට සහභාගි වෙන්නට පුළුවන් විය හැකි ජුසේ වාස් මුනිතුමන් සාන්තුවරයට ඔසවන දේව මෙහෙයට සහභාගි වීම සඳහා බවයි. යාපනය මන්නාරම ප්‍රදේශයේ ඔවුන්ගේ මුතුන් මිත්තන් එක්ක එකට ජීවත් වෙලා, දුක් විඳලා ඔවුන්ව ආරක්ෂා කර දුන් විශ්වාසය වෙනුවෙන් දෙවියන් වහන්සේට ස්තූති කරන්ට ඔවුන් මෙහි ආ බව පැහැදිලිවම කියා හිටියේ එම කණ්ඩායමේ තරුණියක්.

ඒ කණ්ඩායමේ ම හිටි තවත් වැඩිමහල් පිරිමි කෙනෙක් කැඩිච්ච සිංහලෙන් කියා සිටියේ. අපිට මේ ගමනට දවස් තුනක් යනව. එන්ඩ දවසයි, මෙහෙ ඉන්ඩ දවසයි, ආපසු යන්ඩ දවසයි. නමුත් ජුසේ වාස් පියතුමා දැන් ස්වර්ගයේ සිටින නිසා අපි ගැන බලාගනිවී. අපිට අද හරි සන්තෝෂයි.

මේ විදියට අදහස් බෙදා ගන්නට එදා ගාලුමුවදොර පිටියේ නිමක් නැතිව සෙනඟ හිටියත්, **ඊළඟට මගේ අවධානය යොමු වූයේ ආබාධිත තරුණයකු සමඟ පිට්ටනියේ වැතිර සිටි වියපත් කාන්තාවක දෙසටයි. ඔවුන් පැමිණ සිටියේ ගාලු පදවියේ හිනිදුම ප්‍රදේශයේ සිටයි. බැලූ බැල්මට උපතින්ම ආබාධිත තත්ත්වයට පත්ව සිටින මේ තරුණයා සදාකාලික ආබාධිතයෙක් බව නම් පැහැදිලියි. මේ අම්මා සමඟ කතා කරද්දි ඇය කියා සිටි දෙයින් මගේ පූජක දිවිය තරමක තිගැස්සීමකට ලක්විය.**
“තාත්තා නැති මේ දරුවාගේ වයස දැන් අවු. 18 යි. ඇවිදින්න බැහැ. කතා කරන්නෙ නැහැ. ඇඳේම තමා ඉන්නෙ. කොහොම හරි මම මේ දරුවව බස් එකේ නග්ගගෙන මෙතෙන්ට ආවේ පාප් වහන්සේව බලන්ඩයි. මේ ළමයට නම් මේ ගමන ගැන තේරුමක් නැහැ. නමුත් පාප් වහන්සේ මේ වගේ රෝගීන්ට ආදරෙයි. ඒ නිසා උන්වහන්සේට අපේ දුක තේරෙයි”. ටිකකට බාධා කළ මා ඇයගෙන් ඇසුවේ මේ ගමනින් පසු මේ දරුවාට සම්පූර්ණ සුවය ලැබෙයි කියා ඇය බලාපොරොත්තු වන්නේ ද කියායි. එයට ඈ දුන් පිළිතුර වූයේ, “මේ ලෙඩේ කවදාවත් සුව වෙන්නෙ නැහැ කියල මම දන්නවා. උන්වහන්සේගේ ආශිර්වාදය මේ දරුවට ලැබුණහම මට හයියක් ලැබේවි මේ දරුවව හොඳින් බලා ගන්ඩ. ඒ විතරක් නොවෙයි මේ දරුවට මේ දුක දරාගන්ඩ දෙවියන් වහන්සේගේ ශක්තිය ලැබේවි” එම පිළිතුරින් පසු මා තවත් ප්‍රශ්න අසන්නට උත්සාහ කළේ නැත.

ජුසේ වාස් පියතුමා සාන්තුවරයට එසැවීමේ දේව මෙහෙය ශ්‍රී ලාංකික අපිට ඉතා සුවිශේෂී අවස්ථාවක් මෙන්ම පාප් තුමාගේ ශ්‍රී ලංකා සංචාරය සාමාන්‍ය ජනතාවට අසාමාන්‍ය අත්දැකීමක් බව ඒ රැස්ව සිටි ජනකාය පැහැදිලිව පෙන්නුම් කළ එක් වැදගත් කරුණකි. බැරි වෙලාවත් මෙම සාන්තුවරයට එසැවීමේ දේව මෙහෙය රෝමයේ දී සිදුවූවා නම්, ගමන් වියදම් දරාගෙන එහි යන්නට හැකි ඉතා සුළු පිරිසකට පමණක් එයට සහභාගි වීමේ අවස්ථාව තිබිණ. අති උතුම් ප්‍රැන්සිස් පාප් තුමාගේ ලංකා සංචාරයත්, සාන්තුවරයට එසැවීමේ දේව මෙහෙයත් එකම අවස්ථාවක ලංකාවේම සිදු වූ නිසා, එය බොහෝ දෙනෙකුට දැක බලා ගන්නට අවස්ථාවක් වූවා පමණක් නොව, එය බොහෝ දෙනෙකුගේ ආධ්‍යාත්මික නවෝදයකට ද හේතු වූවා නොඅනුමානය.

මේ ගැන අදහස් දක්වමින් මුන්දලම ප්‍රදේශයේ සිට පැමිණි එක් ගුරු මහත්මයෙක් කියා සිටියේ එදා දිළින්දෙක්ව ලංකාවට පැමිණ, දිළින්දෙක් ලෙස මෙහි ජීවත් වෙමින්, දිළින්දන් වෙනුවෙන් මුළු ජීවිතයම කැප කළ අපේ ජුසේ වාස් මුනිතුමන්ව දිළින්දන්ට ප්‍රේම කරන, සරල ජීවිතයක් ගෙවන, නිතර දිළින්දන් වෙනුවෙන් පෙනී සිටින ප්‍රැන්සිස් පාප් තුමා අතින් සිදුවනු අපේ ඇස් දෙකින්ම දැක ගන්නට හැකි වීම තමාගේ ජීවිතයේ වාසනාවන්ත අවස්ථාව බවයි.

මේ ආකාරයට එදා ගාලුමුවදොර පිටියට රැස් වූ විවිධ ක්ෂේත්‍රයන්ට හා විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයින් සමඟ කතා බහ කරද්දී, මේ සා පිරිසක් මෙලෙස එක් රැස්වීමට පාදක වූ මූලික කරුණු දෙකක් වෙත අපගේ අවධානය යොමු කළ යුතුවෙයි. ඉන් පළමුවැන්න නම් සාන්ත ජුසේ වාස් මුනිතුමන්ට අප ජනතාව දක්වන ආදරය හා සෙනෙහසයි. එතුමාගේ ජීවිත කතාව ගැන යමක් හෝ දන්නා හැම කෙනෙකුගේම මතකයේ රැඳී තිබෙන එක් මූලික කරුණක් වන්නේ එතුමා යාචකයකුගේ වෙස් ගෙන ලංකාවට පැමිණ, ජනතාවට ආදරය කරමින්, ජනතාව වෙනුවෙන් සියල්ල කැප කරමින්, සරල දැහැමි දිවියක් ගත කළ සිල්වත් කිතුනු පූජක තුමකු බවයි.

දෙවැන්න නම් අති උතුම් ප්‍රැන්සිස් පාප්තුමාගේ සරල ජීවිතය හා දර්ශනය වටා ගොඩ නැගෙන ජනප්‍රියත්වයයි.

සාමාන්‍ය ජනතාව අති උතුම් ප්‍රැන්සිස් පාප් වහන්සේව දකින්නේ ගැඹුරු දේව ධර්ම න්‍යායන් ඉදිරිපත් කරන, සභාවේ නායකයා හැටියට පරිපාලනයේ යෙදෙන, රෝමයේ සිංහාසනාරූඪ මහේශාක්‍ය පුද්ගලයකු හැටියට නොව, සෙනඟට ආදරය කරන, සෙනඟගේ හැඟීම් වලට සංවේදී, තමන්ගේ කෙනෙකු ලෙසයි. එම නිසා සාන්ත ජුසේ වාස් මුනිතුමා සාන්තුවරයට එසැවීම හා අති උතුම් ප්‍රැන්සිස් පාප් තුමාගේ ලංකා අපෝස්තලික සංචාරය ගැන අප උද්දාමයට පත් විය යුත්තේ එතුමා ගිය ආ හැම තැනකම රැස්වූ අති විශාල ජනකාය ගැන ගණන් හැදීමෙන් නොව, මේ සිද්ධීන් තුළින් අප ජනතාව තුළ ඇති වූ ආධ්‍යාත්මික නවෝදය හා ප්‍රබෝධය ගැනයි.

සරළ දිළිඳු ජීවිතය, ජනතාවට සමීප වීම කොයි කාගේත් ඇගයීමට ලක්වෙන බව මේ සිද්ධීන් තුළින් අපට කියා දෙන මූලික පාඩමයි. එය මනා සේ තේරුම් ගැනීම ගිහි පැවිදි හැමගේම යුතුකමයි.

# ශුද්ධ සභාවේ ජීවමාන ශුද්ධවරයා දැකගන්නට සැලසූ සැමට තුති මල් මිටක්



## මගේම ආගමික නායකයා අප අමතනවා වගේ මට හැඟුණා



අති උතුම් ෆ්‍රැන්සිස් පාප්තුමාගේ ශ්‍රී ලංකා සංචාරයේදී උන්වහන්සේ මුණගැසී ආශිර්වාද ලබන්නට හා සුභ පතන්නට ලැබුණු අනගි අවස්ථාව ගැන මාගේ සතුට මින් පළ කරමි.

ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අයත් ප්‍රොතෙස්තන්ත සම්ප්‍රදයට අයත් බැප්ටිස්ට් සභාව, ලංකා සභාව, මෙතෝදිස්ත සභාව, ලංකා රෙපරමාදු සභාව, දකුණු ඉන්දියානු සභාව, ප්‍රෙස්බිටේරියන් සභාව හා ගැළවීමේ හමුදාවට අයත් නිකායන්ගේ නායක දේවගැතිතුමන් මේ අවස්ථාව සඳහා සහභාගී විය.

අති උතුම් ෆ්‍රැන්සිස් පාප්තුමන් අන්තර් ආගමික නායකයින් මුණගැසීමට බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවට සැපත්වූ උත්සවයේදී සියලු ආගම් නියෝජනය කළ විශාල පිරිස උන්වහන්සේ ඉදිරියේ නැගී සිටියේ සියලු ආගමික සම්ප්‍රදායන් හා බෙදීම පසෙක දමමිනි.

උන්වහන්සේගේ දෙසුම වෙත මාගේ සවන යොමු කරද්දි හැඟී ගියේ 'මේ මගේම ආගමික නායකයා අප අමතනවා' යන්නයි.

උන්වහන්සේ කෙරෙහි මෙතරම් භක්ති ආදරයක් මතුවන්නට හේතුව වුයේ එතුමා තුළ ඇති දැඩි අල්පේච්ඡ බව, මනුෂ්‍යත්වය හා ආගමික විනය බව මාගේ හැඟීමයි. වැදගත්ම දෙය නම් මේ ගුණාංග උන්වහන්සේ පෙන්වන්නේ ජීවිත ආදර්ශයෙන් වීමයි. අපගේ දෙනෙත් ඉදිරියේදීම මා දුටුවේ දැඩි වෙහෙසට පත්ව සිටි උන්වහන්සේ මේසය මත තිබූ වතුර බෝතලය උන්වහන්සේ අරගනිද්දී අවට උපකාරයට සිටි අය එහි මූඩිය ඇර දීමට උත්සාහ කළ විට, ඔවුන්ට ස්තුතියි කියා උන්වහන්සේම එහි මූඩිය ඉවත්කර ගැනීමට ඉදිරිපත් වෙමින් සියලු ආගමික නායකයන්ට පෙන්වා දුන්නේ තමන්ගේ වැඩය තමන් විසින්ම සිදුකිරීමේ වැදගත්කමයි.

ඒ අවස්ථාවේදී තවත් ආගමික සම්ප්‍රදයකට අනුව උන්වහන්සේට අඳනාවක් පළඳවන විට හිස පහත්කොට එය පැළඳවීමට ඉඩ හැරියේ තම ආගමික සම්ප්‍රදය මෙන්ම අනෙකාගේ ආගමික සම්ප්‍රදය අගය කළයුතුය යන ආදර්ශය තමන් වහන්සේ විසින්ම පෙන්නුම් කරමිනි.

උන්වහන්සේ අසුන්ගෙන සිටි අසුනෙන් නැගිට අනෙකුත් ආගමික නායකයින් සිටින ස්ථානයටම ගොස් ආශිර්වාද ගැන්වීම හා සුභ පැතීම උන්වහන්සේ විසින් කරනු ලැබුවේ ස්වාමීන් වහන්සේ අපට උගන්වා වදාළ 'නායකයා සේවකයා'ය, යන උතුම් ඉගැන්වීම ජීවිතයෙන් පෙන්වීම තුළිනි.

එමනිසා සැබවින්ම මුල් ආසන දරමින්, ආවතේව ලබමින්, සුර සැප විඳින ආගමික නායකයින්ට උන්වහන්සේ ඒ විනාඩි කිහිපය තුළ ඉගැන්වූ පාඩම සැබවින්ම ආදර්ශවත්ය.

මගේ පැතීම නම් ඒ ආදර්ශය අනුව අප සැමගේ ජීවිත හැඩ ගස්වා ගැනීමට හැකිවේවා යන්නයි.

**ගරු ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා**
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය

## මා තෝරාගත් සමිඳුන්ට ප්‍රශංසා වේවා!

විශේෂයෙන් ම සුදුතුම් පියතුමන්ගේ ලංකා ගමන මුල් කොට ගෙන ගාලුමුව දොර පිටියේ පැවති දිව්‍ය පූජාවේ දී පළමු කියවීමෙන් පසු ගායනා කරන්නට යෙදුනු පිළිතුරු ගීය මා හට පැවරීම මා ජීවිතයේ ලැබූ ආශ්චර්යවත් මොහොතක් බව සිහිපත් කළ යුතුයි. මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පැවති ජනවන්දනා අංශය තුළ ක්‍රියාත්මක වූ විවිධ කාර්යයභාරයන් අතර බෙදී ගිය වගකීම් තුළ අපි සැවොම ක්‍රියා කළේ ඉතාමත්ම ජ්වලිතභාවයකිනි. දිව්‍ය පූජාව ආරම්භයේ සිටම ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් නිසොල්මනේ ඒකත්වයෙන් දිව්‍ය පූජාවට සූදානම් වන විට අපටත් සුවිශුද්ධමය හැඟීමක් ඇති වූයේ ජනවන්දනාව තුළ අප හට පැවරී තිබුණ කාර්යයන්ගේ වැදගත්කම හා වටිනාකම සැබවින්ම අපට ඉතා ඉහළින් අවබෝධ වී තිබුණ නිසයි.

අපි පිළිවෙතින් පුදසුන වෙත නිසොල්මන්ව ගමන් කරන විට ශුද්ධාත්ම ආලෝකයේ ජීවය අප වසා ගත් බව අපට වැටහුණා. පීඨකය මතට නැග නැවතත් ජනතාව දෙස බලා ඒ පිළිතුරු ගීය, එනම් "සමිඳාණෝ මාගේ එඬේරා වේ, හිමි සමිඳෝ සතපයි මා නිල් තණ බිමේ" යන වදන් ගායනා කරමින් ජනතාවත් එයට සම්බන්ධ කරගත් මොහොතේ සැබවින්ම සමිඳාණන් අපව සැමවිට නිල් තණ බිම් මත සතපවන මහෝත්තම දෙවිඳාණෝ බව කොතරම් අපූරුවට අපේ විශ්වය තුළ අප පසක් කර ගත්තා ද?

සුදුතුම් පිය ගමන කිතුනු විශ්වාසය එළි දක්වන්නට එකිනෙකා ලැබූ භාග්‍යවත් මොහොතක් බව අප පවසනුයේ ඒ නිසයි.

**වික්ටර් සිල්වා** - මහනුවර

## දරුවනට සෙනෙහෙ පෑ උතුමා

ජනවාරි මස 13 දින අප ලක්දිවට වැඩම කළ අති උතුම් ෆ්‍රැන්සිස් සසුන් පියාණන්ගේ ජීවිතය ඉතා සරල, නිහතමානි, ප්‍රේමයෙන් පිරි කරුණාවන්ත ජීවිතයක්. කිතුනු අපටත් පුළුවන්ද එතුමාගේ ජීවිතය අනුව ජීවත් වන්නට. එතුමා ඇත්තෙන්ම ශ්‍රද්ධවන්ත, භාග්‍යවන්ත උදාර නායකයෙක්.

අසරණ අයට පිහිට වෙමින්, දරුවන්ට සෙනෙහස පාමින් එතුමා ද මුළු ලෝකයක් ඉදිරි යේ අප මෙන් බසයෙන්, දුම්රියෙන් ගමන් කරමින් සරල චාම් දිවි පෙවෙතක් ගත කරයි. ඇත්තෙන්ම එතුමාගේ ජීවිතයෙන් අපට ගත හැකි ගුණාංග බොහෝ යි. ඉතින් කිතුනු ජනතාව වන අපත් එතුමාගේ ජීවිතාදර්ශය අනුව ජීවත් වෙමින් වැරදි මාර්ගයේ ගමන් කරන කිතුනු භක්තිකයන්ව ද ප්‍රේමයෙන් පිරි ජීවිතයක් ගත කරන්ට නිවැරදි මාර්ගයට ගනිමින් අපගේ සුදුතුම් පියාණන් මෙන් අප ද නිහතමානී ජීවිතයක් ගත කරන්නට පුරුදු වෙමු.

**නිමාෂා ගමගේ**
සරික්කාලිමුල්ල

### ප්‍රේමයේ පවතින්න

## සුදුතුම් පිය ලංකා ගමනේ දී කතෝලික මාධ්‍යවේදියාට අඩු සැලකිලි ද?

පාප් වහන්සේගේ ලංකා සංචාරය ආවරණය කරන්නට ගිය මාද කතෝලික මාධ්‍යවේදියෙකි. එහිදී කතෝලික මාධ්‍යවේදීන් හා ඡායාරූප ශිල්පීන් ලෙස අප සැමට මුහුණදීමට සිදුවූයේ ඉතා අමිහිරි කලකිරවන සුළු සිදුවීම් රාශියකටය. පොදුවේ කතාබහ කළ කතෝලික මාධ්‍යවේදීන් සියල්ලම පාහේ මුහුණ දී සිටියේ මා මුහුණ දුන් කලකිරීම හා කනස්සල්ලටය. එහිදී මෙම පාප් වහන්සේගේ ලංකාගමන ආවරණය කිරීමට කතෝලික මාධ්‍යවේදීන් හට වැඩි අවස්ථාවක් ලබා දෙන ලෙස සටන් කළ අයගෙන් මාද එක් අයෙකි.

පාප් වහන්සේගේ ලංකාගමනේ මාධ්‍ය කටයුතු බාරව තිබුනේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට බව වාර්තා වන අතර ප්‍රවෘත්ති දෙපාර්තුමේන්තුවේ මෙම නිල මාධ්‍ය කටයුතු බාර නිලධාරීන් විසින් මාධ්‍ය ආවරණය සදහා ප්‍රමුඛතාවය ලබාදීමේදී කතෝලික මාධ්‍යවේදීන්ට ප්‍රමුඛතාවය ලබාදෙනු වෙනුවට ඔවුන්ව කපා දමා තම හිතවත්කම මත මෙම මාධ්‍ය ආවරණ කටයුතු සදහා එතරම් ප්‍රමුඛතාවයක් නැති මාධ්‍ය ආයතනයන් සදහා ප්‍රමුඛතාවය ලබා දෙනු අප කාටත් දැකගත හැකිවිය.

මේ සම්බන්ධව ඇතැම් පියවරුන් දිගින් දිගටම මාධ්‍ය අංශයේ ප්‍රධානීයා හා බහින් බස් විය. මෙහිදී කතෝලික නිල පුවත්පත වන 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පතේ කර්තෘ පියතුමා ද සිය නිල ඡායාරූප ශිල්පියාව අදාල තෝරාගත් කණ්ඩායමට ඇතුළත් කර ගැනීම සදහා දැඩි උත්සාහයක යෙදෙනු දක්නට හැකිවිය. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් එතුමාට බැණ වදිමින් කතා කළ ආකාරය ඇසූ අප සියල්ලන්ගේම හදවතට දැනුනේ ඉතා පිළිකුලකි. ඒ අවස්ථාවේදීම ඒ සදහා කතෝලික මාධ්‍යවේදීන් වන අප කිහිප දෙනෙකු විරෝධය දැක්වුවද එම නිලධාරියා එය තඹයකට මායිම් නොකළ අපටද දෝෂාරෝපණය කරන්නට විය.

'ඥානාර්ථ ප්‍රදීපයේ' නිල ඡායාරූප ශිල්පියාද, කතෝලික සභාවට සම්බන්ධ වෙබ් අඩවි හා පුවත් ආයතන රැසක කතෝලික ඡායාරූප ශිල්පීන් රැසක් ලියාපදිංචි වී සිටියද ඔවුන් සියල්ලන්ම හැඳුනුම්පත් එල්ලාගෙන කිසිදු ආවරණයකට අවස්ථාව නොලබාම මාධ්‍ය කුටිය තුළට වී දින තුනක් පුරා නිකරුනේ ගැවසුණු බවද වාර්තාවේ. බෝලවලාන සංස්කෘතික මධ්‍යස්ථානය පාප් වහන්සේගේ අතින් විවෘත කළ අවස්ථාවේදී මාධ්‍යවේදීන්ට සැලකූ ආකාරයද ඉතා පිළිකුල් සහගතය. මාධ්‍යවේදීන් ගාල් කර තිබුණේ දෙව්මැදුරේ පසෙක එයට යන ගල් ඇල්ලූ මාවතට අඩියකටත් වඩා වැඩි පහත වලක් ඇති මඩ සහිත ප්‍රදේශයකය. හතර වටේම යකඩ බම්බු යොදා ආවරණය කර තිබිණි. කැමරාව තබා ගැනීමට සිදුවූයේ සාමාන්‍ය ඇස් මට්ටමට වඩා පහළින්ය. එසේ පහල වලක සිට ඡායාරූප ගන්නේ වීඩියෝ කරන්නේ කෙසේදැයි මාධ්‍යය ගැන දන්නා ඕනෑම අයෙකුට සිතෙන කරුණකි. එසේ පහල මට්ටමේ සිටියදී මල් ඉසින්නට යොදා තිබුණු දරුවන් හා ආරක්ෂක අංශ නිසා තවත් දර්ශන පථය අවහිර විය.

මෙහිදී මා හට මෙම මාධ්‍ය ඉසව්ව සංවිධානය කළ අයගේ මාධ්‍ය දැනුම සම්බන්ධව දැඩි ප්‍රශ්නයක් ඇතිවිය. ඇස් මට්ටමට වඩා පහලින් මාධ්‍යවේදීන් රැඳවීමෙන් සිදුවන අපහසුතාව සම්බන්ධ ඔවුන්ට දැනුමක් නැතිවීමද, විශේෂයෙන් හිරු නැගීමේදී ඉර තිබෙන්නේ කැමරාවට මුහුණලා (Against Light) කැමරාකරණයට බාධා වන පරිදිය. මෙය සංවිධානය කරන ලද මාධ්‍ය සම්බන්ධව අල්ප දැනුමක් ඇති කෙනෙකුට වුවද හිරුට ප්‍රතිවිරුද්ධව ස්ථානයක් තෝරාගෙන මාධ්‍ය සඳහා අඩි කිහිපයක් උස අට්ටාලයක් නිමවා දුන්නානම් කිසිදු බාධාවකින් තොරව මාධ්‍ය ආවරණය කිරීමට හැකියාවක් තිබිණි.

මෙම මුළු ඉසව්ව පුරාම පෙනුනේ කතෝලික මාධ්‍යවේදීන් නොසලකා හැර කරන ලද කුඩම්මාගේ සැලකිලිය. ඒ සඳහා මැදිහත්වීමට කතෝලික සභාව පැත්තෙන් කෙනෙකු නොවීම කණගාටුදායකය. විශේෂයෙන් කතෝලික සබාව ඔසවා තැබීමට සිය දහදිය කඳුළු කැප කරන අප වැනි කතෝලික මාධ්‍යවේදීන්ව මෙවැනි විශේෂ අවස්ථාවන්වලදී කුණු මාළු මෙන් ඉවත දැමීම සම්බන්ධව අපගේ දැඩි විරෝධයත් කණගාටුවත් මෙහිදී ප්‍රකාශ කරමු.

**යූ. අයි. අල්විස්** - ඡායාරූප මාධ්‍යවේදී



## ප්‍රේමයේ පවතින්න

# "නොරිටාකේ ලංකා" සසුන් පිය ලංකා ගමනට දිව්‍ය සත්ප්‍රසාද සිබෝරියම් 1300 ක් තනයි



අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ගේ ශ්‍රී ලංකා සංචාරය වෙනුවෙන් ශුද්ධවූ සත්ප්‍රසාද පාත්‍ර නිර්මාණය කිරීමේ දුර්ලභ වූත් ගෞරවනීය වූත් අවස්ථාව නොරිටාකේ ලංකා පෝසිලේන් ලිමිටඩ් සමාගම වෙත හිමි විය.

සෙ.මී. 224.8 ක විෂ්කම්භයකින් හා සෙන්ටිමීටර 76.8 ක උසකින් යුතු බ්‍රිලියන්ට් වයිට් වර්ණයෙන් එන මෙම එක් පාත්‍රයක බර ග්‍රෑම් 682 කි. ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි සමලංකෘත මූලාශ්‍ර ඇසුරෙන් මෙම ශුද්ධවූ සත්ප්‍රසාද පාත්‍ර නිර්මාණය කර තිබේ.

අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ගේ තෙදින ශ්‍රී ලංකා සංචාරය අතරවාරයේ දී මෙම ශුද්ධ වූ සත්ප්‍රසාද පාත්‍ර සඳහා ලැබී තිබුණේ සුවිශේෂ ස්ථානයකි. මෙහිදී පාත්‍ර 1300 ක් නිෂ්පාදනය කර තිබෙන අතර දිව්‍ය සත්ප්‍රසාද සඳහා මෙයින් එක් පාත්‍රයක් අති උතුම් ශුද්ධෝත්තම පියතුමන් භාවිතයට ගන්නා අතරවාරයේ දී සෙසු පාත්‍ර කතෝලික පියතුමන් විසින් භාවිතයට යොදා ගනු ලැබීය.

මේ පිළිබඳ අදහස් දක්වමින් "සීමාසහිත නොරිටාකේ ලංකා" පෝසිලේන් පෞද්ගලික සමාගමේ උප සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ යොෂිනාරි ෂිමායා මහතා මෙසේ අදහස් දැක්වීය.

"ශුද්ධවූ සත්ප්‍රසාද පාත්‍ර වර්ගයෙහි හැඩය, මෝස්තරය, තාක්ෂණික පිරිවිතරයන් හා නිමැවුම පිළිබඳ දීර්ඝ සාකච්ඡා වට ගණනාවක් පසුගිය මාස කිහිපය පුරා කොළඹ අගරදගුරු කාර්යාලය හා අප කණ්ඩායම අතර පැවැත්වුණා. එහිදී අවසාන නිෂ්පාදිතය පිළිබඳ මනා සහතිකයක් අපගේ පළපුරුදු මෙන්ම විශේෂඥභාවයකින් යුතු මේ සඳහාම කැපවුණු කණ්ඩායම වෙත හිමිවුණා."

අති උතුම් ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ ආසියානු ධර්ම දූත චාරිකාවේ පළමු ගමනාන්තය ශ්‍රී ලංකාව වූ අතර මෙම සංචාරය තුළ චාරිකාවේ යෙදෙන දෙවැනි ආසියානු රට වූයේ ද ශ්‍රී ලංකාවයි.

පසුගිය ජනවාරි 13 වැනි දින අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමෝ ශ්‍රී ලංකාවට සැපැත්වුණු අතර දින දෙකක ඇවෑමෙන් ශ්‍රී ලංකාවෙන් නික්ම ගියහ.

# සසුන් පිය ලංකා ගමනේ මධ්‍යම කමිටුව

- ★ ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය
- ★ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය
- ★ ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති කාර්යාලය

**- නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ**

- ★ අති උත්තම මැල්කම් කාදිනල් රංජිත් හිමි සභාපති - කොළඹ අගරදගුරු
- ★ අති උතුම් පියර්රි ගුයෙන් වැන්ටොට් හිමි ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති
- ★ අතිගරු රෙනාටෝ කුසික් අපෝස්තලික තානාපති ලේකම්
- ★ අතිගරු ජේ. ඩී. ඇන්තනි ජයකොඩි පියතුමා - සහකාර ලේකම්
- ★ ගරු ජූඩ් සමන්ත ප්‍රනාන්දු පියතුමා - සහකාර ලේකම්

**- නම් කළ සාමාජිකයෝ**

- ★ ගරු ටෝනි මාටින් පියතුමා - සහකාර මහ ලේකම්, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව
- ★ අතිගරු ජෙයරාජ් රාසයියා ජේ.නි. පියතුමා සභාපති - පැවිදි නිකා ශ්‍රේෂ්ඨ සමුළුව
- ★ අතිගරු සිරිමා ඕපනායක (දො.නි) පැවිදි සොයුරිය - පැවිදි නිකා ශ්‍රේෂ්ඨ සමුළුව
- ★ අයිවන් විද්‍යානාරච්චි - සම්බන්ධිකාරක

**කමිටු සභාපති හා ලේකම්**

**- ජනවන්දනාව**

- ★ සභාපති - අති උතුම් වියානි ප්‍රනාන්දු හිමි මහනුවර රදගුරු
- ★ උප සභාපති - අති උතුම් පොන්නයියා ජෝශප් හිමි, මඩකලපුව රදගුරු
- ★ ලේකම් - ගරු ඉග්නේෂස් වර්ණකුලසිංහම් පියතුමා, සා. ජෝන් මේරි වියානි දෙව්සත්හල

**- මූල්‍ය**

- ★ සභාපති - අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි, කොළඹ අගරදගුරු
- ★ උප සභාපති - බී. ආර්. ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා
- ★ ලේකම් - අතිගරු ප්ලැසිඩස් ද සිල්වා පියතුමා, අධිනේතෘ/අධ්‍යක්ෂ

**- පිළිගැනීම**

- ★ සභාපති - අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමි, හලාවත රදගුරු
- ★ ලේකම් - ගරු පිලීෂියන් රංජිත් පෙරේරා පියතුමා, මීසම් සේවක - සියලු සාන්තුවර දෙව්මැඳුර

**- ප්‍රචාරක කටයුතු හා මාධ්‍ය**

- ★ සභාපති - අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමි, ගාල්ල රදගුරු
- ★ ලේකම් - ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා, සමාජ සන්නිවේදන අධ්‍යක්ෂ

**- රථ වාහන පාලනය, ආරක්ෂක කටයුතු සහ මහජනයා හැසිරවීම**

- ★ සභාපති - අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමි, කුරුණෑගල රදගුරු
- ★ **මහජනයා හැසිරවීම - ලේකම්** අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා, විවාහ අධිකරණ /අධ්‍යක්ෂ
- ★ **ආරක්ෂක කටයුතු - ලේකම්** අතිගරු සැම් කුවින්ටස් පෙරේරා පියතුමා, ධර්මදූත කලාපීය නාහිමි
- ★ රථවාහන පාලනය - ලේකම් ගරු ශ්‍රීනාත් මනෝජ් පෙරේරා පියතුමා, අධ්‍යක්ෂ, කාදිනල් කුරේ මධ්‍යස්ථානය අයිවන් විද්‍යානාරච්චි, සම්බන්ධිකාරක

**- ප්‍රවාහන කටයුතු**

- ★ සභාපති - අති උතුම් මැක්ස්වල් සිල්වා හිමි, අගරදගුරු පදවි සහයක රදගුරු
- ★ ලේකම් - ගරු රොහාන් ද අල්විස් පියතුමා, අධ්‍යක්ෂ, සෙත් සරණ කරිටාස්, කොළඹ

**- සෞඛ්‍ය සේවා**

- ★ සභාපති - අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි. හිමි, අනුරාධපුර රදගුරු
- ★ උප සභාපති - ගරු ක්‍රිස්පින් ලියෝ පියතුමා, සා. පීතර විදුහල බම්බලපිටිය
- ★ ලේකම් - වෛද්‍ය මැක්සි ප්‍රනාන්දුපුල්ලේ

**- ආධ්‍යාත්මික කටයුතු**

- ★ සභාපති - අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමි, බදුල්ල රදගුරු
- ★ ලේකම් - අතිගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා, කලාපීය නාහිමි

**- අන්තර් සාමයික හමුව (බණ්ඩාරනායක සමරු ශාලාව)**

- ★ සභාපති - අති උතුම් ක්ලීටස් පෙරේරා සා.බෙ.නි. හිමි, රත්නපුර රදගුරු
- ★ ලේකම් - ගරු පයස් කෙනඩි ප්‍රනාන්දු පියතුමා, ඉහළ කටුනේරිය සා. ජූඩ් දෙව්මැඳුර, කටුනේරිය

**- ගාලු මුවදොර පිටිය කමිටුව**

- ★ සභාපති - අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමි, අගරදගුරු පදවි සහයක රදගුරු
- ★ ලේකම් - අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා, සා. තෝමස් දෙව්මැඳුර, කෝට්ටේ

**- සංස්කෘතික ආයතනය (බෝලවලාන) කමිටුව**

- ★ සභාපති - අතිගරු ජෝශප් පැට්රික් පෙරේරා පියතුමා, කලාපීය නාහිමි, උතුරු කොළඹ කලාපය
- ★ ලේකම් - ගරු ක්වින්ටස් ප්‍රනාන්දු පියතුමා, කාදිනල් කුරේ මධ්‍යස්ථානය, තම්මිට

**- අගරදගුරු මැදුරු කමිටුව**

- ★ සභාපති - අතිගරු මර්ල් ශාන්ති පෙරේරා පියතුමා, භාණ්ඩාගාරික, අගරදගුරු මැදුර
- ★ උප සභාපති - අතිගරු අයිවන් පෙරේරා පියතුමා, කලාපීය නාහිමි - විශේෂ ව්‍යාපෘති
- ★ ලේකම් - ගරු රොහාන් ද සොයිසා පියතුමා

**- සැරසිලි කමිටුව**

- ★ සභාපති - අතිගරු ශාන්තිකුමාර වැලිවිට පියතුමා, ජා-ඇල කලාපීය නාහිමි
- ★ ලේකම් - ගරු ඇන්ටන් දිනේෂ් ප්‍රියසාද් පියතුමා, විශ්වාසය සජීවිකරණ කංඩායම් සාමාජික, ඇක්වයිනස් විද්‍යායතනය

**- මඩු කමිටුව**

- ★ සභාපති - අති උතුම් රායප්පු ජෝශප් හිමි, මන්නාරම රදගුරු
- ★ ලේකම් - ගරු සන්තියාපිල්ලෙයි එමලියානුස්පිල්ලෙයි පියතුමා, මඩු සිද්ධස්ථාන පාලක

# ලී කොටයෙන් ප්‍රතිමා නෙලන කලාකරුවා

**ට්‍රිසිල් ඇෆ්. මැන්දිස් - විල්ලෝරාවත්ත**

ගහට ගහක් හමුවෙන මොරටුවට එන ලී කොටයක් කපා ඉරා කැටයම් යොදා දැව භාණ්ඩ සාදා ඔප මට්ටම් කළ හැකි වඩුවෙකි මොරටුව ලක්ෂපතියේ රේමන්ඩ් ප්‍රනාන්දු මහතා. පාරම්පරික වඩු පවුලක සාමාජිකයකු වන ඔහු දැව භාණ්ඩ නිෂ්පාදනයට අමතරව දැවයෙන් කිතුනු ආගමික ප්‍රතිමා නෙලන්නෙකි.



පසුගියදා ගාලු මුවදොර පිටියේ දී අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති භාග්‍යවත් ජුසේ වාස් පියතුමන් ශුද්ධවරයට එසැවීමේ දේව මෙහෙයේ දී අල්තාරය මත තබා තිබූ දැවයෙන් නිම කළ ශු. ජුසේවාස් මුනිඳුන්ගේ ප්‍රතිමාවේ නිර්මාණකරුවා ඔහුය. මඩු සිද්ධස්ථානයේ දී ශුද්ධෝත්තම පියතුමන්ට තිළිණ කළ අඟල් 20 උසැති මඩු දේව මාතා ප්‍රතිමාවේ නිර්මාණකරුවා ද රේමන්ඩ් ප්‍රනාන්දු මහතා ය.

ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත යන කියමන සනාථ කරමින් දෙවියන් වහන්සේ තමන්ට යම් හැකියාවක් ඇත යන විශ්වාසයෙන් 1975 දී ලෑල්ලක් මත දෙව් මව්ගේ මුහුණ කැටයම් කරමින් දැවයෙන් සුරුවම් නෙලීමේ කලාව ආරම්භ කළ ඔහු ඉන් ලද පන්නරයෙන් තම නිවසේ තබා ගැනීම සඳහා කුඩා ප්‍රමාණයේ දෙව් මව් ප්‍රතිමාවක් ද නෙලීය. එයින් වඩාත් සෑහීමකට පත් වූ රේමන්ඩ් ප්‍රනාන්දු තම ලොකු දුව උපන් 1976 වසරේදී ඇයගේ ක්‍රිස්තියානිය සිදු කළ එවකට කඩලාන මීසම් සේවකව සිටි ගරු ටියුඩර් වනිගසේකර පියතුමන්ට තෑගි කිරීම සඳහා පානක්කා ලීයෙන් කළ අඩියක් උස දෙව් මව් ප්‍රතිමාවක් නිර්මාණය කළේ ය. එය දැකීමෙන් පියතුමා අතිශය ප්‍රීතියට පත් වූ අතර වාර්ෂික මංගල්‍යයට පෙරහරේ ගෙන යෑම සඳහා වූ අඩි 6 ක් උස ශු. අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රතිමාවක් ද පසු කාලයේ දී ඔහු විසින් කඩලාන දෙව්මැඳුරට පරිත්‍යාග කර ඇත.

ශ්‍රමයත්, කාලයත් සුරුවම් නෙලීමේ කලාව වෙනුවෙන් වැය කළ යුතු බව පවසන ඔහු ඒ සඳහා ඉවසීමත් කැපවීමත් අවශ්‍ය බව ද පවසයි. 1996 දී කටුකුරුන්ද මීසමට අයත් මෝදර සා. ජුසේ වාස් දෙව්මැඳුරේ පෙරහරේ ගෙන යෑම සඳහා අඩි හතරක් උස ප්‍රතිමාවක් නිර්මාණය කර ඇති ඔහු එය දෙව්මැඳුරට බාර දීමට නියමිතව තිබූ ජනවාරි 27 වැනි දින ධාරානිපාත වර්ෂාවක් ඇද හැලුන බවත්, අධික වර්ෂාව මධ්‍යයේ වුවද ප්‍රතිමාව වාහනයට පටවා දෙව්මැඳුරට ගොස් ප්‍රතිමාව බාර දීමට වාහනයේ දොර අරින විටම වර්ෂාව නතර වීම ජුසේ වාස් මුනිඳුන් සිදු කළ මහා ප්‍රාතිහාර්යයක් බවත් සඳහන් කළේය.

ප්‍රතිමා නෙලීම සඳහා මහෝගනී දැව කඳන් උපයෝගි කර ගන්නා බව පවසන රේමන්ඩ් ප්‍රනාන්දු මහතා තමන් නෙලූ 100 වැනි ප්‍රතිමාව මඩු සිද්ධස්ථානයේ දී පළමුවන ප්‍රැන්සිස් පාප් තුමන්ට තිළිණ කළ මඩු මාතා ප්‍රතිමාව බව ද සඳහන් කරයි. ප්‍රතිමා සියයෙන් 18 ක්ම ශු. ජුසේ වාස් මුනිඳුන්ගේ ප්‍රතිමා බව පවසන ඔහු විල්ලෝරාවත්ත, රාවතාවත්ත, රත්මලාන, වරාගොඩ, කට්ටුව, නායකකන්ද, බණ්ඩාරවෙල, බල්ලකැටිය, තලෙයිමන්නාරම වැනි ප්‍රදේශයන්හි දෙව්මැඳුරු වලට ඒ ඒ ශුද්ධවන්තයින්ගේ ප්‍රතිමා සහනදායි මිල ක්‍රමයකට හෝ පරිත්‍යාග ලෙස නිර්මාණය කර දී ඇත.

පිදිය යුත්තන් පිදීම පසක් කරමින් දැව මූර්ති කලාව වෙනුවෙන් සංස්කෘතික අමාත්‍යාංශය සංවිධානය කරන රාජ්‍ය සම්මාන උළෙලේ දී 2014 දෙසැ. 14 දින පිදුම් ලබන්නට රේමන්ඩ් මහතා සමත් විය. අම්පිටිය ජාතික දෙව්සත්හලට, මන්නාරම රදගුරු මැදුරට, මඩු සිද්ධස්ථානයට ශු. ජුසේ වාස් මුනි ප්‍රතිමා නිර්මාණය කර බාර දී ඇති රේමන්ඩ් ප්‍රනාන්දු මහතා 1988 සිට මේ සඳහා තමන්ට මාර්ගෝපදේශකත්වය ලබා දෙන මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ව ද, ස්වර්ගස්ථ වූ ගරු ඇලෙක්ස් දසනායක පියතුමන්ව ද ගෞරවයෙන් සිහිපත් කරයි.

සිය බිරිඳ ශිරන්ති සිල්වාගෙන් ලැබෙන සහය අගය කරමින්, දියණියන් තිදෙනකුගේ ආදරය ලබමින්, දරු මුණුබුරන් 9 දෙනකුගේ සුරතල් බලමින් දිවි ගෙවන 69 වැනි වියැති රේමන්ඩ් ප්‍රනාන්දු කලාකරුවාට ප්‍රදීපය තුළින් දීර්ඝායු පතමු.



**ප්‍රේමයේ පවතින්න**

**සසුන් පිය ලංකා ගමනේදී.....** 11 පිටුවෙන්

දකුණු කොරියාවේ සෝල් නගරයේ ශුද්ධෝත්තම පාප් තුමා සංචාරය කළ අවස්ථාවේ දී මවගේ ග්‍රහණයෙන් මිදුන කුඩා දරුවකු රිය පෙරහර මැදින් පාර හරහා යාම හේතුවෙන් සිදුවීමට ගිය භයානක අනතුරක තොරතුරු සම්බන්ධ වතිකාන ආරක්‍ෂක නිලධාරීන් විසින් පොලිස් නිලධාරීන් දැනුම්වත් කර තිබීම ආරක්‍ෂක විධි විධාන වඩාත් තර කිරීමට හේතු විය. මෙම මාර්ගය දෙපස වැඩිපුර බැතිමතුන් එක්රැස් වන ප්‍රධාන මංසන්ධි ආවරණය කිරීම සඳහා මහජනතාව හැසිරවීම සම්බන්ධව විශේෂ පුහුණුවක් ලබා දී තිබූ පොලිස් විශේෂ කාර්ය බලකා පොලිස් නිලධාරීන් 1500 ක් රාජකාරියට යොදවා තිබුණි.

ජනවාරි 14 වන දින ගාලුමුවදොර පිටියේ දී අතිඋතුම් ප්‍රැන්සිස් පාප් තුමන් විසින් පවත්වන ලද දේව මෙහෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ එකම ස්ථානයකට වැඩිම ජනකායක් රැස්වූ අවස්ථාව ලෙසට සැලකේ. ගුවන් ඡායාරූප විශේෂ පරිගණක උපාංගයන් මගින් අධ්‍යයනය කිරීමෙන් පසු මෙදින ගාලුමුවදොරට රැස්වූ මහජනතාව සංඛ්‍යාව ලක්‍ෂ 5 1/2ක් 06ක් අතර ප්‍රමාණයක් බව ගණන් බලා ඇත. මෙම විශේෂ දේව මෙහෙය සුළු හෝ සිද්ධියකින් තොරව පැය 04 ක් පුරාවට පැවතීම සඳහා ආරක්‍ෂක විධි විධාන සංවිධානය කිරීම පොලිසිය ලද මහඟුජයග්‍රණයකි.

පාප් වහන්සේගේ සමස්ත සංචාරය තුළ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්‍ෂක අංශ විසින් ශුද්ධෝත්තම පාප් තුමන් වෙත සපයා තිබූ ආරක්‍ෂාව සම්බන්ධව පාප් වහන්සේගේ ප්‍රධාන ආරක්‍ෂක නිලධාරියා ලෙස කටයුතු කළ ආචාර්ය ඩොමිනිකෝ ගිහානි මහතා ශ්‍රී ලංකාවේ පොලිස් දෙපාර්තමේන්තුවට සිය කෘතඥතාවය පළ කළ අතර 2015.01.15 වන දින ශුද්ධෝත්තම පියතුමන් ශ්‍රී ලංකාවෙන් බැහැරව යාමට ප්‍රථම පාප් තුමන් නැවතී සිටි අපෝස්තලික නිවහනේ සිදු කළ සමුගැනීමේ අවස්ථාවේ දී මෙම සියළුම ආරක්‍ෂක කටයුතු මනා ලෙස සංවිධානය කිරීම ගැන එම ආරක්‍ෂක කටයුතු භාරව කටයුතු කළ ආචාර්ය ගිහාන් මහතා ශුද්ධෝත්තම පාප් තුමන් ඉදිරියේ මා හඳුන්වා දීම වසර 33ක පොලිස් ජීවිතය තුළ ලද ඉහළම ජයග්‍රහණය බව මම සලකමි.

# හලාවත පදවි නව අනුනායක පියතුමා



අතිගරු ප්‍රසාද් චමින්ද ප්‍රනාන්දු පියතුමා හලාවත පදවි අනුනායක ලෙස සලාපුර රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් විසින් පත්කර ඇත.

වර්ෂ 2002 සැප්තැම්බර් 14 දින පූජකවරය ලැබූ එතුමා හලාවත සහ තලවිල මීසම් සහයක ලෙසද සහය පදවි භාණ්ඩාගාරික ලෙසද ඉන්පසුව වනාතවිල්ලුව සහ රාජකදළුව මීසම් සේවක ලෙසද සේවය කර ඇත. රෝමයේ උර්බානියා විශ්ව විද්‍යාලයේ සභා නීතිය පිළිබඳව පශ්චාත් උපාධිය සමත් මෙතුමා හලාවත පදවි විවාහ අධිකරණ උපාධ්‍ය ලෙස වර්ෂ 2013 සිට මේ දක්වා කටයුතු කරයි. 2015 පෙබරවාරි මස සිට උන්වහන්සේ මෙම ධුරයේ වගකීම් බාර ගනු ඇත.

## ළමුන් ඇතුළත් කිරීමේ අයදුම්පත් පාසල් වලින් නිකුත් කරන දිනයන් ඊළඟ සතියේ පුවත්පතේ පළවන බව දන්වා සිටිමු

කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාසල්වල 2016 පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත් නිකුත් කිරීමේ දින පිළිබඳව කතෝලික අධ්‍යාපන කාර්යාලයෙන් නිකුත් කරන දැන්වීම ලබන සතියේ පුවත්පතේ පළවේ.

## නායකකන්ද සා. යුප්‍රේසියා නිවාසයේ කොඩි දිනය 2015 පෙබරවාරි 18 දා

නායකකන්ද සා. යුප්‍රේසියා නිවාසයේ දිවි ගෙවන, තරුණියන්ගේ ජීවිත අර්ථවත් කරලන්නට අප යන මේ දිගු ගමනේ දී අපට සහය වනු සඳහා සෑම වසරකම අළු බදාදා කොඩි දිනයක් පවත්වනු ලබන අතර මේ වසරේ ද ඒ සඳහා දායක වන්නට අපි ඔබට ආරාධනා කරමු. 2015 පෙබරවාරි 18 වන බදාදා ඔවුන් වෙනුවෙන් ඔබ වෙත එන සැමට හැකි අයුරින් ඔබගේ සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

## අගරදගුරු පදවි ළමා දිනය මාර්තු 7 දා

වාර්ෂිකව අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාව මඟින් සංවිධානය කරනු ලබන ළමා දිනය මෙවර ද අභිමානවත්ව පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

2015 මාර්තු 07 සෙනසුරාදා තේවත්ත ජාතික බැසිලිකා සිද්ධස්ථාන පුදබිමේ දී ඒ සඳහා අපගේ දරුවන්ට අවස්ථාව එළඹෙන අතර කොළඹ අගරදගුරු පදවිය තුළ සිටින සියලුම කතෝලික පාසල්, දහම් පාසල්වල දූ දරුවන් ඊට සහභාගි කරවන ලෙස විදුහල්පති තුමන් හා ආචාර්ය මණ්ඩලයේ සැමට ඇරයුම් කර සිටිමු.

6 වන ශ්‍රේණියෙන් ඉහළ ඉගෙනුම ලබන සියලුම කතෝලික දූ දරුවන්ව මෙම අවස්ථාව සඳහා පාසල් නිල ඇඳුමෙන් සහභාගි කරවන මෙන් අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්‍ෂ ගරු දිනේෂ් ප්‍රියශාන්ත පියතුමා දන්වා සිටී.

# සුදුතුම් පියතුමාගේ විශේෂ අමුත්තා



අවුරුදු 102 ක් සපුරන අතිගරු වීටෝ පර්නියෝලා ජේසු නිකායික ඉතාලි ජාතික පියතුමා හමුවට මීගමුව බෝලවලානේදී සුදුතුම් පියතුමන් පැමිණි මොහොත.

# ශුද්ධවූ ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ ශ්‍රී ධාතු වැඩම කරවීම

ඉන්දියාවේ ගෝව නුවර නොදිරා තිබෙන ශු. ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ ශ්‍රී දේහයෙන් ලබා ගත් ශුද්ධවූ ධාතුවක් (චර්ම ධාතුවක්) 2015 පෙබරවාරි 28 සෙනසුරාදා සවස 4.00 ට කොච්චිකඩේ තෝප්පුව මංසන්ධියේ සිට වෙන්නප්පුව උල්හිටියාවේ ශු. ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ දේවස්ථානය කරා වැඩම කරනු ලබයි.

තෝප්පුව මංසන්ධියේ සිට වයික්කාල, බෝලවත්ත, නයිනමඩම, දුම්මලදෙනිය, වෙන්නප්පුව, ප්‍රධාන මාර්ගය දිගේ දර්ශනීය රථ පෙරහරකින් උල්හිටියාව දේවස්ථානයට වැඩම කිරීමෙන් පසු ශුද්ධවූ ධාතුව ස්ථාපිත කිරීමේ දිව්‍ය පූජාවක් පවත්වනු ලබයි. පෙරහර මාර්ගය ඉදිරිපිට ඇති දේවස්ථාන අසල ශ්‍රී ධාතුව රැගත් රථය මද වේලාවක් නවත්වනු ඇත. ශ්‍රද්ධා සම්පන්න ඔබට බැති සිතින් ආරාධනා කරමු. **(උල්හිටියාව මීසම් සේවක පියතුමා ඇතුළු මීසම් සභාව)**

ඥානාර්ථ ප්‍රදීපය ලබන කලාපය තුළින් නැවතත් ඔබව දැනුම්වත් කිරීමට මීසම් සේවක පියතුමා ඇතුළු මීසම් සභාව කටයුතු කර ඇති බැවින් එකී දැන්වීමටත් ඔබගේ අවධානය යොමු කරන්න.

## ශුද්ධෝත්තම පියතුමාගේ ලංකා ගමන

කිතු සමිඳුන් දුන් ඔවදන් පිළි ගනිමින්
සාමයේ සුලන් රොද ලෙන්ගතුකම රැඳෙමින්
සුදුතුම් තුමන් පැමිණෙන ලංකා ගමනින්
බැතියෙන් පිළිගනිමු අප සැම හද බැතියෙන්

ලොවටම සාම පණිවිඩයක් කියා දුනි
සිරිලක් බිමට පැමිණෙන සුදුතුම් පියාණනි
කිතු බැතිමතුන් ආදරයෙන් වැළඳ ගනී
ජාතික සමගියක් සැම දෙන ගෙන් පෙනුනි

සීතල සුළං ගෙවිනත් උඳුවප් මාසේ
අප මව් බිමේ වෙඩිහඬ දෙසවන් තුළ නෑසේ
සාමයේ පරවියන් ඉගිලෙති අද නිල්වන් අහසේ
පියතුමා වඩිනවයි අපගේ සිරිලක් දේසේ

පුදසුන මතින් ඇහෙනා දෙවිඳුගෙ හඬට
සැම ජන කොටසකම දැක්වුනි බැති පෙමට
ලක් දිව තුළට පා නගනා පිය තුමට
අසිරිමත් දේව මංගල්‍යයකි ලක්වැසි සැමට

**පී. ධම්මික දුමේන්ද්‍ර - පාමංකඩ**

## පවුල තුළින් සමාජය ගොඩනගමු

රඹුක්කන මීසම් සේවක ගරු රොෂාන් තිසේරා (පැ.තු.නි.) පියතුමා මෙහෙය වන පවුල් උපදේශන වැඩමුළුව පසුගිය දා රඹුක්කන දේවස්ථානයේ දී පැවැත්විණි. මීසම් සංඝයේ සියලුම වැඩිහිටි ජනතාව මෙයට සහභාගි වීම විශේෂත්වයකි.

මෙහිදී අනුශාසක පියතුමා තරුණ දූ පුතුන් සිටින මව්පියවරුන් ඔවුන්ගේ දුවා දරුවන්ගේ එදිනෙදා දින චර්යාව ඇසුරු කරන මිතුරු හවුල් නවීන තාක්ෂණය හා සන්නිවේදන ක්‍රම මඟින් තම දරුවන් නොමඟ යන අයුරු ඊට යෙදිය යුතු පිළියම් හා දහම් පාසල් අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳව හරවත් වැඩමුළුවක් ඉදිරිපත් කළේය.

මීට අමතරව සෑම මසකම අවසාන සෙනසුරාදා දින පවත්වනු ලබන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභියස පිදෙන මෛත්‍රී භාවනාවට රඹුක්කන මීසමට අනුබද්ධ කෙම්පිට හා හත්බෑව වතු ජනතාව ද එකමුතු වීම විශේෂත්වයකි. ඒ සමඟම යහපත් පවුල තුළින් යහපත් සමාජයක් හා යහපාලන දේශයකට සමාජය යොමුවන බව පවුල් උපදේශන කටයුතු මෙහෙයවන ගරු රොෂාන් තිසේරා (පැ.තු.නි.) පියතුමා තම වැඩමුළුවෙන් අවධාරණය කරන ලදි. **(අසුන්තා බණ්ඩාර ජයමාන්න)**

## චන්ද්‍ර කීර්ති කුලරත්නයන්ගේ "අපි එතෙර වෙමු" පාස්කු නාට්‍යය

අපෙන් සමුගත් ප්‍රවීන නාට්‍යකරු චන්ද්‍ර කීර්ති කුලරත්නයන්ට උපහාර පිණිස ඔහුගේ පාස්කු නාට්‍ය නිර්මාණයක් වන වර්තමාන සමාජ පසුබිම පාදක කරගත් "අපි එතෙර වෙමු" යුගයේ පාස්කු දැක්ම එළඹෙන පාස්කු සමය තුළ දීප ව්‍යාප්තව මීසම් මට්ටමින් ඉදිරිපත් කිරීමට "චන්ද්‍ර කීර්ති කුලරත්න පදනම" කටයුතු යොදා ඇත. මීසම් සේවක ගරු පියතුමාගේ අනුමැතිය ඇතිව විමසන්න.

සඳුන් 0777633580. දයා - 071 8033844, හේමාල් - 0772 285560

**(සි. ආර්. ඩික්සන් ඇන්ටනි)**

## මොරටුව සා. සෙබස්තියන් දහම් පාසලේ විදුහල්පතිනිය සමුගනියි



මොරටුව සා. සෙබස්තියන් දෙව්මැඳුරට අයත් දහම් පාසල් විදුහල්පති ධුරයේ කටයුතු කළ ගරු කැතරින් ප්‍රනාන්දු පැවිදි සොයුරිය සිය සේවාව නිමකොට මඩකලපුව ප්‍රදේශයේ දූත මෙහෙවර සඳහා පිටත්ව ගියාය. වසර දෙකක කාල සීමාවක් විදුහල්පති ධුරයේ කටයුතු කළ එතුමිය ඊට අමතරව සා. සෙබස්තියන් බාලිකා විදුහලේ හා ජයලත් අප ස්වාමිදුවගේ කන්‍යාරාමයේ ද ඉගැන්වීමේ නිරත වූවාය.

සේවාව තුළ එතුමිය වචනයේ පරිසමාප්තයෙන් දහම් පාසල් දරු දැරියන්ටත්, ගුරුවර ගුරුවරියන්ටත් දයාබර මාතාවක් වූවාය. ඉගැන්වීම් කටයුතු පොතට පතට පමණක් සීමා නොකරන්නට ගුරු මණ්ඩලය මෙහෙය වූ ඇය දහම් පාසල් දරු දැරියන්ගේ නිවෙස් බැහැදකිමින් දෙමාපිය සුහදතාවය ගොඩනගාලීමට සමත් වූවාය. විවිධ මානසික ආධ්‍යාත්මික ගැටලු වලට මුහුණ දුන් දරු දැරියන් පමණක් නොව ඊට තුඩු දුන් පවුල් පරිසරයන් ද ගොඩනගන්නට දැඩි ප්‍රයත්නයක් දැරුවෝ ය. ජනතාව අතරට ගොස් සේවය කිරීම ඇගේ සේවාවේ සුවිශේෂී ලක්ෂණයක් විය. විවධ ගැටලුවලට විසඳුම් සෙවීමේ දී ඈ ඉවසීමේ ගුණය මනාව ප්‍රගුණ කළාය. සුවිශේෂී මෙහෙවරකින් අනතුරුව මඩකලපුව ප්‍රදේශයේ දූත සේවාව ඇරඹූ ගරු කැතරින් ප්‍රනාන්දු සොයුරියට දෙව් ආසිරි! **(ප්‍රදීප් සුරවීර)**

## ශ්‍රී ලංකා විවාහ හමුවට නව ජාතික සම්බන්ධිකරණ කණ්ඩායමක්

ශ්‍රී ලංකා විවාහ හමුවේ නව ජාතික සම්බන්ධිකරණ කණ්ඩායම පත් කිරීම පසුගිය දා නයිනමඩම ගොන්සාල්වේස් මධ්‍යස්ථානයේ දී සිදු කරන ලදි.

කුරුණෑගල, රත්නපුර, හලාවත හා කොළඹ යන පදවි නියෝජනය කරමින් විවාහ හමු මෙහෙයුම් සංඝයේ යුවළ මෙම අවස්ථාවට සහභාගි වූ අතර කුරුණෑගල පදවියේ ගරු නිහාල් ඕබ්‍රිස් පියතුමා හා හලාවත පදවියේ ටෙරන්ස් + ඩොනිටා යුවළ ජාතික සම්බන්ධිකරණ කණ්ඩායම ලෙසින් තෝරා පත් කර ගන්නා ලදි.

මේ අවස්ථාව සඳහා විශේෂ දිව්‍ය පූජාවක් සිදුකැරිණි. හලාවත පදවි පවුල් සේවා අධ්‍යක්‍ෂ ගරු අශෝක් ප්‍රියන්ත, කුරුණෑගල පදවි පවුල් සේවා අධ්‍යක්‍ෂ ගරු දොන් ඇන්සලම් යන පියතුමන් ද මෙම අවස්ථාවට සහභාගි වූහ. **(ෂෙල්ටන් ප්‍රනාන්දු)**

# ප්‍රේමයේ පවතින්න

## නොමැකෙන පිය සටහන්





















ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2015 ක් වූ පෙබරවාරි 15 ඉරිදා 149 වෙළුම 37 කලබ සතිපතා පත්‍රය - පිටු 32 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## ප්‍රේමයේ පවතින්න 2



# ජාතික ගීතිකා කණ්ඩායම

වරක් ගැයීම දෙවරක් යැදීමක් බව කතෝලික අප කොයි කවුරුත් හොඳින් දන්නා කරුණකි. එබැවින්ම සසුන් පිය ලංකා ගමනේ පැවැත්වූ දිව්‍ය පූජාවේ ගීතිකා ගැයූ එම කණ්ඩායම අති සාර්ථක ලෙස මෙම කාර්යය ඉටු කළේය. නමුත් ඥානාර්ථ ප්‍රදීපයේ හෝ ළමා ප්‍රදීපයේ හෝ ගීතිකා කණ්ඩායමේ එකදු ඡායාරූපයක්වත් පළ නොවීම කණගාටුවට කරුණකි.

මේ පිළිබඳව විමසා බැලීමේදී. මෙම කණ්ඩායම ගොඩනැගීමටත් පෙර පටන් පැමිණි ගැටලු පිළිබඳව කථා කළ යුතුමය. මෙම කණ්ඩායම තුළ යාපනය, මන්නාරම වැනි දුෂ්කර ප්‍රදේශවල සිට පැමිණි අය සිටියහ. එනම් මුළු මහත් ශ්‍රී ලංකාවේම පුද්ගලයන්ගෙන් මෙය සමන්විත විය.

මෙතෙක් කලක් ශ්‍රී ලංකාව තුළ 'ජාතික ගීතිකා කණ්ඩායම' ක් නොතිබුණි. අගරදගුරු පදවියේ ඇති ඇතැම් ගීතිකා කණ්ඩායම් පමණක් මෙම කර්තව්‍යය ඉටුකරලීමට පොර කෑ අවස්ථාවක, මෙය ඉටු කළ යුත්තේ ශ්‍රී ලංකාවම එකට එක්ව බවත්, ඒ සඳහා සෑම පදවියකින්ම සහභාගි විය යුතු බවත් පෙන්වා දෙමින්, සසුන් පියා තම ලංකා ගමනෙහි පැවැත්වූ දිව්‍ය පූජාවේ අරුත පූර්ණත්වයට පත් කළ මෙම ගීතිකා කණ්ඩායම ගොඩ නැගූ ප්‍රියන්ති මහත්මිය, මේ සඳහා මූලික වී කටයුතු කළාය. එලෙසම ගරු ජූඩ් නික්ලස් පියතුමන්, ගරු එඩ්මන්ඩ් තිලකරත්න පියතුමන්, ගරු ඇලෙක්ස් පියතුමන්, ගරු සුසෙයිනාදන් පියතුමන්, ගරු අරලිය පියතුමන්, ගරු කමල් පියතුමන් සහ තවත් පියතුමන්ලා කිහිපදෙනෙකු මේ සඳහා තම දිවි හිමියෙන් දායක වූහ. ආරම්භයේ සිට අවසානය දක්වා දෙවියන් වහන්සේගේ මැදිහත් වීම තුළ දේව ප්‍රශංසාව හා මනුෂ්‍ය ශුද්ධත්වය පිණිස ගීතිකා ගැයීමට මෙම කණ්ඩායමට හැකි විය. දිව්‍ය පූජාවේ විශාල කොටසක් අරුත් ගැන්වීමට දායක වූ මෙම කණ්ඩායම රැක ගැනීමට වගකිව යුතු සියල්ලන්ම දායක විය යුතුය. ඒ මන්දයත් ශ්‍රී ලංකාවේ කුඩා ස්ථානවල සිටි, සැඟවුණු දක්ෂතා වලින් හෙබි සියල්ලන්ගෙන් පිරී ඇති මෙම කණ්ඩායමට, ජාතියක් ලෙස ලෝකයට මුහුණ දීමට සියලුම සුදුසුකම් සපුරා තිබෙන බැවිනි.

අගරදගුරු වසම් පදවියේ සිසුන් තෝරා ගැනීමේදී ද විශේෂ තරගයක් පැවැත්විය. එයත් සාමාන්‍ය රජයේ කතෝලික පාසල් වලිනි. මෙවැනි අති ශ්‍රේෂ්ඨ තීරණ ගත්තාවූ ප්‍රියන්ති සෙනවිරත්න මහත්මියට හෘදයාංගම ස්තූතිය පුදුකර සිටිමු. මේ ආකාරයට සුදුතුම් පිය ශ්‍රී ලංකා සංචාරයේ පැවැත්වූ දිව්‍ය පූජාවේ ගීතිකා ගැයූ කණ්ඩායමට මෙලෙස සැළකීම බලවත් කණගාටුවකි. මාස ගණනාවක සිට පුරුදු පුහුණු වී, අවසන් දවස් කිහිපය නේවාසිකව සිටිමින්, විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරමින් මෙම කාර්යය ඉටුකරන ලදි. දිව්‍ය පූජාව සජීවිව පෙන්වන අවස්ථාවේදී ද ගීතිකා කණ්ඩායම මඳ වශයෙන් පෙන්වීම සැළකිය යුතු කරුණකි.

මෙමම කාරණාව පිළිබඳව දෙවරක් සිතා බලනමෙන් ඉල්ලා සිටිමි. ජනවන්දනාව අරුත් ගැන්වීමට දායක වූ ප්‍රියන්ති මහත්මියද, රොහාන් මහතාද ඇතුළු පිරිසට ද, ලාල් මහතා ද ඇතුළු වාද්‍ය වෘන්දයටද, සියලුම ගරු පියතුමන්ලාට ද, සෑම කටයුත්තක් සඳහාම උපකාර කළ තිලක් මහතාද ඇතුළු පිරිසටද, නන් අයුරින් උපකාර කළ සියලු දෙනාටම ද මාගේ හද පිරි උත්තමාචාරය පුදන අතර මෙවන් වූ කාර්යයන් රැසක් ඉටුකරලු පිරිසට දෙව්මව් පිහිටාශිර්වාදය ලැබේවා!

**නිර්මලී සෙනෙවිරත්න**
කඩවත

# අතිඋත්තම ප්‍රැන්සිස් සුදුතුම් පිය ලංකාගමනේ ගුවන් විදුලි වැඩසටහන්

## ශ්‍රී ලංකා ගුවන් විදුලියේ කාර්යභාරය

ක්‍රිස්තු චරිතය ඇසුරෙන් සංගීත සංධ්වනියක් නිර්මාණය කර විශේෂ උත්සවයක් පවත්වා එහි සංයුක්ත තැටිය අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන් වෙත පිළිගන්වා සසුන් පිය ලංකා ගමන පිළිබඳ වැඩසටහන් ආරම්භ කිරීම.

ප්‍රචාරය කරන ලද වැඩසටහන්

1. අතීත ශුද්ධෝත්තම පියතුමන්ගේ ජීවන චරිතය සහ එතුමන් විවිධ අභියෝගයන්ට මුහුණදෙමින් කිතු දහම ලොව පුරා ස්ථාපිත කළ අන්දම විමසා බැලූ වැඩසටහන් මාලාව
2. අතිඋතුම් ප්‍රැන්සිස් වත්මන් සසුන් පිය චරිතය අළලා ඉදිරිපත් කළ වැඩසටහන් මාලාව
3. 1970 දෙසැම්බර් 04 වැනිදා සහ 1995 ජනවාරි 20-21 දිනයන්හි ශ්‍රී ලංකාවට වැඩම කළ අතිඋතුම් සවැනි පාවුළු හා අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියාණන් මෙරට සංචාරය කළ අවස්ථාවල විකාශනය කළ සජීවි විස්තර ප්‍රචාරක වැඩසටහන් ඇසුරෙන් සංස්කරණය කර නිපදවූ වැඩසටහන් මාලාව
4. අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පිය ලංකා ගමන නිමිත්තෙන් නිර්මාණය කළ කෙටි දැන්වීම් ප්‍රචාරය කිරීම
5. ශ්‍රී ලංකා ගුන් විදුලි සංස්ථා ප්‍රවෘත්ති ප්‍රචාරයන් ඔස්සේ සසුන් පිය ලංකා ගමන පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරිම
6. විවිධ සම්පත් දායකයන්ගේ හඬ කොටස් රැගෙන සසුන් පිය සංචාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ප්‍රචාර සිදුකිරිම
7. සුබාරති වැඩසටහන සසුන් පිය ලංකා ගමන පිළිබඳ සාකච්ඡාමය වේදිකාවක් තනා දීම
8. නත්තල් සමයේ වැඩසටහන් ඔස්සේද සසුන් පිය ලංකා ගමන ගැන ප්‍රචාරය කිරීම
9. සසුන් පියා මෙරටට වැඩම කිරීමේ මොහොතේ සිට දිවයිනෙන් බැහැරව යන මොහොත දක්වා සජීවි වැඩසටහන් ප්‍රචාරය කිරීම

**ජූඩ් අයිවන්**
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

## වතිකාන ගුවන් විදුලියේ කාර්යභාරය

අප හැමෝම ආදරය කරන, කාගෙත් ජනාදරයට පාත්‍රවූ අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්, ලක්දෙරණට සම්ප්‍රාප්තවීමට දින කීපයකට පෙර වතිකාන ගුවන් විදුලිය නියෝජනය කරන කණ්ඩායම අප දිවයිනට පැමිණියහ. සය දෙනෙකුගෙන් යුත් මෙම පිරිසට ගරු පියතුමන් දෙදෙනෙක් ද ඇතුලත් වූහ. ඔවුන්ගේ මෙම කාර්ය භාරය වඩා පහසුකිරීම සඳහා අධි තාක්ෂණික සම්ප්‍රේෂණ උපකරණ ද භාවිත කළහ.

සුදුතුම් පිය ලංකාගමනයේ මාධ්‍ය අංශ භාරව කටයුතු කරන ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්, අතිගරු සිරිල් ගාමිණී පියතුමන්. ගරු ට්‍රැවිස් ගේබ්‍රියෙල් පියතුමන් ගිහි සැදැහැවතුන් කීපදෙනෙක් මෙම අවස්ථාව සාර්ථක කරගැනීමෙහිලා උපරිම සහය දැක්වූහ. සුදුතුම් පියාණන්ගේ ලංකාගමනයේ සෑම සිදුවීමක්ම එසැනින් භාෂා 46 කින් ලොව පුරා විසුරුවා හැරීමට ඔවුහු කටයුතු කළහ. මෙම කාර්යයේදී තොරතුරු රැස්කරගනු සඳහා අපෝස්තලික තානාපති කාර්යාලය අගරදගුරු මැඳුර තදාසන්න දේවස්ථාන හා අගනුවර ඇතැම් ස්ථාන වෙත ඔවුහු යොමුව සිටියහ.

සුදුතුම් පිය ලංකාගමනය පිළිබඳ අතිඋතුම් කාදිනල් හිමිපාණන්, රදගුරු හිමිපාණන්, ගරු පූජක තුමන් ඇතුළු සාමාන්‍ය ජනතාවගේ අදහස් හා මතවාදයන් ලොව පුරා අසන්නන්ගේ ශ්‍රවණය සඳහා යොමුකර තිබුණි. මෙම ඓතිහාසික උත්සව අවස්ථාවට අධ්‍යාත්මිකව හා බාහිර වශයෙන් සූදානම් වූ ශ්‍රී ලාංකිය කිතුනු ජනතාව හා අන්‍යාගමිකයින් දැක්වූ සුහදතාවය පිළිබඳ වතිකාන නියෝජිත කණ්ඩායම දැක්වූයේ ස්තුති පූර්වක උණුසුම් ප්‍රතිචාරයකි.

**නොයෙල් ශාන්ත ප්‍රනාන්දු**
පානදුර

**"සමිඳුන් උතුම්ය. උන්වහන්සේට බොහෝ පැසසුම් හිමිවිය යුතුය" (ගීතාවලිය 96: 1-4 )**



## ප්‍රේමයේ පවතින්න

# පැවිදිවරියන්ගේ බඳුනින් ගිහියන්ට සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම තහනම් ද?

"ප්‍රේමයේ පවතින්න" යන වදනින් පරිසමාප්ත අයුරින්ම සුදුතුම් පියා ශ්‍රී ලංකාවට සැපත් වී ගාලුමුවදොර පිටියේ ජුසේ වාස් පියා ශුද්ධවරයට එසැවීමේ දිව්‍ය මෙහෙයේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීමේ අවස්ථාවේ දී සිදුවීමක් මෙසේ ගෙනහැර පාමි.

එදින එක් එක් අංශ සඳහා ස්ථාන වෙන්ව තිබූ පැවිදිවරියන් එකම කොටසක පූජාව ආරම්භයේ සිටම ගිහි කාන්තාවන් කිහිප දෙනකු ද ඒ අතර සුහදශීලී සාමූහිකව දිව්‍ය පූජාවට සහභාගි විණි.

විවිධ ප්‍රදේශ නියෝජනය වූ නිසා මා ඉතා දන්නා හඳුනන පැවිදිවරියන් දිගුකලකින් හමුවීම ද සතුටක් විය. දිව්‍ය සත්ප්‍රසාද ලැබීමේ අවස්ථාව උදා විය. පැවිදිවරියෝ කිහිප දෙනකු දිව්‍ය සත්ප්‍රසාද ලබා දීමට සැමගේ පහසුව තකා තැනින් තැන සිටියා ය. ගිහි පැවිදි භේදයකින් තොරව වෙනත් ස්ථානවල සිටි අය පවා සත්ප්‍රසාද ලැබීමට එතැනට පැමිණියේ තදබදයකින් තොරව පැමිණීමට පහසු නිසා යයි පෙනුණි. මැදිවිය ඉක්ම වූ කාන්තාවන් සහ වයස්ගත පුරුෂයින් ද දෙතුන් දෙනකු තරුණ පැවිදිවරියක් ළඟට සත්ප්‍රසාද ලැබීමට පැමිණි විට "ගිහි අය වෙන තැනකින් ලබන්න" යැයි එතුමිය පැවසූ හඬ අසළ සිටි සැමගේ සවනත ද වැකුණි. ඇය ජේසු නොලබා හැරෙන්නට යනු දුටු විට ක්ෂණයකින්ම අප අතර සිටි කෙනෙක් වයසක ඇය අල්ලාගෙන වෙනත් පැවිදිවරියක් සත්ප්‍රසාද බෙදන තැනකට යොමු කළා ය. ඒ අනුව අන් අය ද එහි ගියහ. මේ ස්ථානයේ ම එම නිකායේ ම තවත් පැවිදිවරියක් ගිහි පැවිදි භේදයක් නොමැතිව දිව්‍ය සත්ප්‍රසාද ලබා දුන් අයුරු අගය කළ යුතුමය.

පවුල් හා පැවිදි වසරේ මෙවන් සිදුවීම් කාලෝචිත නොවේ. මෙසේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට පැමිණිවිට නැවත හරවා යැවීමෙන් යම් හෝ පවක් සිදුවේ නම් එය කවුරුන් හට ද? තරුණ පැවිදිවරියන් මෙලෙස හැසිරීම තවත් අභාග්‍යයකි.

යහපත් වූ පවුල් පරිසරවලින් බිහිවන පූජක, පැවිදි ගිහි සැවොම තුළ උසස් මානුෂීය ගුණාංග වර්ධනයක් කුමන තරාතිරමක සිටියද විද්‍යාමාන වේ. අප දැසින් දුටු සුදුතුම් පියාගේ නිරෝගී බව හා ක්‍රියා කලාපයන් ඇසෙන දකින සැමට විස්මය දනවන සිදුවීම් වුවද ඒ නම් සැබෑ කිතු හිමි ප්‍රේමයයි. කුඩා කල සිට පෝෂණය වූ දයාව යි. මෛත්‍රියයි යන්න පැහැදිලිවේ.

**ටෙස්මා රෝස් ශ්‍රියන්ති පෙරේරා**

## අප ආදර සසුන් පියේ

අතිඋතුම් ෆ්‍රැන්සිස් සුදුතුම් පියාණන්ට
සසුන් පියේ ඔබ වැඩියේ සිරිලකට
සමිඳු මිදි උයනේ එක් දූත කාර්යයක්
ඉටු කිරීමට
ජුසේ වාස් පියතුම එසවීමට ශුධවරයට
එමගින් කිතු දන සැමට ලැබුණා වරම්
දෙව් යාගයේදී දැක ගන්නට
ඔබතුමන් සියැසින්!
නෙක බාධා දුක් කම්කටොලු මැද
දෙස් විදෙස් ජන ගඟ ගැලුවා ගාලු මුවදොරට
දැකුමෙන් පියේ ඔබ සිටියා වැඩම කර
සිතුණා මේ ජීවමාන දෙව් සමිඳුන්ම
යැයි මට!
නිම කරමින් ඔබතුම සියල් මෙහෙවර
යළිඳු හැරයන විට අප පුංචි දිවයින
තවත් දේශයක් බලා සිටියා ඔබ පිළිගන්නට
පසක් කර ගත්තෙමි
ඔබ අයිති බව ලෝ දනට
සඟවා ගෙන නෙතු කඳුලැලි මම!

**ෂන්දිකා මුතුගල**
කඩවත

# සසුන් පිය ලංකා ගමනේ සමහර සමරු සිහිවටන සුබදායි නොවේ

2014. 11. 02 "ඥානාර්ථ ප්‍රදීපය" **පුවත්පතේ අවසන් පිටුවේ සසුන් පිය ලංකා ගමනේ "මූල්‍ය කමිටුව" මඟින් පළකර තිබූ වෙළෙඳ දැන්වීම පිළිබඳවයි.**

ශ්‍රී ලංකා රදගුරු සම්මේලනයේ පූර්ව අනුමතියට යටත්ව ඉහත කමිටුව මඟින් අප සසුන් පියාණන්ගේ ශ්‍රී ලංකා ගමන අළලා "සමරු සිහිවටන" කිහිපයක්ම එළිදක්වා තිබීම සහ එහි අලෙවිය සඳහා පූර්ණ බලයලත් අලෙවි නියෝජිත දෙපලක් පත් කර තිබීම පිළිබඳව ප්‍රශංසා කළ යුතු අතර එම සමරු සිහිවටන වලින් සමහර භාණ්ඩ කිහිපයකට අප ශුද්ධෝත්තම පියාණන්ගේ පින්තූරය යොදා ගැනීම එතරම් ශුභදායි දෙයකැයි සිතීම උගහටය.

එළිදක්වා ඇති සමහර සමරු සිහිවටන වැඩිහරියක් නිවසක තබා ගැනීමේ වටිනාකමක් මෙන්ම ආධ්‍යාත්මික අගයක් ඇති භාණ්ඩ බව කිවමනාය. එහෙත් තවත් කීපයක් සසුන් පියාණන්ගේ පින්තූරය යොදා නිෂ්පාදනය කිරීම ශුභ දායි නොවන බව මට හැඟේ. කෙතරම් සීමා බාධක පැනවූවත් තහංචි දැමුවත් වෙළෙඳ පොළට අයථා ක්‍රම වලින් මෙම භාණ්ඩ පැමිණීම නවතාලිය හැකි ජගතෙක් නොමැත. මෙම සමරු සිහිවටන හොරට නිපදවා හොර පාරේ නිරායාසයෙන්ම වෙළෙඳපොළ වෙත පැමිණීම ඒකාන්තය. රට පුරා හතු පිපෙන්නාක් මෙන් මෙවැනි භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන ද ඕනෑ තරම් තිබේ. මූල්‍ය කමිටුව මඟින් මිල නියමයකට යටත්ව මෙම සමරු සිහිවටන අදාළ අලෙවි නියෝජිතයින් වෙත ලබා දී තිබුණත් වැඩි මිල ගණන් යටතේ මෙම සිහිවටන වෙනත් අලෙවිකරුවන් විසින් අලෙවි කරන බව ස්ථිරය.

මා මේ ලිපියෙන් මතු කරන්නේ කලින් ද සඳහන් කර ඇති පරිදි අප සුදුතුම් පියාණන්ගේ ඡායාරූපය සමහර සමරු සිහිවටන වලට යොදා තිබීම කණගාටුදායක සිදුවීමක් වන්නට ඉඩ ඇති බවයි. එතුමාගේ සේයාරුව සහිත දින දර්ශනයක් මුද්‍රණය කර තිබීම කාලෝචිතය.

**වින්සන් ලියනගේ**
කලමුල්ල

# ජාති ආගම් භේදයකින් තොරව පිළිගත්තා

**ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවට වර්ෂ 2015 ජනවාරි මාසය කිසිදා අමතක නොවනු ඇත. ඒ මේ මාසයේ තුළ සිදු වූ විශේෂ සිද්ධීන් නිසාය.**

වසර ගණනාවක් පාලනය කළ ජනාධිපති පරදා නව ජනාධිපතිවරයෙක් පත්කර ගැනීමට හැකි වීම නිසා දේශපාලන පෙරළියක් ඇතිවීම එක් හේතුවකි. එසේම ශ්‍රී ලාංකික ජනතාවට විශේෂයෙන් කතෝලික ජනතාවට ජනවාරි මස 13, 14, 15 දිනයන් ඉතා ආශිර්වාද ලත් ප්‍රීතිමත් වාසනාවන්ත දිනයන් ලෙස කිසිදා අමතක නොවනු ඇත. මුළු විශ්වයේම කතෝලික ජනතාවගේ නායක එඬේරාණන් වූ අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් අප කුඩා දිවයිනට වැඩම කර දින තුනක් රැඳී සිට ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයාණන් ලෙස අප හඳුන්වන භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමා ශුද්ධවරයට එසැවීම ජනවාරි 14 දින ගාලු මුවදොර පිටියේ පැවැත් වූ දිව්‍ය පූජා යාගයේ දී ලක්ෂ හයකට වැඩි ජනතාවකගේ ප්‍රීති ඝෝෂා සීනු හඬ මැද සිදු කළ ඒ ඓතිහාසික මොහොත කිසිදා අමතක නොවේ.

මේ අවස්ථාවට ජාති ආගම් භේදයකින් තොරව ජනතාව ඉතා ගෞරවයෙන්, භක්තියෙන් සන්සුන්ව ඒ මෙහෙයට සහභාගි වීම, එතුමාණන් සිරිලකට වැඩම කළ මොහොතේ සිටම මහත් හරසරින් පිළිගැනීම ගැන අප ඒ සියලුම ජනතාවට ස්තුති කර සිටිමු. ජනාධිපතිවරණය අවසන් වී දින කීපයක් වුවද රටේ සියලුම ජනතාව සන්සුන්ව සාමයෙන් මේ උතුම් අවස්ථාවට එක් වීම අප සැම අගය කළ යුතුය. නව ජනාධිපතිතුමා ඇතුළු රාජ්‍ය නායකයින්, ආගමික නායකයින් අප සුදුතුම් පියාණන් සාදරයෙන් ගෞරවයෙන් පිළිගැනීම මේ ඓතිහාසික ගමන ඉතා සාර්ථක කර ගැනීමට මහත් කැපවීමකින් සේවය කළ ත්‍රිවිධ හමුදාවට ද කතෝලික අපගේ අවංක ස්තුතිය පුද කර සිටිමු.

**ඩොරින් පෙරේරා**
මොරටුව

# ජේසු දැකගත්තා වගේ සතුටක්!

**සැමගේ කතා බහට ලක් වූ ආදර්ශවත් සැබෑ එඬේරාණන් දැකගන්නට ලැබුන ශ්‍රී ලංකා වාසී අප කොතරම් භාග්‍යවන්ත ද? කරුණාබර දෙවිපියාණන්ට ප්‍රශංසා වේවා.**

මුව පුරා විසිරී ඇති ඒ අහිංසක කරුණාබර මුහුණ (සේයාරූ වලින් පමණක් දුටු) ජීවමානව සමීපව දැකගත් මා කෙතරම් වාසනාවන්ත ද? අනේ එතුමාගේ සිනහව, කතාවෙන් පමණක් නොව එතුමාගේ ඒ සිනාවෙන්ම එතුමාගේ කරුණාව, ජේසු සමිඳුන්ගේ චරිතයම සැමට දැකගන්නට ලැබුණි. මෙම ගමනට එතුමාට ආරාධනා කළ සුදු සබයේ සියලු දෙනාටත්, අනිකුත් නායකයින්ටත් සියලුම රූපවාහිනී මාධ්‍ය වලටත් අපගේ හද පිරි භක්ති ප්‍රණාමය පුද කරමු.

ජනවාරි 13 වැනිදා රාත්‍රී 12.00 ට ගාලුමුව දොර එම ස්ථානයට ගොස් පසුවදා අති උතුම් සුදු පියාණන් එම ස්ථානයෙන් සමුගන්නා තුරු, රාත්‍රියේ සීතලේ ගැහෙමින්, පසුවදා ගිනි අව්වේ සිටියේ එම ජීවමාන සාන්තුවරයා සැබවින්ම දැක ගැනීමටයි. එම අවස්ථාව මට උදා කර දුන්නේ මගේ බාල සොයුරිය මගේ රෝගී මව බලා ගන්නා බවට පොරොන්දු වූ නිසයි. එලෙසම ගරු ලියෝ ෆෙඩ්රික් පෙරේරා පියතුමාගේ සොයුරියගේ කාරුණික බව නිසාම වාහනයකින් එහි යාමට මට ආරාධනා කළ නිසයි. මා මේ ගමන යාමට ඉතා ආශාවෙන් ශු. ජුසේ වාස් මුනිඳුන්ට මා යාච්ඤා කළ නිසාත් ජේසු සමිඳුන් මගේ අහිංසක ඉල්ලීමට සවන් දුන් සේක.

ඇත්තෙන්ම සියලුම රූපවාහිනී මාධ්‍ය වලින් එහි යාමට නොහැකි රෝගී අයට කළ සේවය ඉතා ප්‍රශංසනීයයි. මා නිවසට එන විටත් සියලු දෙනාම (අම්මා ඇතුළු) පැවසුවේ "ඔයා මුදල් ගෙවාගෙන බලන්න ගියා අපි නොමිලේම නිවසේ සිටම සුදු පියාණන්ව බලාගත්තා" කියායි. ශ්‍රී ලංකාවෙන් දුරු රටක් වන රෝමයට යා හැක්කේ ධනවතුන්ට පමණකි. ශ්‍රී ලංකාවේ අප ළඟටම එතුමාණන්ව කැඳවීමට ආරාධනා කළ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණනි, අපගේ හද පිරි භක්ති ප්‍රණාමය ඔබවහන්සේටයි. කවුරු කොහොම කීවත් ඔබවහන්සේගේ ආරාධනය නොලැබුණා නම් මේ උතුම් අවස්ථාව අපෙන් ගිලිහී යනවා නොඅනුමානයි. එහි රැස් වූ ජනතාවගේ මුවින් ගිලිහුණු වචනයක් මා මතකයේ රැඳෙනවා පමණක් නොව මාද එය අනුමත කළෙමි.

"ජේසු දැකගත්තා වගේ සතුටුයි" එතුමා කොතරම් පීඩාවට පත්ව සිටියත් ඒ ලස්සන සිනහව, ශ්‍රී ලංකාවෙන් සමුගන්නා තුරුම ගිලිහී නොගිය බව අප දුටු දෙයකි.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**
බදුල්ල

## සිරිලක සුදුවරයාණෝ.!

විසි පස් වියෙහිදි පූජක වර ලද ජුසේ වාස් ගරු පිය සඳුනේ
රිසි වී දෙව්මව්ගේ වහලෙකු සේ ලේ අත්සන තැබුනේ
නිසි කල නිම කර දවසේ මෙහෙවර යැදුමෙහි තම සිත රඳවමිනේ
දිසි හැම මොහොතෙම ජන මන සැනහු සාමය හදවත ගෙන එමිනේ

සිත් සනහාලන සුපුවත රස කර දෙසුමට දස්කම දැක්වූයේ
මෙත් කරුණා පිරි සෙනෙහස බෙදමින් පීඩිතයින් සැම සැනහූයේ
නෙත් අඳවුන් සේ නොමඟට යොමුවුණු කොයි කාටත් යහමඟ පෑයේ
ගත් තැත අරුමැයි දේව වදන් මැද මනු සිත් මොනවට සරුවූයේ

නැණ මඳ පිරිසක් මෙතුමාණන් මරු තුරුලට යවනට තැත් දැරුවෝ
දැන එතුමා සැරයටියත් සිටුවා පොළොවේ දෙව් යැදුමක් පිරුවෝ
දුණ නැමි පොළොවෙන් ඉහළට තුන් දිය උල්පත් සැණෙකින් පැන නැගුවෝ
පැන යනු නොහැකිව මරුවෝ සමාව ඉල්ලා පාමුල වැද හැඬුවෝ

දළ පිළි කඩ ඉන වට රඳවා ගෙන යාචක වෙස් ගෙන පිය නැගුවේ
හෙළ බිම දන හට කිතුමඟ හෙළිකර සග පුර යන්නට යොමු කෙරුවේ
පෙළ හර පාමින් කඳුරට රජ සිත් දිනා ගන්න දෙව් වරමක් පිරුවේ
මිළ කළ නොහැකිය සාන්තුවර ඔබ සාහිත අඹරක ගුරු තරුවේ

**කැතරින් ගුණවර්ධන**

## පිළිගතිමු සසුන් පියාණන්

පිළිගනිමු අප සුදුතුම් පියාණන්
ප්‍රැන්සිස් පියෙනි අපගේ පර්වතය ඔබ
මුළු ලොව දෙනෙත් ඔබ වෙත යොමුවෙලා ඇත
ජුසේ වාස් මුනි සුදුවර ඔස වන්න
ලක් මව බලා සිටියා ඔබ පිළි ගන්න

ජුසේ වාස් මුනි තුමා සුර පුරේ සිට
මැදහත් වෙනව ඔබ වෙනුවෙන් දෙවිඳුනට
කතෝලික නායක තතු පෙන්වන්නට
සාමය සමාදානය පතුරා ලන්ට

එන්න එඬේරාණෙනි සැරයටිය ගෙන
ලක්බිමෙ පා තබා සාමෙන් පුරවන්න
ලංකා බැටළුවන් වටකර ගන්න
සුරත ඔසවලා ආසිරි ගන්වන්න

දෙව් පිය බලෙන් දිගුකල් ඔබ දිනේවා
නිරෝගී සුවය ඔබහට ලැබේවා
එඩිතර එඬේරා මුළු ලොව බැබලේවා
ඔබගෙන් ලොවම එක් සේසත් වේවා

**අයිරින් කොස්තා**
ජාඇල

# සුදුතුම් පිය ශ්‍රී ලංකා ගමනේ මාධ්‍ය මෙහෙයුම

**ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි. පියතුමා** - රූපවාහිනී මාධ්‍ය කමිටු ප්‍රධානී

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් සුදුතුම් පිය ශ්‍රී ලංකා සංචාරය පිළිබඳ නිල නිවේදනය මාධ්‍යයට හෙළි කරමින් 2015 ජන. 13 දින සුදුතුම් පියාණන් ශ්‍රී ලංකාවට පැමිණෙන බව ප්‍රකාශ කරන ලදී. එදා සිට ගමනාන්තය දක්වා කාල පරාසය තුළ මාධ්‍ය කාර්යාංශයේ රූපවාහිනී මාධ්‍යයේ භාරකාරත්වය අප වෙත පැවරිණි. කාදිනල් හිමිපාණන් ඇතුළු රදගුරු මණ්ඩලය, කිතුනු ජනමාධ්‍ය ජාතික අධ්‍යක්ෂ ගරු සිරිල් ගාමිණී පියතුමන් අප කෙරෙහි තැබූ විශ්වාසය මත එම භාරධූර වගකීම නිසි අයුරින් ඉටු කිරීමට ලැබීම ගැන මගේ කෘතඥ පූර්වක ස්තූතිය පුද කරමි.

ආරම්භයත් සමඟම ඊට සමගාමීව රූපවාහිනී, ගුවන් විදුලි, සමාජ වෙබ් අඩවි හා මුද්‍රිත මාධ්‍යයන් හා සංසන්දනය කිරීමේ දී රූපවාහිනී මාධ්‍ය ප්‍රේක්ෂක ආකර්ෂණය වඩාත් යොමුවන මාධ්‍යයක් හෙයින් ප්‍රේක්ෂක ප්‍රසාදය දිනා ගනිමින් එය හැසිරවීම අභියෝගාත්මක ක්‍රියාවක් විය. එම නිසාම ශ්‍රී ලංකාවේ ප්‍රවීන සිනමා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරුන්ගෙන් ද ප්‍රධාන රූපවාහිනී නාලිකා ප්‍රධානීන්ගෙන් ද, රූපවාහිනී ක්ෂේත්‍රයේ දක්ෂතමයන් ගෙන් ද සමන්විත කමිටුවක් ඒ සඳහා පත්කර ගැනුණි. එය අපට ශක්තියක් වුණි. කමිටු සාමාජිකයන් වූයේ බර්ට්‍රම් නිහාල්, සුනිල් කොස්තා, රන්ජුල සේනාධීර (රූපවාහිනී), අජිත් ජයවර්ධන (ස්වාධීන රූපවාහිනී), ප්‍රියන්ත විජේසිංහ (සිරස), මිලන් ද සිල්වා (වර්බුම්) හා ඔගස්ටින් මනතුංග මහත්වරුන් ය.

සසුන් පිය ගමන පිළිබඳ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ නිල නිවේදනයත් සමඟ සියලු සැලසුම් ආරම්භ කළ අතර 2014 නොවැම්බර් මාසයේ භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමන් සාන්තුවරයට එසැවීම ද පාප්තුමාගේ සංචාරයට සමගාමීව සිදුකෙරෙන බව සභාව නිවේදනය කිරීමත් සමඟ අපගේ සැලසුම්වල අගය වැඩි විය. ඒ සඳහාම වූ සුවිශේෂී මෙහෙවරක් කිරීමට සිදුවීම නිසා ඒ සඳහා අමතර වෙහෙසක් දැරීමට සිදුවුවද එය පැකිලීමකින් තොරව කමිටු සාමාජිකයින් බාර ගාත්තේ අප ලද මහඟු වරප්‍රසාදයක් ලෙසිනි.

සැලසුම් - ★ සිංහල සහ දෙමළ බසින් රූප රාමු සහිත තේමා ගීතයක් නිර්මාණය කිරීම, ★ දීප ව්‍යාප්ත වාර්තාමය කෙටි චිත්‍රපට තරගයක් පැවැත්වීම, ★ අති උත්තම ෆ්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ ජීවන තොරතුරු ඇතුළත් කෙටි චිත්‍රපටි මාලාවක් සකස් කිරීම, ★ වතිකානයෙන් ලබා ගන්නා ලද පාප්තුමාගේ දර්ශන රැගත් නිල දැන්වීම් වලින් උපුටා ගන්නා ලද රූප ඇතුළත් කෙටි රූප රාමු පෙළක් නිර්මාණය කිරීම, ★ කාදිනල් හිමි, රදගුරුතුමන්, ධර්මධර පියවරුන්, ක්ෂේත්‍ර ප්‍රවීනයන්ගේ සහභාගිත්වයෙන් සජීවී රූපවාහිනී වැඩසටහන් මාලාවක් විකාශනය කිරීම, ★ හරවත් ආගමික චිත්‍රපටි රූපවාහිනී මාධ්‍ය හරහා ප්‍රදර්ශනය කිරීම, ★ අති උතුම් සවැනි පාවුලු සහ අති උතුම් දෙවන ජුවාම් පාවුළු සුදුතුම් පියාණන්ගේ ශ්‍රී ලංකා සංචාරයන් අළලා වාර්තාමය චිත්‍රපටි දැක්මක් ඉදිරිපත් කිරීම.

ඉහත සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මූලික අභියෝගය වූයේ ඒ සඳහා අනුග්‍රාහකයන් සොයා යැමයි. දේවාශිර්වාදයෙන් මොබිටෙල් ආයතනය ඒ සඳහා ඉදිරිපත් වීම අප ලද ජයග්‍රහණයකි. එම නිසාම පාප්තුමාගේ පැමිණීමට පෙර ඉරිදා පෙ.ව. 10.00 - 10.30 දක්වා වාර්තාමය චිත්‍රපටි 10 ක් විකාශනය කිරීමට හැකිවිය. මෙම කටයුත්තේ දී ඉතා භාරධූර කාර්ය වූයේ භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමන් ශුද්ධවරයට එසැවීම නිමිත්තෙන් උන්වහන්සේගේ ජීවන චරිතය අලලා කෙටි චිත්‍රපටයක් නිර්මාණය කිරීමයි. එහි රූගත කිරීම් සඳහා හත් දෙනකුගෙන් සමන්විත අප කණ්ඩායම ඉන්දියාව, බැංගලෝරය, මැන්ගලෝරය සහ ගෝව යන ප්‍රදේශවලට ගොස් ජුසේ වාස් පියතුමන් ජීවත් වූ පරිසරය හා අසල්වාසින් සමඟ කරන ලද සංවාද රූගත කරන ලදි. මේ සඳහා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශයෙන් ලද දායකත්වය අගය කළ යුතුය.

සුදුතුම් පියාගේ පැමිණීමට පෙර දින තුනක් සහ ශ්‍රී ලංකාවේ රැඳී සිටි දින තුන ද ඇතුලුව දින 6 ක් විශේෂ නාලිකාවක් ඔස්සේ ජුසේ වාස් පියතුමා ශුද්ධවරයට එසැවීමේ පුරාවෘත්තය ඇතුළත් දර්ශන විකාශය කිරීමට පියෝ ටී. වී. ආයතනය කැමැත්ත පළකර තිබුණි. පදවි මට්ටමින් ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර දැවැන්ත ඩිජිටල් තිර සපයමින් සහය දැක්වූයේ මොබිටෙල් ආයතනයයි.

තේවත්තේ අප ස්වාමිදුවගේ ජාතික බැසිලිකාවේදී අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දින 100 ක ආධ්‍යාත්මික වැඩසටහනක් ක්‍රියාත්මක විය.

2015 ජන. 13 සිට 15 දක්වා රූපවාහිනී මාධ්‍යයන් හරහා විවිධ සජීවී සංවාදාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි නිරත ගරු පූජකතුමන්ව සහභාගි කර ගැනිණි. අති උතුම් සුදුතුම් පියාණන් මව්බිමට සැපත් වූ මොහොතේ සිට සමුගන්නා මොහොත දක්වා, ★ කටුනායක ගුවන් තොටුපල, ★ කටුනායක - කොළඹ වීථි සංචාරය, ★ ජනාධිපතිතුමා හමුවීම ජනපති ලේකම් කාර්යාලය, ★ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ අන්තර් ආගමික සමුළුව, ★ ගාලුමුවදොර පිටිය, ★ මඩු සිද්ධස්ථානය, ★ මහබෝධි විහාරය, ★ අගරදගුරු මැදුර, ★ බෝලවලාන ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානය, ★ සමුගැනීම කටුනායක ගුවන් තොටුපල මෙම ස්ථානයන්හි සජීවී රූගත කිරීම්, රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, වර්බුම් ටී. වී. ආයතන මඟින් ආවරණය කළ අතර ගාලුමුවදොර හෝටලයේ පිහිටුවා තිබූ මාධ්‍ය කාර්යංශය මඟින් සියලුම රූපවාහිනී නාලිකාවන්ට අවශ්‍ය රූප රාමු ලබා ගැනීමේ පහසුකම් සලසා තිබුණි. ගාලුමුවදොර ඩිජිටල් තිර සැලසුම් කිරීම, ශබ්ද විකාශන මෙහෙයුම ද, රූපවාහිනී මාධ්‍ය අංශය මඟින් සංවිධානය කරනු ලැබීය. සමස්තයක් ලෙස සුදුතුම් පිය ශ්‍රී ලංකා සංචාරයේ මාධ්‍ය මෙහෙයුමේ දී විවිධ මාධ්‍ය ජාලයන්හි ගුවන් කාලය ඉතා සාධාරණ මිලකට සැපයීමෙන් දායක වීම අගයන අතර විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ලද සහයත්, විශේෂයෙන් කතෝලික නොවන මාධ්‍ය ක්ෂේත්‍රයන්හි නියැලෙන පිරිස් වෙතින් ලද සහය අති පැසසුම් කටයුතුය.

මෙම මෙහෙයුමේ දී දිවා රෑ නොබලා වෙහෙස මහන්සිය නොතකා උරෙ'නුර ගැටෙමින් තම කාලය, ශ්‍රමය වැය කළ රූපවාහිනී මාධ්‍ය කමිටුවේ සහෘදයින්ට මාගේ තුතිය.



## ප්‍රේමයේ පවතින්න



## සුදුතුම් පියාණනි!

ලොව ඇති කුඩා රජයේ අධිපති වන්න
බොහො පින් කළ යුතුය ඒ අසුනට යන්න
කිතුනු දහම ලොව තුළ ප්‍රචලිත වන්න
සුදුතුම් පියාණන් එහි මුලසුන ගන්න

නිල් අහසට පෑයු රන් තරුව ඔබයි
මහ සයුරේ නොසැලෙන ගල් පරුව ඔබයි
වැලි කතරට දිය දහරක් වෙන්නෙ ඔබයි
දෙවිඳු අපට දුන් තිළිණය ඔබම තමයි

අපේ කඳුළු දෙවිඳුන් වෙත දෙන්න පියේ
අපේ සතුට දෙවිඳුන් වෙත දෙන්න පියේ
ලෝකෙ පුරා සාමය රජ වෙන්න පියේ
ඔබේ යැදුම් දෙවිඳුන් අසනවා පියේ

වාස් පියා ලංකාවට ආවෙ එදා
කිතුනු දහම රැක දෙන්නයි අපට සදා
කළගුණ සලකන්නෙ අපි සැම එක්ව මෙදා
සුදු වරයට ඔසවන්නේ ඔබයි මෙදා

විසිරුනු බැටළු රැළ එක් කරන පියේ
ලොවේ සැමට කුළුනු දයා පාන පියේ
සරල චාම් දිවි පෙවෙතක් ගෙවන පියේ
ඉන්දි සයුරෙ මුතු ඇටයම ඔබට පියේ

**ටී. එම්. පී. සන්ධ්‍යා කුමාරි**
නාගම වෙල්පල්ල

## සුදුතුම් පිය සමිඳේ

දෘෂ්‍යමාන නායකයාණෙනි,
කිතු සමිඳුන් දුටුවා සේ
දෙනෙත් අපේ පින් කෙරුවා
සතුට සොම්නස හද උතුරා ගියා

මේ පර්වතය පිට
මාගේ සභාව ගොඩනගමි
ලෝකය පුරා අස්සක් මුල්ලක් නෑර
ගම් දනව් පුරා
ලොකු කුඩා ඒකායන පැතුම
ජේසු ක්‍රිස්තු ස්වාමිදරුවාණෝ

උත්ථානය ද, ජීවනය ද, සත්‍යය ද
විමුක්තියේ අරුණළු මැද
සැබෑ නිදහස ලොවට හඬ ගා දෙසූ
ගැලවුම්කරුගේ ප්‍රතිමූර්තිය
ඔබයි සුදුතුම් පිය සමිඳේ...
ලක් දෙරණේ පාලන පාලක සැම අභිලාෂය
ඔබයි පිය සමිඳේ... පිහිට වනු මැනේ!

**නෙවිල් ප්‍රනාන්දු** - හලාවත

## සුදුපිය පහසයි මුනිවර සිරියයි

සුදුපිය පහසයි - මුනිවර අසිරියයි
කිතු සමිඳු හද පුරා ඉතිරුණ
දයා බැහැපත් කමේ හැම ගුණ
දරා හද ගැබ පතළ කරවන
ඔබයි 'දෙව් පෙම' සසුනිසුරාණන

සසුන් අඹරේ දිලෙන පුන් සඳ
ලොවට සාමේ සිහිල මතු කොට
දයා මෙත් ගුණ මුසුවු මුදු හද
'මෙත් වැඩිය' මෙරටට වඩින්නට

සුනිල කරදිය වළල්ලෙන් වට
සොඳුරු දිවයින අපේ මව් බිම
දෙව් පෙමේ අසිරින් පුරන්නට
'සුදුවරයෙ' අදරින් අසම සම
මහමෙරෙක වෙර - හද දිරිය ගෙන
සමිඳු සදහම් මඟ එකලු කළ
ලක් දෙරණෙ දන - සැරසු බැතියෙන
වාස් පියතුම 'හෙළයෙ' මුනි කළ

නොසැලි ඉටු කළ දේව සැලසුම
උත්තම වු ආදර්ශයෙන් දිරිගෙන
සුදු පියාණගෙ යැදුම් පිළිගෙන
දෙනු මැනේ! දෙව් පෙමේ සැනසුම

**නීටා අයි. ප්‍රනාන්දු**
කඳාන

## ෆ්‍රැන්සිස් සසුනිසුරන් අපේ

ජීවනදායක දිව්‍ය සුෂිර ඔබ
ශුද්ධාත්මයාණෙනි
මලින දවාලන දිව්‍ය අග්නි ඔබ
ශුද්ධාත්මයාණෙනි
ගිනි දිව් සේ ද එමිනේ
පිණි වැස්සක් ද ලෙසිනේ
නිති බලවන්ත කර දෙන්න
සැම නපුරෙන් රැකගන්න
ෆ්‍රැන්සිස් සසුනිසුරන් අපේ//

පුන ගැයුම
බැටළු සුවඳ හමනා
බැටළු එඬේරු සොයා යමින්
සරල ලෙසින වෙසෙමින්
විශද වෙසකින් දම් දෙසමින්
සභා දිවිය නිසි මං යවනට
අභීත වන තීරණ ගන්නට
නිති බලවනත් කර දෙන්න
සැම නපුරෙන් රැකගන්න
ෆ්‍රැන්සිස් සසුනිසුරන් අපේ//

මන්ත්‍රණදායක දිව්‍ය නුවණ ඔබ
ශුද්ධාත්මයාණෙනි
සැනසිලිදායක දිව්‍ය වදන ඔබ
ශුද්ධාත්මයාණෙනි
පරම සත්‍යයේ ප්‍රත්‍යක්ෂයයි ඔබ
ශුද්ධාත්මයාණෙනි
ගිනි දිව් සේ ද එමිනේ
පිණි වැස්සක් ද ලෙසිනේ
නිති බලවන්ත කර දෙන්න සැම
නපුරෙන් රැකගන්න
ෆ්‍රැන්සිස් සසුනිසුරන් අපේ

ක්‍රිස්තු වර්ෂ 2015 පෙබරවාරි 15 ඉරිදා
ඥානාර්ථ ප්‍රදීපය



# ජූලි හතක් ගෙ

## ප්‍රේමයේ පවතින්න

දිනය හරියටම 2014 වසරේ ජූලි හත්වෙනිදායි. ඊට දින කිපයකට පෙර ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමාගෙන් මට ඊ-මේල් පණිවිඩයක් ලැබී තිබුණි. ඒ ජූලි හත්වෙනිදා උදේ දහයට කොළඹ කිංසි පාරේ කතෝලික මාධ්‍ය කේන්ද්‍රයේදි පැවැත්වෙන ඉතා වැදගත් රැස්වීමට සහභාගි වෙන ලෙසටයි. ඒ වෙද්දි මගේ නවතම ටෙලි නාට්‍ය වු පියස හි පුර්ව නිෂ්පාදන කටයුතු ආරම්භකර තිබු හෙයින් හා ආසන්න දින කිපයකින් රූපගත කිරිම ආරම්භ කිරිමට මා නුවරඑලියට යාමට නියමිතව තිබුණි. අපගේ නිෂ්පාදන කංඩායමක් ඒ වෙද්දි සිටියේ නුවරඑලියේ පුර්ව නිෂ්පාදන කටයුතු සිදු කරමිනි. මට කාලය වෙන්කිරිම ඉතාමත් උගහට විය. මන්ද මේ වෙද්දි මගේ සහය අධ්‍යක්ෂක වරයාගේ සැලසුම්වලට මට අනුගත වීමට සිදුවී තිබුන හෙයිණි.

එහෙත් බොහෝ අපහසුවෙන් කාලය වෙන්කරවා ගෙන උදේ දහයට පෙර කී තැනට පැමිණියෙමි. සුදු ලෝගුව හා රතු පටිය පැළඳ ගාල්ල රදගුරු අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් එහි විය. සුදු ලොගු දා කළු පටි පැළදි ලෝගුකාර පියවරු සමුහයක් ද විය. ශ්‍රී ලංකාවේ මාධ්‍ය හසුරුවන බොහෝ ඇසුපිරු දැනුම ඇති ගිහි නායකයෝ සමුහයක්ද එතැන සිටියහ.ඉන් කිප දෙනෙක් මගේ පැරණි මිතුරන් විය. නාදුනන අය බොහෝ විය.

දෙවිඳුන් යැදිමෙන් පසු එකිනෙකා තමතමන්ව හදුවා ගත්හ. අරාධනා කල කාරණය සැකෙවින් ගරු සිරිල් ගාමිණී පියතුමා සභාවට දන්වන ලදි. 2015 ජනවාරියේ ශ්‍රී ලංකාවට පැමිණෙන සුදුතුම් පියාගේ ලංකා ගමන ගැන මාධ්‍ය අංශය පිළිබඳ සාකච්ඡා කිරිමට හා පාප්තුමාගේ ශ්‍රී ලංකා සංචාරයේ ප්‍රධාන අංගයක් වු මාධ්‍ය අංශයට අප සැවොම සහාභාගී කරගන්නට කැමති බවත් ඒ පිළිබඳ අපගෙන් කැමැත්ත විමසීය. බොහෝ දෙනෙක් සිටියේ ඉබ්බා දියට දැම්මාට පසු ඇන්නැවේ කියන්නා වැනි සිතුවිල්ලකය. මෙවැනි අසිරිමත් ශුද්ධවු දෙයකට සහභාගි නොවන්නේ කව්රුද ?

ගාල්ල රදගුරු අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් මාධ්‍ය කමිටු සභාපති ලෙස රදගුරු මංඩලයෙන් පත්කර තිබු අතර එහි ලේකම් ධුරය හා මාධ්‍ය අධ්‍යක්ෂක ධුරය දැරුවේ ගරු සිරිල් ගාමිනි ප්‍රනාන්දු පියතුමායි. අප සියළු දෙනා කමිටු සාමාජිකයින් විය.

ප්‍රධාන කමිටුව අනු කමිටු කිපයකට වෙන්කරන ලදි. රූපවාහිනි, ගුවන් විදුලි, පුවත්පත් සමාජ වෙබ් අඩඩි ඊට අයත් මාධ්‍යය හා තවත් බොහෝ අනුකමිටු එහි විය. අප අයිති වුයේ රූපවාහිනි කමිටුවටයි. එහි නායකත්වය දැරුවේ ගරු ලාල් පුෂ්පදේව පියතුමන්ය. මම උන්වහන්සේ දුටුවේද එදාය. එතුමා වර්තමානයේ භක්ති ප්‍රබොධනය මාසික සඟරාවේ ප්‍රධාන සංස්කාරක තුමායි. ප්‍රවීණ නිර්මාන කරුවෙකු වු බර්ට්‍රම් නිහාල් සිරස මාධ්‍ය ජාලයේ මහජන සම්බන්ධතා අධ්‍යක්ෂ ප්‍රීයන්ත විජේසිංහ ජාතික රූපවාහිණියේ නියොජ්‍ය අධ්‍යක්ෂක(ඉංජිනේරු) පැට්‍රික් රොඩ්රිගෝ හා රූපවාහිනියේම වැඩසටහන් නිෂ්පාදක රංජුල සේනාධිර ස්වාධීන රූපවාහිණියේ වැඩසටහන් නිෂ්පාදක අජිත් ජයවර්ධන වර්බුම් රූපවාහිනියේ සභාපති මිලන් ද සිල්වා යන මහත්වරුන් අප කමිටුවේ සාමාජිකයින් විය. පසුව ඉනොවැටික්ස් රූපවාහිනි නිශ්පාදන ආයතනයේ නිර්මාතෘ ඔගස්ටින් මනතුංග මහතාත් කමිටුවේ සාමාජිකයෙක් වුයේ අපගේ ආරාධනයෙණි. මේ සියළු දෙනා පැමිණ සිටියේ තම ආයතන නියෝජනය කරමින් නොව ණය මංගල්‍ය දිනක තම ණය යුතුකම ඉටුකිරීමට දිව්‍ය පුජාවට පැමිණිය යුතු බැතිමතුන් සමුහයක් විලාසයෙණි. එසේම පාප් තුමන්ගේ ශ්‍රී ලංකා ගමන අපට ගෙන ආවේ අපේ කිතුපියා අප බලන්න එනවා වැනි හැගිමකි. ඒ හැගිම අපුරුය. වචනයකින් විස්තර කල නොහැකිය.

සුදුතුම් පියාගේ ශ්‍රී ලංකා සංචාරයට මාස හයකටත් පෙර ආරම්භවු මාධ්‍ය ව්‍යාපෘතියේ රූපවාහිනි කමිටුවට ඉතා වැදගත් කාර්යයක් පැවරි ඇති බව අප දැන සිටියෙමු. වර්තමාන ශ්‍රී ලංකාවේ වැඩිම ජන ආකර්ශනයක් දිනාගත් මාධ්‍ය රූපවාහිනිය බව අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙයින් පාප්තුමා පැමිණිමට පෙර සිටම යම් පූර්ව වැඩ සටහන් සමුහයක් නිර්මාණය කිරිමේ අභියෝගය අපට විය. යෝජනා බොහෝ විය. ඒ සඳහා මිලියන ගනන් මුදල් අවැසි බව අප මුලසිටම දැන සිටියෙමු. වැය ශීර්ෂ සැලසුම කලෙමු. ඒවායේ එකතුව දුටු විට ගරු ලාල් පුෂ්පදේව පියතුමාට තරු විසිවිය. එහෙත් අපි ඒවා ඉදිරිපත් කලෙමු.ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා ඒ මිල ගණන් සත පහකට මායිම් කලේ නැත.

නිහඬ කාලයක් ගෙවිගියේ සැලසුම් ක්‍රියාත්මක කිරිමට ඇවැසි පරිබාහිර කටයුතු සම්පුර්ණ වන තුරුය. එහෙත් අප සියළු දෙනා වැඩ කලෙමු. ඒ නිහඬ බව බින්දේ 2014 සැප්තැම්බර් මස දොලොස්වන දායි. ශුද්ධෝතම ප්‍රැන්සිස් පාප් තුමන් ශ්‍රී ලංකාවට පැමිණෙන බව නිල වශයෙන් දැනුම් දුන්නේ එදායි. දෙස් විදෙස් මාධ්‍ය වේදින් පන්සියකට ආසන්න පිරිසක් ගේ සහභාගිත්වයෙන් කොළඹ අගරදගුරු නිවසේ පිහිටි අති නවීන සම්මන්ත්‍රන ශාලවේදි පැවති පළමු මාද්‍යා හමුවේදි අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් එය මාධ්‍යට නිරාවරණය කලේය. එය අතී සාර්ථක මාධ්‍ය හමුවකි. එහිදි ප්‍රීයන්ත විජේසිංහ සොහොයුරා ගෞරවයෙන් සිහිපත් කල යුතුය.

කාලය ගෙවි යද්දි ජානාධිපති මැතිවරණ කසුකුසුව රටපුරා පැතිරයන්නට විය. දින වකවානු පිලිබඳව නිවැරදි තොරතුරක් නොලැබුනද ජනාධිපති මැතිවරණය පාප් ගමන ආසන්නයේ ම පැවැත්වෙන බවට කටකථා පැතිර යන්නට විය.එහෙත් අප කිසිවෙක් එයින් සැලුනේ නැත. අප ඉදිරියට යමින් සිටියෙමු. විවිධ යොජනා ක්‍රීයාත්මක කිරීමට සැලසුම් කරමින් සිටියෙමු. ඒ අතරින් ශ්‍රී ලංකාවේ සියළුම රදගුරු පදවි පිළිබඳ වාර්තා වැඩ සටහනක් කිරිම අපගේ එක් අරමුණක් විය. ඒ සඳහා වියදම්වන විශාල මුදල අපි සොයමින් සිටියෙමු. ඒ අතර ගරු සිරිල් ගාමිණී පියතුමා වතිකානයේ සංචාරයකට ගියේ පාප් තුමාගේ මාධ්‍ය කමිටුවේ ප්‍රබලයින් සමග සාකච්ඡා කිරිමටයි.

ඒ කාලය වෙද්දි භාග්‍යවත් ජුසේ වාස් මුනිදුන් ශුද්ධවරයට එසවීම පිලිබඳවද යම් තොරතුරු අප වෙත ලැබෙමින් තිබුණි. අප සිටියේ බලාපොරොත්තු සහගතවයි. එම තීන්දුව ගන්නා යුගයේ ගරු සිරිල් ගාමිණී. පියතුමා සිටියේ රෝමයේ වතිකානයේයි. දිනය එලඹුණි. ගරු සිරිල් ගාමිණී පියතුමා රෝමයේ වතිකානයයේ සිට අප සැමට ඊමේල් පනිවිඩයක් එවා තිබුණි. ඉන් අපි මහත් අමන්දානන්දයට පත්විමු. ඒ පාප් තුමාගේ ශ්‍රී ලංකා සංචාරයේදි අපට ශුද්ධවරයෙක් ලැබෙන බවයි. ඒ අමන්දානන්දය තවත් වගකීමක් අපට එකතු කලේය. ඒ ශුද්ධවු ජුසේවාස් මුනිදුන් වෙනුවෙන් රූපවාහිනි වාර්තා වැඩසටහනක් නිර්මාණය කිරිමයි. එක් වැඩසටහන් මාලාවකටවත් තවමත් මුදල් සොයාගත නොහැකි අප තවත් විශාල වාර්තා වැඩසටහනකට මුදල් හොයන්නේ කෙලෙසකද ? එහෙත් අපි නොනැවති ඉදිරියට ගියෙමු.

ඒ අතර මට ගරු සිරිල් ගාමිණී පියතුමා තවත් රාජකාරියක් බාර කරලිය. ඒ පාප් තුමා ශ්‍රී ලංකා සංචාරයේදි එතුමන් සංචාරය කරන සියළුම ස්ථාන රූගත කර වතිකානයට යැවීමට අවශ්‍ය බවත් එය වහා ක්‍රියාත්මක කරන ලෙසත්ය. මම දින කිපයකින් එය ආරම්භ කලෙමි. මම කෙලින්ම ගියේ මඩු පල්ලියටයි.ඒ වෙද්දිත් අප මඩුපල්ලියේ සියළුම ඓතිහාසික තොරතුරු සොයාගෙන තිබිණි. ඒ සඳහා අජිත් මෙන්ඩිස් (ප්‍රකට රංගන ශිල්පි ශ්‍රියන්ත මෙන්ඩිස්ගේ සොහොයුරා) ප්‍රමුඛ පස්දෙනෙක්ට ආසන්න පිරිසක් මට මහත් දායකත්වයක් ලබාදි තිබුණි.

මම දඹුලු ගොස් තලගොයිද මරා ගතිමි. ඒ ගමන්ම මඩු පල්ලිය ගැන වාර්තා වැඩ සටහනක් නිර්මාණය කළෙමි. මඩුපල්ලියේ පාලක ගරු පියතුමා අපට මහත් සේ සහය දැක්විය. එහි කෙටි වැඩසටහනක් සංස්කරණය කර විකාශය කළ අතර හැකි ඉක්මනින් එහි සම්පුර්ණ වැඩ සටහනක් ජනයා අතට පත් කිරිමට මම නොඉවසිල්ලෙන් බලා සිටිමි. දෙවියන් මට ඊට කාලය ලබාදෙනු ඇතැයි මම තරයේ විශ්වාස කරමි. එතැනින් නොනැවතු අපි උඩුගම්පල සාන්ත පිතරයේ දරුවන්ට අකුරු කරමින් සිටි අසේල දසනායකගේ ටෙලිෆෝනයේ පිහිටෙන් පරප්පංකංඩල් දේවාස්ථානය සොයා ගියෙමි. එය ශ්‍රී ලංකා කතෝලික වංශ කථාවේ මර්මස්ථානයකි. එහි නිවැරදි තොරතුරු අපට ලබාදෙමින් අති උතුම් රායප්පු ජෝශප් මන්නාරම රදගුරු තුමා දැක්වු සහාය අගේ කළ යුතුය.ඒ තොරතුරු ශ්‍රී ලංකා කතෝලික ඉතිහාසය අතික්‍රමනය කිරිමක් යැයි විටෙක සිතෙයි.

එදා හැන්දාවේ ඉර බහින්නට ඔන්න මෙන්න කියා තිබියදි නැවත ගොඩනගමින් ඇති මන්නාරම දුම්රිය පොල මායිමේ ඇති සවුත් බාර නම් ස්ථානයට ගියෙමි. රතු පාට බෝලයක් මෙන් ඉර අවරට යමින් තිබුණි. වඩ්දිය නිසා සවුත්බාර ප්‍රදේශයම කරදියෙන් යටවි තිබුණි. ඒ කරදියෙන් යටවු පොළව මතින් ඉහලට මතුවි ඇති උස් කුරුසිය බැස යන ඉර එලියෙන් රතුපාටට දිලිසෙමින් තිබුණි. මේ ජුසේවාස් පියතුමා ශ්‍රී ලංකාවට ගොඩබට ස්ථානයයි. මේ වඩ්දිය වසාගෙන ඇති කරදිය කඳමත ශුද්ධවු ජුසේවාස් පියතුමාගේ ප්‍රධාන දෙව් මැදුර තැනුවානම් කොපමණ හොඳ දැයි මම එවේලේ සිතමින් ඉර මුහුද ගිලගන්නා තුරුම රූපගත කිරිම් දිගටම කරගෙන යන ලෙස කැමරා ශිල්පියාට අණ කලෙමි.

පාප්තුමා ශ්‍රී ලංකාවට පැමිණෙන සියළු තැන් සොයා ගොස් වතිකානයට යැවිය යුතු සියළු රූපගත කිරීම් අවසන් කලේ කටුනායක බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙණි. ගුවන් තොටුපළ පරිපාලනය අපට මහත් පිටිවහලක් ලබා දුනි. මාස තුනකටත් පෙර සිටම ඔවුන් සියල්ල සුදානම් කර තිබිණි. කොටින්ම පාප් තුමන් පැමිණෙන ගුවන් යානය නවත්වන ස්ථානය පවා ඔවුන් නිවැරදිව සලකුණු කර සියල්ල සිතියම් ගත කර තිබිණි. ඒවා දැකිමෙන් අපි මහත් ආශ්වාදයට පත්විමු.

මේ සියල්ල කලත් තවමත් අපගේ අරමුණු සහිත කිසිදු වැඩසටහනක් කරගැනිමට අපට නොහැකි වී තිබුණි. අපි දැවැන්ත මුදලක් සොයමින් සිටියෙමු. කාලය වේගයෙන් ඉගිලෙමින් නොවැම්බරයත් අඩක් ගෙවි තිබිනි. දිනක් ගරු සිරිල් ගාමිණී පියතුමා සහා ගරු ලාල් පුෂ්පදේව පියතුමා සමඟ මම අපට ආරාධනාකල මොබිටෙල් ආයතනයට ගියෙමු. විධායක නිළධාරි තුමා අපි පැමිණෙන තුරු බලා සිටි අතර අපේ අරමුණ අපි පැහැදිළි කලෙමු. සුදුතුම් පිය හරසර වැඩසටහන සඳහා මොබිටෙල් ආයතනය කොළ එලිය දැල්විය.එතැන් සිට පාප් තුමාගේ ශ්‍රී ලංකා සංචාරය අවසන්වන තුරු මොබිටෙල් ආයතනය දැල්වු කොළ එලිය දිගටම දැල්වි තිබුණි.

මේ කාලයේදි ජනාධිපති මැතිවරණයට දින නියමවෙමින් තිබිණි. කුමන වැඩ සටහනක් කලත් රූපවාහිනි ආයතනවල ගුවන් කාලය සොයා ගැනිම ජනවාරි නමවෙනිදා වනතුරු කළුනික සොයනවාටත් වඩා අමාරු බව අපි දැනගෙන සිටියෙමු. එතැනදි අපේ පිහිටට ආවේ ස්වාධීන රූපවාහිනියයි. ඔවුන් ඉතාමත් අඩු මුදලකට (සාමාන්‍යයෙන් රූපවාහිණී නාලිකාවක පැය



# නාවු ජුලි හත

## සසුන් පිය ලංකා ගමනේ අතීතාවලෝකනය 25



## ප්‍රේමයේ පවතින්න

බාගයක ගුවන් කාලය රුපියල් ලක්ෂ දෙකේ සිට පහ දක්වා අතර මිලක් වෙයි.) ඉරිදා උදෑසන 10.00 ගුවන් කාලය අපට වෙන්කරන ලදි. ඊට මහත්සේ වෙහෙස ගත්තේ ස්වාධීන රූපවාහිණී සේවයේ වැඩ සටහන් අධ්‍යක්ෂක විපුල රත්නසිරි මහතා බව නොකියා සිටියොත් එය අඩුපාඩුවකි.

සුදුතුම්පිය හරසර පළමු වැඩසටහන විකාශය කළ යුත්තේ දෙසැම්බර් හත් වෙනිදායි. ගුවන් කාලය අනුමත වෙන්නේ දෙසැම්බර් 3 වෙනිදායි. අපි දෙවියන්ට සියල්ල බාරකර කඩිගුලක් ඇවිස්සුනා සේ වැඩ කරන්නට පටන් ගත්තේය. මෙහිදි අමතක නොකළ යුතු පුද්ගලයින් අතරින් මට ගරු සිරිල් ගාමිණි ප්‍රනාන්දු පියතුමා නිරතුරු සිහියට එයි. එතුමා සිටියේ වැඩ ගොඩක පැටලීය. පාප්තුමාගේ පැමිණීම අවිනිශ්චිත යයි මාධ්‍ය පුන පුනා කියද්දි ඊට එරෙහිව දැඩිව අප අප සමඟ වැඩ කලේ එතුමාය. අප පවා ඒ මතවාදවලින් ඇද වැටෙද්දි අපද ඔසවාගෙන කඳු මතට අප රැගෙන ගියේ ද එතුමාය.

සුදුතුම් පිය හරසර වැඩසටහනට මහත් ප්‍රතිචාර ලැබිණි. ගුණ දොස් අප ධෛර්යමත් කලේය. නත්තල් දා උදේ 10.00 ටත් විශේෂ වැඩසටහනක් අවැසි යයි කිය. ඒ වැඩසටහන අවසන් කර බාර දෙද්දි දෙසැම්බර් 24 දා රාති 9.00 ට ආසන්න වී තිබිණි. වෙනදා 24 දා හැන්දෑවේම නත්තලට අම්මා ඇතුළු නෑයෝ බලන්න කඳවල ගමේ යන මම 24 දා රෑ 9.30 ටත් ගල්කිස්සේ සර්විස් පොලක රිය සෝදමින් සිටියෙමි. මොහොතකින් මගේ ටෙලිෆෝනය නාද විය. කථා කලේ ස්වාධීන රූපවාහිනියේ පුස්තකාල අධිපති තුමායි. හෙට උදේ දහයට යන සුදුතුම්පිය හරසර වැඩ සටහනේ ටේප් පටිය කඩතොළු වී ඇති හෙයින් වහා වෙනත් ඩී.වී.ඩී. කැම් කැසටයක් ගෙන දෙන ලෙස එතුමා දැනුම් දෙන ලදි. එලෝ මෙලෝ දෙලෝ රත්විය. මාත් සමඟ උරෙන් උර ගැටී වැඩකල ඔගස්ටින් මනතුංග මහතා නිවස බලා ගියේ මා සමඟය. ඔහු ඉන්නේ උඩුගම්පොලයි. ඔහුද කතෝලිකයෙකි. එහෙත් ඔහු ආපසු එන්නට ලැස්තිය. ඊට මගේ හිත ඉඩ නොදෙයි. මේ දිනවල නින්ද අප කිසිවෙකුටත් තිබුනේ නැත. රියතුළ වාහනය එලවමින්ම නින්ද ගිය වාර අපමණය.

නත්තල් රෑ පූජාවට නොගියොත් නත්තල් නැති ගානය. වෙලාව දහයට ආසන්නය. ටෙලිෆෝනයෙත් බැටරිය අවසන් කට්ටේය. ටෙලිෆෝනය නිහඬ උනොත් සියල්ල අවසානය. කරන්නට කිසිදෙයක් නොමැත. හිතද ගතද අගුල්වැටී ඇත. රිය සෝදා අවසානය. එහෙත් රෑ දහයටත් මම සර්විස් පොලේ අසුනක වාඩිවී සිටිමි. දැන් සර්විස් පොලද වසා දැමීමට ආසන්නය.

මේ සියල්ල ආරංචිවී සුදුතුම්පිය වැඩසටහනේ සහය අධ්‍යකෂක මහේෂ් උයන්ගොඩ මට කථා කලේය. ඔහුට ඒ වැඩේ ට පිලියමක් තිබිණි.
-අයියා ගෙදර යන්න.මම වැඩේ කරන්නං. වැඩ සටහනේ තව කොපි එකක් මම ෆාදර් ගාමිණිට ගිහින් දුන්නා. අයියමනේ කිව්වේ දෙන්න කියලා-

ඇඟට ලේ ඉනුවේ ඒ වෙලාවේය. මීට පෙර නොකල වැඩක් මම ඉබේම කර තිබිණි. එනම් ගරු සිරිල් ගාමිණි පියතුමාට නරඹන්නට නත්තල් වැඩසටහනේ එක් පිටපතක් යවා තිබීමයි.එයට හේතුවුයේ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන්ගේ නත්තල් පණිවිඩයද එහි අඩංගු වු නිසායි. වහා වහා මම ගාමිණී පියතුමාට කතා කලෙමි. පියතුමා රාත්‍රී නත්තල් පූජාවට යාමට සූදානම් වෙමින් සිටියේය. ඒ අවස්ථාවේ මහේෂ්ට එහි යාමට නොහැකි හෙයින් පසුවදා උදේ පාන්දර 5.00 ට පමණ මොරසුරණ මහා වැස්සේ මොටර් බයිසිකලයේ පැමිණ අනෙක් පිටපත ගෙන ගොස් තිබිණි. මම ගමේ ගෙදරට වී නෑයන්ට පම්පෝරිගසමින් සුදුතුම් හරසර නත්තල් වැඩසටහන නැරඹුවෙමි.

මෙවැනි කථා සාගරයක් මට ලිවිය හැකිය. එහෙත් ඒ ලිපිය දිග වැඩි උනොත් ඥානාර්ථ ප්‍රදීපය ප්‍රධාන කර්තෘ ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා ලිපිය කපා දමන බව තරයේම දනිමි. එතුමාගෙන් බේරුණත් අපේ හිතවත් ශිරාන් මෛත්‍රී නම්වු නියෝජ්‍ය කතු තුමාගෙන් බේරිලි බොරුය. ඔහු පුවත්පත තුළ මෛත්‍රී පාලනයක් ගෙනයන බව දන්නෝ දනිති. එහෙයින් මෛත්‍රීගේ කතුරට හසු නොවන්නට මේ ලිපිය ඉක්මනින් අවසන් කරමි. ඊට පෙර තව එක් සිදුවීමක් දෙකක් ලියමි.

නත්තලට ඔන්න මෙන්න කියා දිනක් මට ගරු ලාල් පුෂ්පදේව පියතුමා කථා කලේය. දැන් අපි ජුසේවාස් පියතුමා ගැන මොකුත් කරන්නේ නැද්ද ? පාප් වහන්සේ එන එක හේතුවක් ජුසේ වාස් පියතුමා ශුද්ධවරයට ඔසවන්න ? මට පොඩි පොලිස් පාට් එකක් දමා එතුමා ඇසිය. කරන්න පුළුවන් ? ඒත් සල්ලි ? මම කීමි. මම අහන්නේ මේ වැඩ අස්සේ එකත් කරන්න පුළුවන්ද කියලයි.පුළුවන් එකටයි බැරි එකටයි හැම එකටම හා කියන මම එයටද හා කීමි. කවදද කරන්න පුළුවන් ? නැවත එතුමා ඇසිය. ජනවාරියේ මුල් සතියේ කරමු. හැබැයි කැමරා කංඩායමක් ඉන්දියාවෙ ගොවේ යන්න වෙනවා. උන්වහන්සේ ඉපදුනේ ගෝවේනේ ? සල්ලි ගොඩක් යයි. මම කිවා. හරි හරි. සල්ලි තියනවා. දැං ඕනා ෆාදර් ගාමිණිගේ අනුමැතිය විතරයි. එතුමා හයියෙන් සිනහා වෙමින් කිවා. ගරු සිරිල් ගාමි පියතුමා අපිටත් වැඩිය මේ වැඩේට කැමති බව අපි දෙදෙනාම සක්සුදක් සේ දැනගෙන සිටියෙමු.

සුදුතුම් පිය හරසර වැඩසටහනට මොබිටෙල් අනුග්‍රහය අපට ලබාගන්නට මුලිකවම කටයුතු කලේ ගරු ලාල් පුෂ්පදේව පියතුමාය. එතුමා රූපවාහිනියේ කිතුනු වැඩසටහන් නිශ්පාදක රංජුල සේනාධීර සමඟ එකතුවී ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යශයට කථා කර ජුසේවාස් වාර්ථා වැඩසටහනට ඇවැසි මුදල් සොයාගෙන තිබිණි. මේවා දේව හාස්කම්ය. ආරම්භයේදී සතයක් අතේ නැතිව කල්පනා කරමින් ඒ මේ අත දිවු අපට උන්වහන්සේ සියල්ල ලබාදි ඇත.

එහෙත් අපේ සූදානම අන්තිමය. දෙසැම්බර් 27 වෙනිදා සුදුතුම් හරසර වැඩසටහන අවසන් කලේ 27 වෙනිදා පාන්දරය. ජනවාරි හතරවෙනිදා වැඩසටහන සඳහා ජනවාරි 31 දක්වාම රූපගතර කිරීම කළෙමි. ජනවාරි පළමුවෙනිදා ඉදිරි වැඩසටහන් රූපගත කිරිම සඳහා යාපනයට ගියෙමි.ඊට පෙර ගරු ලාල් පුෂ්පදේව පියතුමාට ඉන්දියාවට යාමට වීසා ලබාගැනිම සඳහා පාස්පෝට් බාර දුනිමි. එහෙත් ඒ වෙද්දි ඉන්දියාවට යාමට කිසිවක් සුදානම් නොමැත. අඩුම තරමින් ගුවන් යානයට අවසරපත් රැගෙන නොතිබුණි. එහෙත් මම යාපනයට ගියෙමි. පළවෙනිදා රාත්‍රීයේ යාපනයේදී ඉන්දියාවට යන ගුවන් යානා තුන්වෙනිදා රාත්‍රියේ දොලහමාරට තිබෙන බවත් ලාල් පියතුමා මට දැන්වීය. වීසා ලබාගැනිමට ඉතිරිව තිබුනේ තිබුනේ දෙවනිදා පමණයි. තුන් වෙනිදා නිවාඩු දිනයකි.මම සිටියේ අනුරාධපුරයේ රූපගත කරමිණි. එහෙත් එතරම් ආයාසයෙන් තොරව වීසා ලැබිණි. තුන්වෙනිදා රාත්‍රී දහයට ගුවන් තොටුපොලට පැමිණෙන ලෙස අප සියළු දෙනාට දන්වා තිබිණි. එහෙත් තුන්වෙනිදා රාත්‍රී හතට මා ඇතුළු කංඩායම සිටියේ හලාවතය. ඒ දින තුනක රූපගත කිරීම් වලට සහභාගි වී ආපසු එන ගමන්ය. අප ගුවන් තොටුපලට පැමිණීමට පෙර කොළඹ නිවෙස්වලට පැමිණිය යුතුය.

ගුවන් ගමනකට ඒ මොහොතේ අප කිසිවකු සුදානම් නැත. යාන්තම් රාත්‍රී නමයට ඔන්න මෙන්න කියා කටුනායක කොළඹ අධිවේගී මාර්ගයට පැමිණියෙමි. රාත්‍රී දහයට මම නිවසට පැමිණ මා සමඟ කංඩායමට සුදානම් වී වහා පැමිණෙන ලෙස දැන්වීය. දහය වෙද්දී ලාල් පියතුමා ඇතුළු අනෙක් කංඩායම ගුවන් තොටුපලේය.

කැමරා කංඩායම පැමිණෙන තුරු මම නිවසේ බලා සිටියෙමි. ඔවුන් රාත්‍රී 10.30 ටත් නොමැත. 12.15 ගුවන් යානය බැන්ගලෝර් බලා පිටත් වෙයි. එතැනින් තවත් ගුවන් යානයකින් ගෝවට යාමට අපේ සැලසුමයි.එහෙත් 10.45 ටත් මම ගල්කිස්සේය. රාත්‍රී 11.00 ට පමණ කැමරා කංඩායම පැමිණියේය. වහා වහා වාහනයට නැගගත් මම ගුවන් තොටුපල බලා පිටත් උනෙමි. ඊට පසු ලාල් පියතුමාගේ ආ කිසිදු ටෙලිෆොන් පණිවුඩයකට මම පිළිතුරු නොදුන්නෙමි. ඒ වෙද්දි පිරිස ගුවන්තොටුපල තුළය. 11.45 ට පමණ අප කංඩායම ගුවන් තොටුපලට පැමිණියෙමි. හිතේ තිබුනේ දෙගිඩියාව පමණකි. වාහනයේ දොර ඇර කලබලයෙන් මම ගුවන් තොටුපල තුළට ඇතුල් වීමට දිව ගියෙමි. කව්දෝ කථා කරනු මට ඇසිනි. ඒ ලාල් පියතුමායි.මගේ කංඩායම එනතුරු එතුමා බෑග් දෙකක් කර තබාගෙන ඒ දොරටුව අසල බලා සිට ඇත. ඒ මොහොතේ එතුමා මට කිසිවක්ම කිවේ නැත. ඉක්මනට යමු කීවා මතකය. අපි ගුවන් තොටුපල තුළට ගියෙමු. ටිකට් රැගෙන පෝලිමට එකතු වුයෙමු. මේ වෙද්දී ගුවන් මගින් බොහෝ දෙනෙක් ගුවන් යානයට අසුන්ගෙන හමාරය. එහෙත් විශාල පිරිසක් තම ටිකට් අත තබාගෙන පොලිමේ සිටිමින් තම නොසතුට ප්‍රකාශකරයි.

එලෙසම පෝලිම ඉදිරියට නොයයි. එකවරම පැමිනි ගුවන් සමාගමේ නිළධාරියෙක් ගුවන් යානයේ අසුන් අවසන් බවත් අනෙක් අයට හෙට යන්නට පුළුවන් යැයි කිය. මට පිටකොටුව බස් නැවතුම් පොල සිහිවිය. පනහකටත් වැඩි පිරිසක් ටිකට් තම අත තබාගෙන බලා සිටියි. බොහෝ දෙනා ට යකා අවේශ විය.එහෙත් මා පමණක් මහත් සතුටට පත්වීමි. දින කිපයක්ම නිදා නොගෙන සිටි මට හොඳට නිදාගත හැක. ගුවන් සමාගමේ නිළධාරිහු අපව අසල හෝටලයක නවත්වන්නට සුදානම් වෙයි. එහෙත් මගේ සතුට තිබුනේ මොහොතකි. මේ ගුවන් යානයේ නොගියොත් අපට පසුදා බැංගලොරයේ සිට ගෝවට යන ගුවන් යානය අල්ලා ගැනිමට නොහැකිය. මට දෙවියන් සිහිවිය. ඒ අතර ලාල් පියතුමා සමඟ අපේ ගමන් සඟයෙක් වූ ෂෙල්ටන් ප්‍රනාන්දු මහතා ක්‍රියාත්මක වී අපට ඒ ගුවන් යානයේම යාමට පහසුකම් සලසන ලදී. අපට කිසිවක් නොවැටහෙයි. බස් එකේ වගේ හිටගෙන යන්නට වෙනවාමයි කියමින් අපි ගුවන් යානයට ගොඩ උනෙමු. ඒ කිසිවක් නොවුණි. අපේ අසුන් අංක වලටම අප අසුන් ගැන්වීය. තවත් හිස් ආසන කිපයක්ද ඒ ගුවන්යානයේ තිබිනි. සිදුවු දේ දේ කුමක් දැයි අදටත් සිතාගත නොහැකිය. එහෙත් අපි ඉන්දියාවට ගියෙමු. ඒ ගමන අපූරුය. ලිපිය දිග වැඩි වෙන නිසා නොලියමි.

පසුගිය මාස තුනකට ආසන්න කාලයක් අප අසීමිතව අවිවේකීව වැඩ කල බව සැබෑය. ඒසේ වැඩ කලේ අප පමණක්ම නොවේ. ඒ පිරිස බෝහෝය. බොහෝ පියවරු නොකා නොබී නිදි වරමින් වැඩ කරනු මම සියැසින් දුටුවෙමි. එපමනක්ද නොවේ මම නින්දෙන් ඇවිදින පියවරු දුටුවෙමි. අප සියළු දෙනා සේම පාප් ගමනේ එක නිල පිංතූරයක ඔවුන් කිසිවෙක් නොමැත. ගිහි පිරිසද එසේමය. එහෙත් අද මේ සියළු දෙනාටම ජීවිතේ පුරාවටම තලුමරන්නට මහත් සතුටක් ඉතිරිවී ඇත.

ඒ තලුමරන සතුට අතර මමද සිටිමි. ඊට බොහෝ කරුනු කාරණා ඇත.පාප්තුමාගේ ශ්‍රී ලංකා සංචාරයේදී බොහෝ රූපවාහිනි නාලිකාවලට වැඩසටහන් නිර්මාණය කර දුන්නේ අපයි. විටෙක එය සමස්ථයම විය. ඊටත් වඩා මම මහත් සතුටක් ලැබුවෙමි.

ජනවාරි 14 දා මම නිවසට පැමිණියේ උදෑසන 6.00 ටයි. එක දිගට අපි සැවොම නිදි වර්ජිතව වැඩකරමින් සිටියෙමු. මම ආපසු 6.30 ට පමණ කොල්ලුපිටිය කාර්යාලයට පැමිණියේ මගේ රියෙනි. ගරු සඳසිරි පෙරේරා පියතුමා මට ලබාදුන් රථය හා රියදුරා මම නිවසට යැවුවේ මඳක් විවේක ගෙන එන්නටයි.

අනතුරුව මම ත්‍රීවිලයකින් පැමිණ ක්‍රෙස්කැට් එක අසලින් බැස්සෙමි. පොලිස් නිළධාරීන් අපගේ අවසරපත් දැක ත්‍රීවීලයෙන් යනලෙසට කාරුණික වුවද අපි පයින් ඉදිරියට ආවෙමු. මා අසල මගේ වැඩ කටයුතු වල්දි ඉන්ද්‍රඛීලයක් සේ සිටි ඔගස්ටින් මනතුංග මහතාත් විය.

වෙලාව උදෑසන 6.40 යි. මහා ජන ගඟක් ගාලු මුවදොර දෙසට ගලයි. දෙපස ඇති තරුපහේ හොටල් වලින් ඒ ජන ගඟට කෝපි දන්සැල් දෙයි. ප්‍රදේශය පුරා සවිකර ඇති ශබ්ද විකාශන යන්ත්‍රවලින් අප නිර්මානය කල රූපවාහිනි වැඩ සටහන්වල හඬ පටය සිසාරා ඇසෙයි. අපගේ සතුට ඉහවහා ගොස්ය. අපි ඉදිරියටම ගියෙමු. ගාලු මුවදොර හෝටලය ඉදිරිපිටින් පාප් තුමා පැමිණි පාර දිගේ අපි ඉදිරියට යද්දී අප නිර්මාණය කල වැඩ සටහන් තිරයේ දිස්වෙයි. කිතුනුවෙක්ට කිසිදිනක මෙතරම් සතුටක් ජීවිතයේ ලැබිය හැකිද ? මහා කිතුනු ජනතාවක් මැද මම ඉදිරියට යමින් සිටිමි. තෙරක් නොපෙනෙන හිස්ගෙඩි මට පෙනෙයි. මම වේදිකාව අසලටම ගියෙමි. ගරු ලාල් පුෂ්පදේව පියතුමා බලා සිටියේ අප එනතුරුය. මම මා අත ඇති ඩී.වී.ඩී. පටය එතුමාට බාර දුනිමි. ගරු ලාල් පුෂ්පදේව පියතුමා වෙලාවට ආවා නේද යැයි යාන්තමට සිනහාවී මගෙන් ඇසුවා මට හොඳටම මතකයි.

හරියටම උදෑසන 7.00ට සියලු ශබ්ද විකාශන යන්ත්‍ර නිහඬ විය. ලාල් පියතුමා මම රැගෙන ආ ඩී.වී.ඩී. පටය ඩී.වී.ඩී. යන්ත්‍රයෙන් ඇතුල්කලේය. එහි ආරම්භක සංගීතය මගේ කණට හුරුය. එය නිර්මානය කලේ ජෝ නෙත් ශබ්දාගාරයේ ශබ්ද පරිපාලක කසුන් මල්ලිය. මේ රූප යන්නේ අප ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේදී රූපගතකල දුඹුරු වර්න මිනිසා නම්වු ශුද්ධවූ ජුසේ වාස් මුනිදුන්ගේ වාර්ථා චිත්‍රපටියයි. එහි රූප දකින්නට ඩිජිටල් රූප තිරයක් මා අසල තිබුනේ නැත. එහෙත් මට එය දැනුනේ නැත.මම සිටියේ ඉහවහා යන සතුටකිනි. මගේ දෑස කඳුළු හලන්න පටන්ගත්තේ මටත් නොදැනුවත්වය. මම වහා වහා වටපිට බැලිමි. ලක්ෂ හතකටත් අධික ජනතාවක් එක්රැස්වී සිටියද ඒ කිසිවෙක් මගේ කඳුළු දුටුවේ නැත.එහෙත් එක් අයෙක් ඒ සතුටු කඳුළු දුටු බව මම සදහටම විශ්වාස කරමි. අදහමි.



**සුනිල් කොස්තා**